
# සන්නිවේදකයා

THE COMMUNICATOR

# සිව්වන ආණ්ඩුවට RTI රතු එළියක්




**විශේෂ කලාපය 2024 ජූලි**

03 - 04
ප්‍රජාතන්ත්‍රවාදයේ හුස්ම තොරතුරු දැනගැනීමේ අයිතියයි.

05 - 07
පනත ආවේ මෙහෙමයි

08 - 11
සිවිල් ආයුධය අපට දීලා තියෙද්දි ඒක භාවිත කරේ නැත්තම් ඒ ආයුධයෙන් වැඩකුත් නෑ
-නීතිඥ අසාඩ් මුස්තෆා-

12 - 14
තොරතුරු නිලධරයිනි රාජකාරි කරන හැටි දැනගන්න

15 - 16
Ek Cup Chya (තේ කෝප්පයක්)ඃ සිනමා ගවේෂණයක්

17 - 19
නොරට්ටු හොඳ කියති

19 - 21
අකටයුතු පිළිබඳ නාදකයන් අනතුරේ -IMF කියයි-

22 - 25
අපි බලය තිබුණත් ප්‍රවේශමෙන් තමයි එය භාවිත කරන්නේ
- ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ-

26 - 28
රාජ්‍ය ආයතනවල ප්‍රගාමී තොරතුරු මන්දගාමී

29 - 32
තරිඳු තොරතුරු පනතින් වැඩ ගත් හැටි

32 - 34
පනත ගමට වැඩ

35 - 37
RTI ජනමාධ්‍යකරණය සඳහා Tool එකක් නොවෙයි
- කෝසල ගුණවර්ධන-

37 - 38
ජනයා නොදන්න ජන පනතක්

39 - 40
තොරතුරු ගවේෂකයන්ට අත්පොතක්

41 - 42
තොරතුරු පනතේ ප්‍රධාන බාධාව භාෂාවයි. -ආතිෆ් -

43 - 44
පනතට පණ දෙමු



# සිව්වන ආණ්ඩුවට RTI රතු එළියක්

තොරතුරු සැඟවූ දේශයකට එම අයිතිය ලබාදී මේ ගෙවී යන්නේ අටවන වසරයි.

තොරතුරු මහජනයාට වැදගත් වුවත් එය ඉල්ලා සිටියේ මහජනයාගේ පාර්ශවයෙන් නොවේ. සිවිල් බුද්ධිමතුන්, සමාජ ක්‍රියාකාරීන් සහ ජනමාධ්‍ය එකතුවකින් කරන ලද දීර්ඝ මැදිහත්වීමකි.

එහෙත් එහි ක්‍රියාත්මකභාවය තුළ වැඩි වාසි හිමිවනුයේ පොදු මහජනතාවට ය. නමුත් පොදු ජනතාව එහි වාසිය තවමත් නිසි පරිදි ලබා නොගන්නා බැවින් ජනමාධ්‍ය ඒ කාර්යය ඉටු කිරීමට පෙරමුණ ගෙන සිටී.

වසර අටක් ගත වුණත් තවම අප තොරතුරු බෙදා හදා ගැනීමේ ක්‍රියාවලියට නිසි ලෙස හුරු වී නොමැත. කල්තබා තොරතුරු දැනුම් දීමට පොදු අධිකාරිය තවමත් සමත් වී නොමැති බව පෙනේ. බොහෝ රාජ්‍ය ආයතනවල වෙබ් අඩවි හි ඇතුළත්ව ඇත්තේ අවම තොරතුරු ප්‍රමාණයකි. තම ආයතනයට අදාළ වාර්ෂික වාර්තාව පිළියෙල කර ඉක්මනින් ම එය සමාජගත කිරීමටවත් අදාළ ආයතන උනන්දුවක් දක්වන බව නොපෙනේ.

තත්ත්වය මෙසේ තිබියදී තොරතුරු කොමිසම ඉදිරිගාමී වැඩ කටයුතු ප්‍රමාණයක යෙදී සිටින බව පෙනේ. එය තොරතුරු අයිතියේ සුබවාදී ලක්ෂණයකි.

ඒ සඳහා කදිම උදාහරණයක් පසුගිය ජූනි විසිවන දින තොරතුරු කොමිසම මගින් සපයා දී තිබුණි. ඒ තොරතුරු කොමිසම හමුවට ඉදිරිපත් වූ අභියාචනයකට තීන්දුව ලෙසිනි.

තොරතුරු ඉල්ලා ඇත්තේ සාමාන්‍ය පුරවැසියෙකි. තොරතුරු ඉල්ලා ඇත්තේ පෞද්ගලික සමාගමක් වන ඒෂියා බ්‍රෝඩ්කාස්ටින් කෝපරේෂන් නමින් හඳුන්වන හිරු මාධ්‍ය ජාලය වෙතිනි.

එම තොරතුරු ලබා දිය නොහැකි බව අදාළ ආයතනය දැනුම් දී ඇත්තේ එය පොදු අධිකාරියක් නොවන බවත් සියයට සීයක් පුද්ගලික හිමිකරුවෙක් සතුව පවතින පෞද්ගලික ආයතනයක් බවත් දන්වයි. කොමිසමේ තීන්දුව වූයේ අදාළ ආයතනය පෞද්ගලික ආයතනයක් වුවත් එය ක්‍රියාත්මක වන්නේ රජය මගින් ලබාදී ඇති තරංග (Frequency) මත තොරතුරු විසුරුවා හරින ආයතනයක් බැවින් පොදු අධිකාරියක් යන අර්ථකථනයට ඇතුළත් කළ හැකි බවයි. ඒ තරංග මහජන දේපලක් බවට වන පූර්ව අධිකරණ තීන්දු අනුව යමිනි. මහජන කාර්යයක් සිදුකරන ආයතනයක් බැවින් අදාළ තොරතුරු ලබාදීමට ඉඩකඩ පවතින බව කොමිසම දැනුම් දී තිබුණි.

ආයතනය පොදු අධිකාරියක් බවට තහවුරු කරනු ලැබුවද ඉල්ලා ඇති තොරතුරු සියල්ල ලබාදීම සම්බන්ධයෙන් කොමිසම එකඟත්වයක් පළ නොකිරීම මෙහි ඇති විශේෂත්වයයි. ප්‍රවෘත්තියක මූලාශ්‍රය කුමක්ද යන්න ඉල්ලා ඇති කොටස් හැර එම අවස්ථාවේ ආයතනයේ සේවයේ නියුතු කාර්යභාර නිලධාරීන්ගේ නම් පමණක් තොරතුරු අයිතිය යටතේ ලබාදීමට කොමිසම සිය තීන්දුව මගින් ප්‍රකාශයට පත්කර තිබුණි. මෙය එක් අතකින් පොදු දේපළක් වන තරංග භාවිත කරන ආයතන පොදු අධිකාරියක් යටතට ගැනෙන බවට වන ඓතිහාසික තීන්දුවක් වන්නා සේම ජනමාධ්‍යයන්හි තොරතුරු මූලාශ්‍ර ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කොමිසම ලබා දුන් වැදගත් තීන්දුවක් ලෙසද සැලකිය හැකි ය. ඒ අර්ථයෙන් මෙය මහජනයාගේ පමණක් නොව ජනමාධ්‍යයේ ද ජයග්‍රහණයක් ලෙස වටහා ගත යුතු යැයි හැඟේ.

**-සංස්කාරකවරු-**


**ප්‍රධාන සංස්කාරක**
**විජයානන්ද රූපසිංහ**

**සහය සංස්කාරක**
**දිමුතු පීනසේන**
**සතුශ්ක ජයවර්ධන**

**කවර නිර්මාණය**
**දිමුතු පීනසේන**

**සංස්කාරක**
**සකීෆ් සාම්**
**නිසංසලා අබේගුණසේකර**

**සෝදුපත් කියවීම**
**නිසංසලා අබේගුණසේකර**

**පිටු සැකසුම**
**සකීෆ් සාම්**

**අක්ෂර සංයෝජනය**
**හංසිකා ලියනගේ | රුවනි මධුෂිකා**
**එරංගි රාජපක්ෂ | දිල්හාරා බණ්ඩාර**



**ලිපිනය - 'සන්නිවේදකයා' ජනසන්නිවේදන අධ්‍යයන අංශය - කැලණිය විශ්වවිද්‍යාලය**
**දුරකථන - 0112917713**
**විද්‍යුත් ලිපිනය - communicator@kln.ac.lk**
**වෙබ් අඩවිය - https://ss.kln.ac.lk/depts/maco/**

# ප්‍රජාතන්ත්‍රවාදයේ හුස්ම

## තොරතුරු දැනගැනීමේ අයිතියයි




**සන්නිවේදන ක්‍රියාවලියේ ජීවය රඳා පවත්නා වූ ප්‍රධාන සාධකයක් වන්නේ තොරතුරු ය. එය පාදක කර ගෙන සන්නිවේදන ක්‍රමයේ සන්දර්භය නිර්මාණය වී ඇත. මානවයා ලොව පහළ වූ දිනයේ සිට තොරතුරු හුවමාරු කර ගැනීමට ප්‍රාථමික සන්නිවේදන ක්‍රම උපයෝගී කර ගනු ලැබී ය. නූතන මාධ්‍යයේ බිහිවීමත් සමඟ තොරතුරු වාණිජ මෙවලමක් බවට පත් වි ඇත. මෙලෙස ආරම්භ වූ තොරතුරු සන්නිවේදන ක්‍රියාදාමය අද වන විට විවිධාකාර ලෙස වෙනස් වීමට හා පුළුල්භාවයට පත්ව ඇත. පසු කාලීනව ලෝකයේ කතා බහට ලක් වූ සංකල්පයන් පිළිබඳව විමසා බලන විට මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් පෙන්වා දිය හැකිය. එම අයිතිවාසිකම පුද්ගලයාට තම ජීවන පැවැත්ම පවත්වාගෙන යාම උදෙසා අනිවාර්යයෙන්ම හිමිවිය යුතු බවට වූ මතවාදය ඉස්මතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ රටවල්වල පොදු එකඟතාවයෙන් මානව අයිතිවාසිකම් ඇති කරන ලදි. එහි නූතන විකාශය විමසා බලන විට යහපාලන සංකල්පය කෙරෙහි ලෝකයේ රටවල් අවධානය යොමු කර ඇත. මෙම යහපාලන සංකල්පයේ ඇතුළත් වු සංකල්පයක් ලෙස තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පෙන්වා දිය හැකි ය.**

ඉතිහාසය සහ ව්‍යාප්තිය

තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධයෙන් ඇති ඉතිහාසය පුරාණ ග්‍රීක හා අශෝක යුගය දක්වා ගමන් කරනු ලබයි. ඒ බව ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල්, ප්ලේටෝ වැනි දාර්ශනිකයන්ගේ මතවාදයන්වලින් හඳුනා ගත හැකි ය. නමුත් ඉන්දු නිම්න ශිෂ්ටාචාරය, මෙසපොතමියානු වැනි ශිෂ්ටාචාරයන්වලදී අසුරුබනිපාල් වැනි පුස්තකාලවල ලේඛන හා ලියකියවිලි යදමින් බැඳ පැවතීම නිසා සාමාන්‍ය ජනතාවට ඒ වෙත ප්‍රවේශ වීමට නොහැකි විය. නමුත් ඉන්දියාව වැනි රටවල අශෝක අධිරාජ්‍යයා විසින් ඉදිකරන ලද අශෝක ස්ථම්භ තුළින් රාජ්‍ය පාලනයේ ප්‍රතිපත්ති හා නීති රීති පොදු ජනතාවට ප්‍රකාශ කිරීමට ප්‍රසිද්ධ ස්ථානවල සෙල්ලිපි රැගත් කුළුණු ඉදිකර තිබීමෙන් හඳුනා ගත හැකි ය.

තොරතුරු දැනගැනීමේ අයිතිය පුරවැසියන්ට නිල වශයෙන් ම ප්‍රදානය කළ ලෝකයේ ප්‍රථම රට වශයෙන් ස්වීඩනය පෙන්වා දිය හැකිය. 18 වන සියවසේ මධ්‍ය භාගය වන විට ස්වීඩනයේ මහජන ප්‍රවේශය යන සංකල්පය වර්ධනය වීම මේ සඳහා බලපා තිබේ. 1766 දී ස්වීඩනයේ පුවත්පත් නිදහස පිළිබද පනත තුළින් ආණ්ඩුවේ ලේඛන කෙරෙහි ප්‍රවේශ වීමේ අයිතිය පොදු ජනතාවට ලබා දී ඇත. 1966 දී ඇමෙරිකා එක්සත් ජනපදය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්මත කර ඇත. ඊට පසුව 1978 දී ප්‍රංශය, 1980 දී නෙදර්ලන්තය, 1982 දී එංගලන්තය, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය, 1983 දී කැනඩාව, 1985 දී ඩෙන්මාර්කය ආදී බටහිර රටවල් ජනතාවට තොරතුරු දැන ගැනීමේ අයිතිය ලබා දී තිබේ. ආසියානු අප්‍රිකානු හා ලතින් ඇමෙරිකානු රටවල් බොහෝ කාලයකට පසුව තොරතුරු දැන ගැනීමේ පනත යොදා ගනු ලැබී ය. **දකුණු ආසියාවේ මුලින්ම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ලැබෙන්නේ 2001 දී පකිස්ථානයට ය. 2005 ඉන්දියාවත්, 2007 දී නේපාලයේත්, 2009 දී බංගලාදේශ, මාලදිවයින හා භූතානයේ ජනතාවටත් තොරතුරු දැනගැනීමේ අයිතිය හිමි වී ඇත. තොරතුරු දැනගැනීමේ පනත සම්මත කිරීමේ දී දකුණු ආසියාවේ ශ්‍රී ලංකාවේ ප්‍රමාද නොවුණේ ඇෆ්ගනිස්ථානයට පමණි.**

### තොරතුරු අයිතියකි

තොරතුරු දැන ගැනීම මූලික අයිතිවාසිකමක් වන බව 1946 දී පැවති එක්සත් ජාතීන්ගේ පළමු සභා වාරයේ දී ප්‍රකාශ කර ඇත. තොරතුරු දැන ගැනීමේ නිදහස මූලික මානව හිමිකමක් සේම එක්සත් ජාතීන් විසින් කැපවීමට බැඳී සිටින්නා වූ පූර්ණ නිදහස උරගා බලනු ලබන උරගල ද වේ.

**ලොව රටවල් ගණනාවක් මෙම තොරතුරු දැනගැනීමේ අයිතිය නීතිගත කර ගැනීමට කටයුතු සිදු කරගෙන ඇත. රාජ්‍යයේ හස්තය ලෙස ක්‍රියාත්මක වන ආණ්ඩුව සිදු කරන ක්‍රියාමාර්ග පිළිබඳව විනිවිදභාවයකින් කටයුතු කිරීමට මෙය වැදගත් වේ. එතුළින් ජනතාවට තොරතුරු දැන ගැනීමේ අවකාශය හිමිවනු ඇත. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය තොරතුරු ප්‍රජාතන්ත්‍රවාදයේ ඔක්සිජනය** “The Oxygen of the Democracy” **යනුවෙන් හඳුන්වනු ලබයි.**

### ප්‍රජාතන්ත්‍රවාදයේ සහ යහපාලනයේ මූලිකාංගයකි

ප්‍රජාතන්ත්‍රවාදය රඳා පවතිනුයේ තොරතුරු මත බව පෙන්වා දෙයි. දාහත් වන හා දහ අටවන සියවස්වල තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සංකල්පයක් ලෙස පිළිගෙන ඇත. එනම් රාජ්‍ය පාලන කාර්යයේ දී මූලිකවම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම අත්‍යවශ්‍යය බව පෙන්වා දී ඇත. ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීම අතර ඇති හිඩැස පිරවීම සඳහා තොරතුරු නිදහස ප්‍රධාන කරුණක් වන්නේ ය. තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව තුළින් රජය ලබා දුන් පොරොන්දු වගකීම් සහ අනෙකුත් ක්‍රියා කටයුතු සඳහා රාජ්‍ය යාන්ත්‍රණයට බල කිරීමට ඇති හැකියාව ශක්තිමත් වනු ඇත. ජනතාව කේන්ද්‍ර කරගත් සංවර්ධනයක් සහ ප්‍රජාතන්ත්‍රවාදයකට නියම අර්ථය ලබා දීමට නම් සෑම රජයක ම වගකීම වන්නේ ඵලදායී ලෙස තොරතුරුවලට ප්‍රවේශයක් ඇති කිරීම සුරක්ෂණය කිරීමයි.

**තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සංකල්පය පොදුවේ ජනතාවට හා සමාජයට වැදගත් වේ. එය රාජ්‍යයක ප්‍රජාතන්ත්‍රීය පාලන ව්‍යුහය විනිවිදභාවයෙන් හා වගවීමෙන් යුතුව පවත්වා ගැනීමට හේතු වේ. කුමන හෝ රජයක් මහජනතාවගෙන් ලබා ගන්නා බදු මුදල් හෝ එම ජනතාව වෙනුවෙන් ලබා ගන්නා තෑගි මුදලක් රාජ්‍ය පාලනයේ දී යොදා ගන්නා ආකාරය දැන ගැනීමට, ඒ රටේ සෑම පුරවැසියකුටම ඇති අයිතිය තොරතුරු දැන ගැනීමේ අයිතිය ලෙස හැඳින්වේ.** එසේම ජනතාවගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කරන සංකල්පයක් ලෙස තොරතුරු දැන ගැනීමේ අයිතිය හැඳින්විය හැකි ය.

එනයින් බලන කල තොරතුරු දැනගැනීමේ පනතේ ක්‍රියාකාරීත්වය ප්‍රජාතාන්ත්‍රවාදී රාජ්‍යයක් පවත්වාගෙන යාමට බෙහෙවින් ඉවහල් වේ. “තොරතුරු යනු ප්‍රජාතන්ත්‍රවාදය වේ. ප්‍රජාතන්ත්‍රවාදය යනු තොරතුරු වේ. විවෘතභාවය හා තොරතුරු දැනගැනීමේ අයිතිය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික කොන්දේසියක්” ලෙස 17 වන හා 18 වන සියවස්වල බුද්ධි ප්‍රබෝධ චින්තනය තුළ සිට ම පැවති අදහසකි.

ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදය අගයන රාජ්‍යයක වැදගත් ලක්ෂණයක් ලෙස තොරතුරු දැනගැනීමේ පනත පෙන්වා දිය හැකි ය. මෙම පනත නීතිගත කිරීම සම්බන්ධයෙන් විමසා බලන විට ලංකාවට සාපේක්ෂව ඉන්දියාවේ ජනතාවගේ ඉල්ලීම්වල ප්‍රතිඵලයක් ලෙස පනත නීතිගත කිරීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් තොරතුරු දැනගැනීමේ පනත සම්මත කිරීම මෙරට යහපාලන මූලධර්මය ස්ථාපිත වීමට හේතු වී ඇත.

### තොරතුරු අයිතියේ වපසරිය

තොරතුරු දැන ගැනීමේ අයිතියේ සංකල්පීය පදනම කරුණු නවයක් ඔස්සේ ඉදිරිපත් වේ. ඒවා නම්

- **උපරිම අනාවරණය**
- **ප්‍රසිද්ධ කිරීමට බැඳී සිටීම**
- **රජයේ විවෘතභාවය ප්‍රවර්ධනය කිරීම**
- **වගකීමෙන් නිදහස් කිරීම්වල පටු සීමාව**
- **තොරතුරු සඳහා ප්‍රවේශයට පහසුකම් සලස්වන්නට ක්‍රියා කිරීම**
- **පිරිවැය**
- **විවෘත රැස්වීම්**
- **අනාවරණය පූර්වාගමනයක් බවට පත් වීම**
- **අයුක්තියට එරෙහිව හඬ නගන්නන්ට (**Whistle Blowers**) ආරක්ෂාව ලබා දීම වේ.**

එම මූලිකාංග තුළින් වඩා ප්‍රශස්ත තොරතුරු පනතක් පිළිබඳ ආදර්ශ සපයා ගත හැකිය. එසේම වඩාත් පුළුල් අර්ථයෙන් ජනතාවට තොරතුරු දැනගැනීම පිළිබඳ සංකල්පයේ ප්‍රතිලාභ හිමිකර ගත හැකි ය. තොරතුරු දැනගැනීමේ අයිතිය මූලිකව ම ප්‍රජාතාන්ත්‍රීය පාලන ක්‍රමයක් උදෙසා වැදගත් වේ.

තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ සංකල්පවල පදනම රටින් රටට වෙනස් වුවද පොදු සාම්‍ය ලක්ෂණ විශාල ප්‍රමාණයක් දැකිය හැකි වේ. විනිවිදභාවය ප්‍රවර්ධනය, රාජ්‍යයේ වගවීම හා ඵලදායිතාව, දූෂණය පාලනය කිරීම, මහජන සහභාගීත්වය වර්ධනය කිරීම, මහජන ශක්තිය වර්ධනය, ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් සංස්කෘතිය ප්‍රවර්ධනය, රාජ්‍ය තොරතුරු කළමනාකරණය ප්‍රවර්ධනය, රාජ්‍යය කටයුතු පිළිබඳ ජනතා අවබෝධය හා පැමිණිලි කිරීම වර්ධනය ආදිය තොරතුරු සංකල්පය තුළින් ලබා ගත හැකි ප්‍රතිලාභ වේ.

**සටහන චමින්ද කුමාර**

# පනත ආවේ මෙහෙමයි

**තොරතුරු දැනගැනීමට ඇති අයිතිය වර්තමාන ලෝකයේ වඩාත්ම අවධානයට ලක්ව ඇත්තේ යහපාලනය හා ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන්ට යටත්ව ඇති රාජ්‍යයන්වලට ය. ලෝකයේ ප්‍රථම වතාවට තොරතුරු ලබා ගැනීමේ පනත 1766 දී ස්වීඩනයේ සම්මත විය. මෙය පුවත්පත් නිදහස පිළිබඳව පනතක් වේ. මෙම පනත මගින් ජනතාවට රාජ්‍ය ආයතනවලින් තොරතුරු ලබා ගැනීමේ අයිතිය තහවුරු කර තිබේ. 1946 එක්සත් ජාතීන්ගේ සමාරම්භක සැසිවාරයේ දී මහා මණ්ඩලය විසින් 59 (1) දරන යෝජනා සම්මුතිය අනුමත කරමින් තොරතුරු දැන ගැනීම මූලික අයිතිවාසිකමක් ලෙස සලකන ලදී.**

**ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ මතය විකාශනය.**

1994.10.10

ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය 1994 දක්වාම දිව යයි. මේ පිළිබඳව පළමුවරට ලිඛිත සටහනක් 1994 ඔක්තෝම්බර් 10 වන දින දී තොරතුරු සංචාරක හා ගුවන් සේවා අමාත්‍ය ධර්මසිරි සේනානායක මහතා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළේය.



1996.05.27

පසුව ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පත්කළ මාධ්‍ය නිදහස හා ප්‍රකාශනයේ නිදහසට බලපා ඇති ප්‍රතිසංස්කරණ සඳහා උපදෙස් ලබා දීමට පත් කරන ලද ආර්.කේ. ඩබ්. ගුණසේකර කමිටුව විසින් සිය නිර්දේශ 1996 මැයි 27 වන දින ඉදිරිපත් කරන ලදී. මෙම කමිටුවේ සාමාජිකයින් වූයේ ආචාර්ය ශිරාණි බණ්ඩාරනායක, රොහාන් එදිරිසිංහ, වික්ටර් ගුණවර්ධන ලූෂන් රාජකරුණානායක, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, සූර්යා වික්‍රමසිංහ යන අයයි.



එම නිර්දේශයන්ගේ තුන්වැන්න ලෙස සඳහන් වූයේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට තොරතුරු දැනගැනීමේ අයිතිය ද ඇතුළත් කළ යුතු බවයි. එම උපදේශක කමිටුව ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ පනතේ අවශ්‍යතාව පිළිබඳ පළමුවරට නිර්දේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ වන විට දකුණු ආසියාතික කිසිදු රටක තොරතුරු දැන ගැනීමේ පනතක් නොවීය.

ආර්.කේ.ඩබ්.ගුණසේකර කමිටුවේ සාමාජිකයන්ගේ නිර්දේශය යටතේ විවෘත ආණ්ඩුක්‍රම මූලධර්ම මත පදනම් වෙමින් මූලධර්ම කිහිපයක් ම සකස් කළ අතර තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ පනතෙහි ඇතුළත් විය යුතු කරුණු ගණනාවක් ම මෙම නිර්දේශවල ඇතුළත් විය.

නමුත් මෙම ව්‍යවස්ථා සංශෝධනය සිදු නොවී පවතින තත්ත්වයක් තුළ ප්‍රකාශනයේ අයිතිය තුළට තොරතුරු දැන ගැනීමේ අයිතිය යන්න ඇතුළත් වන බවට විමල් ප්‍රනාන්දු එදිරිව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා තවත් අය නමැති නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන ලදී. මෙම තත්ත්වය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සීමා සහිත පරිසර යුක්තිය කේන්ද්‍රීය එදිරිව නාගරික සංවර්ධන අධිකාරිය හා වෙනත් අය නැමැති නඩුවේදී ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යළි සනාථ කරන ලදී.

**1998 අප්‍රේල් 27 සිට 29**



1998 අප්‍රේල් 27 සිට 29 දක්වා කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති ජනමාධ්‍ය සමුළුවේ දී ඉදිරිපත් කළ මාධ්‍ය නිදහස හා සමාජ වගකීම් පිළිබඳ වූ කොළඹ ප්‍රකාශනය මගින් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තොරතුරු දැන ගැනීමේ අයිතිය සම්බන්ධව ඇති දුර්වලතාවයන් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 19 වන ව්‍යවස්ථාවට අනුකූල වන ආකාරයට සංශෝධනය විය යුතු බවට අවධාරණය කරන්නට විය.

**2000**

2000 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට මූලික අයිතිවාසිකම් යටතේ තොරතුරු දැන ගැනීමේ අයිතිය ද ඇතුළත් කර ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවට ගෙනා ආ නමුත් විපක්ෂයන් මත වූ දැඩි විරෝධය හමුවේ සාකච්ඡා නොකර බැහැර කරන්නට විය.

**2002 - 2003**

2002 සහ 2003 වර්ෂවල දී කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එක්ව තොරතුරු ලබා ගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර එවකට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනපති වශයෙන් සහ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාව සිටි සංවාස ආණ්ඩු කාලයේ දී, අග්‍රාමාත්‍යවරයා සමඟ සාකච්ඡා වාර කිහිපයකට විවිධ සංශෝධන සහිතව 2003 වසරේ දී අධිකරණ අමාත්‍යාංශය විසින් අවසන් කෙටුම්පත සකස් කරන ලදී.



**2004**

2004 වසරේ එක්සත් ජාතික පක්ෂ රජයේ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදුව එම රජයේ බිඳවැටීමත් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. එකල පනත සම්පාදනය කිරීමට එවකට නීතිපති වශයෙන් කටයුතු කළ කමල සබේසන් අධිකරණ ලේකම් ධාරා විජයතිලක නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ කර්තෘ සංසදය හා නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ නියෝජිතයින් පිරිසක් සහභාගී වී ඇත.

**2006**

ශ්‍රී ලංකා නීති කොමිසම විසින් තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ යෝජිත පනත් කෙටුම්පතක් දෙවන වරටත් ඉදිරිපත් කරන ලදී. ඒ සමගම ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය සඳහා ජනතා සහභාගිත්වය පරිපූර්ණ කිරීම සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිය නීති මගින් සම්මත කළ යුතු බවයි. එසේම 2003 වර්ෂයේ දී ලංකාව, එක්සත් ජාතීන්ගේ සම්මුති දෙකක් අත්සන් කළ බැවින් යහපාලනය වර්ධනය කිරීම සඳහා ද මෙවැනි පනතක අවශ්‍යතාව දක්වා තිබිණි.

මෑතකාලීන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු මගින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තොරතුරු දැන ගැනීමේ අයිතිය ඇතුළත් වන බව ප්‍රකාශ කළ බැවින් ද, එම ප්‍රතිපත්ති සඳහා නීතිමය පිළිගැනීමක් අවශ්‍ය බව දක්වා ඇත. එහි වැඩිදුරටත් දැක්වෙන්නේ කොමිසම විසින් 2001 වසරේ දී තොරතුරු නිදහස පිළිබඳ පනතක් ගෙන ඒමේ යෝජනාවක් අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවයි. එම පනත් කෙටුම්පත 2013 වසරේ අධිකරණ අමාත්‍යාංශය විසින් සම්පාදනය කරන ලද පනත් කෙටුම්පතෙහි සංශෝධිත සංස්කරණයක් වන අතර මෑත කාලීන ජාත්‍යන්තර වෙනස් වීම් ද සැලකිල්ලට ගෙන එය වැඩිදියුණු කර ඇත.

**2009**

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මැතිතුමා විසින් පත්කරන ලද විශේෂඥ

කමිටුවක් විසින් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය හා කර්තෘ සංසදයේ අදහස් ලබාගෙන 2009 නොවැම්බර් මාසයේ දී තොරතුරු සඳහා ප්‍රවේශය පිළිබඳව පනත් කෙටුම්පතක් සකස් කරන ලදී. මෙම පනත් කෙටුම්පත් 2004 වසරේ කැබිනට් මණ්ඩලය විසින් සම්මත කරන ලද පනත් කෙටුම්පත මත පදනම් කරගෙන එය වඩාත් සංවර්ධනය කරමින් සකස් කර ඇති අතර ඊට ඉන්දියාවේ (2005) වසරේ දී සම්මත කරන ලද තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත ද ආදර්ශයට ගෙන ඇත.



මෙම කෙටුම්පත සකස් කිරීමේදී සිවිල් සංවිධාන සාමාජිකයන්ගේ ද සහය ලබාගන්නට වූ අතර එය 2010 පාර්ලිමේන්තු මහ මැතිවරණය ආසන්න කාලයේ අධිකරණ අමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී. 2010 මහමැතිවරණයෙන් මිලින්ද මොරගොඩ අමාත්‍යවරයා පරාජයට පත්වූ අතර පසුව එම පනත් කෙටුම්පත ඉදිරියට ගෙනයාමට කිසිවක් ඉදිරිපත් වූයේ නැත.



**2010**

විපක්ෂ මන්ත්‍රීවරයෙකු වූ කරු ජයසූරිය මහතා විසින් තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් එය සම්මත කළ යුතු බවට යෝජනාවක් ගෙන ආවේය. එකල විපක්ෂ නායකවරයා වූ රනිල් වික්‍රමසිංහ මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද වුවත් ආණ්ඩු පක්ෂය විසින් එම යෝජනාව ඉවත් කර ගන්නා ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. ඒ ඔවුන් ආණ්ඩුවෙන් මෙවැනි පනත් කෙටුම්පතක් ගෙන එන බව පවසමිනි. ඒ මත පදනම් වෙමින් කරු ජයසූරිය මහතා තම යෝජනාව ඉල්ලා අස්කර ගත්තේ ය.

**2015.11.02**

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා විසින් ඉදිරිපත් කළ තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලය විසින් සම්මත කරන ලදී. කැබිනට් මණ්ඩලය අනුමත කළ පනත් කෙටුම්පත 2015 දෙසැම්බර් 18 වන දින ගැසට් පත්‍රයේ පළ කරන ලදී. මෙම කෙටුම්පත සම්මත වීමෙන් අනතුරුව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කාර්ය සාධක බලකායක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවට රජය විසින් ප්‍රචාරය කරන ලදී. නමුත් එදින මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොවූ අතර ඒ සඳහා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළේ උතුරු පළාත් සභාවේ අනුමැතිය ලැබී නොමැති බැවින් එදින පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළ බවයි.



**2016.03.24**

ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා විසින් පනත් කෙටුම්පත පළමුවර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

**2016.06.24**

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබුවේ ය.

**2017.02.03**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ දී සම්පූර්ණ එකඟත්වයෙන් ඓතිහාසික ජයක් ලබා දෙමින් සම්මත වූ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත විශේෂ ගැසට් නිවේදනයක් මගින් ජාතික ලෙස ප්‍රකාශයට පත් විය. ඒ අනුව අමාත්‍යාංශ සහ රාජ්‍ය අධිකාරීන් සඳහා මෙම පනත බලගන්වන ලද්දේ 2017 පෙබරවාරි 03 වැනි දින සිට ය.

**සකස් කළේ නිලුක්ෂි කුමාරි සහ ඉෂාරා විජේරත්න**



# සිවිල් ආයුධය අපට දීලා තියෙද්දී ඒක භාවිත කරේ නැත්නම් ඒ ආයුධයෙන් වැඩකුත් නෑ

## නීතීඥ අසාඩ් මුස්තෆා

අධ්‍යක්ෂ - Sri Lanka Development Journalist Forum

**තොරතුරු දැනගැනීමේ පනත ලංකාව තුළ ක්‍රියාත්මක කර වසර 7කට ආසන්නයි. ලාංකේය මාධ්‍ය ක්ෂේත්‍රය තුළ තොරතුරු දැනගැනීමේ පනත කළ වෙනස්කම් කවරේ දැයි දැන ගැනීම** Sri Lanka Development Journalist Forum **හි අධ්‍යක්ෂ නීතීඥ අසාද් මුස්තෆා සමඟ සන්නිවේදකයා විශේෂ සාකච්ඡාවක් පැවැත්වීය.**

**තොරතුරු දැනගැනීම පනත ක්‍රියාත්මක කරල දැනට අවුරුදු 07ක් වෙනවා. තොරතුරු දැනගැනීමේ පනත ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රයට මොනවගේ බලපෑමක් ද කරල තියෙන්නේ?**

මේ අවුරුදු හතක කාලයක් තුළ වැඩිපුරම තොරතුරු දැනගැනීමේ පනත පුරවැසියට වඩා පාවිච්චි කරල තියෙන්නෙ මාධ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න අය. දෙවැනි කාරණාව තමයි ඇත්තටම තොරතුරු දැනගැනීමේ පනත ලංකාවට ගෙනාවේ පුරවැසියාගේ තොරතුරු දැනගැනීමේ අයිතිය ආරක්ෂා කිරීම අරමුණු කරගෙන. කියන්නත් කණගාටුයි. පුරවැසියන් හැටියට මේ පනත භාවිත කරලා තියෙන්නෙ ඉතාමත් සුළු පිරිසක් විතරයි. එතකොට දැන් මේ තොරතුරු දැන ගැනීමේ පනත පුරවැසියාට නෙවෙයි මාධ්‍යවේදියාට තමයි කියලා යම් මතයක් ගොඩනැගිලා තියෙනවා සමාජය ඇතුළේ. ඒකට හේතුව තමයි දැනට මේ පනත ගොඩක්ම භාවිත වෙලා තියෙන්නේ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ වීම. අවුරුදු හතක් වගේ කාලයක් ඇතුළත කොමිෂන් සභාවට මේ තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලලා තොරතුරු නොදී හිටීම නිසා අභියාචනා හාරසියයකටත් වඩා ඉදිරිපත් වෙලා තියෙනවා. මේ අභියාචනා හරහා නඩු 400කටත් වඩා තියෙනවා.

> **කියන්නත් කණගාටුයි පුරවැසියනගෙන් මේ පනත භාවිත කරලා තියෙන්නෙ ඉතාමත් සුළු පිරිසක් විතරයි**

වැඩි කොටසක්ම ඉදිරිපත් වෙලා තියෙන්නේ මාධ්‍ය ක්ෂේත්‍රයෙන්. මාධ්‍ය ක්ෂේත්‍රය ගත්තොත් වාර්තා ඉදිරිපත් කරන්න ඕනේ වගවීම සහ වගකීම යන දෙකට යටත්ව. ඒ වගේම මාධ්‍ය වාර්තාවක් ඉදිරිපත් කරද්දී නිවැරදි තොරතුරු ලබාදීම මාධ්‍යවේදියාගේ වගකීමක්. මං හිතනවා තොරතුරු දැනගැනීමේ පනත වගකීම හා වගවීම ඉෂ්ට කිරීමට මාධ්‍ය ක්ෂේත්‍රයට යම්කිසි සහනයක් ලබා දීලා තියෙනවා කියලා. මීට පෙර අපි රජයේ ස්ථානයකට ගිහිල්ලා යම්කිසි තොරතුරක් ගන්නවා නම් විශාල සටනක් කරන්න අවශ්‍යයි. තොරතුරු ලේසියෙන් දෙන්නේ නෑ. යම්කිසි ලියුමක් ලියලා තොරතුරු ඉල්ලපු ගමන්, ඒකටත් ගරු කරන්නෑ. හැබැයි මේ තොරතුරු දැනගැනීමේ පනත ආවට පස්සේ ඒ බාධකය ඉවත්වෙලා තියෙනවා. එතකොට දැන් මාධ්‍ය ක්ෂේත්‍රයේ වැඩ කරන ඕනෑම මාධ්‍යවේදියෙකුට රජයේ ආයතනයකින් තොරතුරක් ලබා ගැනීමට අවශ්‍ය නම් ඉතාමත් සුළු වැඩ කටයුතු ටිකක් තමයි කරන්න තියෙන්නේ. ඒ කියන්නේ, RTI 01 පෝරමය පුරවා අදාළ රජයේ ආයතනයට ලබා දීම ඔස්සේ තොරතුරු ලබාගන්න පුළුවන්. ඒ මට්ටමටම තොරතුරු දැන ගැනීමේ පනත ඔස්සේ තොරතුරු දැනගැනීමට ඉතා හොඳ පරිසරයක් නිර්මාණය කොට තිබෙනවා. එතකොට මාධ්‍යකරුවාට මාධ්‍ය ක්ෂේත්‍රය තුළ වගකීම හා වගවීම ක්‍රියාත්මක කිරීමට යම්කිසි දායකත්වයක් මේ තොරතුරු දැන ගැනීම පනත ඔස්සේ ලබා දීලා තියෙනවා කියලා මං හිතනවා.

**ලංකාවේ මාධ්‍යවේදීන් එක්ක ගනුදෙනු කරන තැනැත්තෙක්**

**හැටියට පොදුවේ තොරතුරු දැන ගැනීමේ පනත භාවිත කිරීමේ දී මාධ්‍යවේදීන්ට මුහුණ පාන්න වෙලා තියෙන්නෙ මොනවගේ අත්දැකීම්වලට ද?**

මාධ්‍ය ක්ෂේත්‍රයේ සිටින මාධ්‍යකරුවන් විවිධ අත්දැකීම්වලට මුහුණ දීලා තියෙනවා. අපි ඒගොල්ලන් එක්ක ඒවා ගැන සාකච්ඡා කරලා තියෙනවා. ඒ වගේම අපි උදව් කරල තියෙනවා. ඒවගේම එගොල්ලන්ට අවශ්‍ය උපදෙස් දීල තියෙනවා. මෙතන තියෙන පළවෙනි බාධකය තමයි කාලය. මාධ්‍ය ගත්තොත් උණුසුම් පුවත් දෙන්න ඕන, එහෙම නම් හැකි ඉක්මනින් ඒ පුවත් දෙන්න ඕන. හැකි ඉක්මනින් තොරතුරු ලබා දෙන්න නම් අපි හැකි ඉක්මනින් තොරතුරු ලබා ගන්න ඕන. හැබැයි අපි මේ තොරතුරු දැනගැනීම පනත යටතේ යම්කිසි තොරතුරකට ඉල්ලීමක් ඉදිරිපත් කළොත්, පනතෙම තියනවා දවස් 14ක කාලයක් ලබා දෙන්න ඕන කියලා. ඒ විතරක් නෙවෙයි ඒ පනතේ තවදුරටත් කියනවා ඒ දවස් 14 ඇතුළත ඒ තොරතුරු ලබාග න්න බැරි වුණොත්, තවත් වැඩිපුර දවස් හතක් ගන්න පුළුවන් කියලා. එහෙමත් බැරි උනොත් තවත් වැඩිපුර දවස් විසි එකක් ගන්න පුළුවන් කියලත් තියෙනවා. ඒ වගේ කාලසීමාවක් තියෙද්දි මාධ්‍යකරුවෙක් හැටියට ඒ වගේ අවශ්‍ය තොරතුරු, අවශ්‍ය ප්‍රවෘත්තිය ලබාදීමේදී කාලය හා සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තියෙනවා. සමහර අය තොරතුරු දැනගැනීම පනත යටතේ තොරතුරු ඉල්ලලා මාසයක් මාස තුනක් මාස හයක් වගේ කාලයක් ඉවසලා ඉන්න ඕනෙ ඒ තොරතුරු ලබා දෙනකන්. එතකොට සමහර විට ඒ ගත්ත මාතෘකාව නැත්තම් ඒ ගත්ත ප්‍රවෘත්තිය පරණ වෙලා ඉවරයි. එතකොට ප්‍රවෘත්තියේ වටිනාකමක් නැතිවෙලා යනවා. ප්‍රවෘත්තියේ වටිනාකම නැති වුණාට පස්සේ අදාළ තොරතුරු වාර්තා කිරීමට ලබාදෙන අවස්ථාව ඉතාමත් අඩුයි. ඒ එක පැත්තක්. තවත් පැත්තක් තමයි යම්කිසි තොරතුරක් තොරතුරු දැනගැනීමේ පනත භාවිත කරලා ඉල්ලුම් කරාට පස්සේ සමහර අයට තර්ජන ඇවිල්ලා තියෙනවා. ඇයි මේ වගේ තොරතුරු ඕගොල්ලන් ඉල්ලන්නේ කියලා වගේ විවිධ තර්ජනවලට ලක්වෙච්ච අවස්ථා තියෙනවා. එතකොට මෙතන තියෙන ලොකුම බාධකය තමයි කාලය. මේක මාධ්‍යවේදීන් අවම කරන්න ඕන නම් සැලසුම් කරලා මාධ්‍යවේදයාගේ කතාවක් එහෙමත් නැත්තම් පරීක්ෂණයක් වෘත්තීමය වශයෙන් සිදු කරන්න ඕන. මේ තොරතුරු දැනගැනීමේ පනත යටතේ එනම් යම්කිසි පුවතක් නිර්මාණය කරද්දී ටිකක් වැඩි කාල සීමාවක් කියලා ගන්න ඕනේ. එහෙම කළොත් මම හිතනවා ප්‍රජාවට හොඳ තොරතුරක් හොඳ විස්තරයක් ලබා දෙන්න පුළුවන් කියලා. මේකෙ තවත් පැත්තක් තියෙනවා, තොරතුරු දැනගැනීමේ පනත පාවිච්චි කරද්දි මාධ්‍යවේදීන් පනත භාවිත කරලා ප්‍රශ්න අහනවා. **ඉතාමත් වැරදි විදියට තමයි ඒ තොරතුරු දැනග ැනීමේ පනත භාවිත කරන්නේ. ඇත්තටම තොරතුරු දැනග ැනීමේ පනත භාවිත කරලා අපිට ඉල්ලන්න පුළුවන් වෙන්නේ තොරතුරු. තොරතුරු ඉල්ලුවොත් තමයි දෙන කෙනාට පහසුවෙන්නේ මොන වගේ තොරතුරු ද අපෙන් ඉල්ලන්නේ කියලා බලලා දෙන්න පුළුවන් වෙන්නේ. ඒ වෙනුවට මාධ්‍යවේදීන් කරන්නේ ප්‍රශ්න අහන එක.** උදාහරණයක් විදිහට පාරක් සංවර්ධනය කරන ව්‍යාපෘතියක් යනවා, එතකොට මාධ්‍යවේදියාට අවශ්‍ය වෙන්නේ, මේක කොහොමද කරන්නේ, කවුද කරන්නේ, කවදද වෙන්නේ, කොච්චර මුදලක්ද යන්නේ, කියලා දැනග න්න. එතකොට RTI 01 ෆෝරමය භාවිත කරලා තොරතුරු ලබාගැනීම වෙනුවට ප්‍රශ්න අහන එක මාධ්‍යවේදීන් කරනවා. මේ ව්‍යාපෘතිය කා විසින් නිර්මාණය කරන ලද්දක්ද? මේකට අය වෙන මුදල කීයද? මේ ටෙන්ඩර් එක කාටද දීලා තියෙන්නේ? මෙන්න මෙහෙම ප්‍රශ්න කරන එක. මෙහෙම ප්‍රශ්න කරනකොට රජයේ ආයතන තොරතුරු ලබා නොදී ඉන්න වැඩි ඉඩකඩකුත් තියෙනවා. ඊට වඩා හොඳම දේ තමයි ඒකට අවශ්‍ය තොරතුරු මොනවද කියල බලලා ඒකට අදාළ තොරතුරු ටික විතරක් ඉල්ලන එක.

**එතකොට උතුර හා නැගෙනහිර යන පළාත්වල සහ දමිළ භාෂාවෙන් වැඩකරන මාධ්‍යවේදීන්ට විශේෂිත ගැටලු තියෙනව ද මේ පනතින් තොරතුරු ගන්න අවස්ථාවල?**

ලංකාවෙ තියෙන සාමාන්‍ය ගැටලුවක් තමයි ඒ භාෂා ගැටලුව. කොයි පැත්තෙ බැලුවත් ඔය භාෂා ගැටලුව තියෙනවා. ඒක තොරතුරු දැනගැනීමේ පනතටත් අදාළ වෙනවා.

**සමහර අය තොරතුරු දැනගැනීම පනත යටතේ තොරතුරු ඉල්ලලා මාසයක්, මාස තුනක්, මාස හයක් වගේ කාලයක් ඉවසලා ඉන්න ඕනෙ ඒ තොරතුරු ලබා දෙනකම්**

උදාහරණයක් හැටියට මඩකලපුවේ වැඩ කරන කෙනෙක් තොරතුරු ලබා ගැනීමට අම්පාරේ ගියොත්, අම්පාරේ වැඩ කරන සියලුම දෙනාම සිංහල මාධ්‍යයෙන් තමයි වැඩකරන්නේ, එතකොට මේගොල්ලන්ගේ ඉල්ලුම් පත්‍රය ලබාදෙන්නෙ දෙමළ මාධ්‍යයෙන්, දෙමළ භාෂාවෙන් ඉල්ලුම් පත්‍රය ලබා දුන්නට පස්සේ, ඒ වැඩ කරන නිලධාරීන් භාෂාව දන්නැති හින්දා, ඒක පරිවර්තනය කරන්න ඕනේ. සිංහල මාධ්‍යයට පරිවර්තනය කරලා, ඉස්සෙල්ලාම දැන ගන්න ඕන එයාලා මොනවද ඒ ඉදිරිපත් කරලා තියෙන ප්‍රශ්න කියලා, ඊට පස්සේ ඒ ගොල්ලන් සතුව තියෙන තොරතුරු ගත්තොත් ඒව තියෙන්නේ සිංහල මාධ්‍යයෙන්. එතකොට එයාල තොරතුරු ලබා දෙද්දී, තොරතුරු ලබා දෙන්නේ සිංහල මාධ්‍යයෙන්.

එතකොට දෙමළ භාෂාවෙන් තොරතුරු ඉල්ලලා සිංහල භාෂාවෙන් තොරතුරු ලබාදෙද්දී එතන සන්නිවේදන ගැටලුවකුත් මතුවෙනවා. ඒ වගේ ප්‍රශ්න ගොඩක් උතුරු නැගෙනහිර තියෙනවා. මොකද හේතුව ගොඩක් උසස් නිලධාරීන් සිංහල භාෂාවෙන් තමයි වැඩ කරන්නේ. මේකේ අනිත් පැත්තත් තියෙනවා. උතුරේ කවුරු හරි ඉන්නවනම් සිංහල කතා කරන එයාලා මොනවාහරි තොරතුරක් අවශ්‍ය නම් එයාලා ගිහින් තොරතුරු ඉල්ලන්නේ සිංහලෙන්. එහෙ සිංහල දන්නෙ නැති හින්දා ඒ ගොල්ලො අවශ්‍ය තොරතුරු ලබා දෙන්නෙ නෑ. මේ වගේ අවස්ථාවලදී අපි දැකපු ලොකුම ප්‍රශ්නයක් තමයි කාලය නිකන් නාස්ති වෙනවා සහ අවශ්‍ය වේලාවට තොරතුරු ලබාගැනීමට අපහසුතාවයක් ඇතිවෙනවා කියන එක. ඒ වගේම අවශ්‍ය නැති, ඉල්ලපු නැති තොරතුරු තමයි මේ ගොඩක්ම ලැබෙන්නේ. ඒ වගේ භාෂා ගැටළු තමයි ගොඩක් තියෙන්නෙ, වෙන විශේෂ ගැටළුවක් නම් දැක්කේ නෑ.

**තොරතුරු දැනගැනීමේ අයිතිය ගැන ලංකාවේ අධිකරණය කොහොම ද බලන්නෙ?**

අධිකරණය ගැන කතා කරන්න ඉස්සෙල්ල අපි කොමිෂන් සභාව ගැන කතා කරලා ඉන්න ඕන. කලින් කිව්වා වගේ කොමිෂන් සභාවට අභියාචනා හාරසීයක් වගේ ගිහිල්ල තියෙනවා. කොමිෂන් සභාවට යෝජනාව ආවට පස්සේ, කොමිෂන් සභාව ගොඩක් දුරට බලන්නේ කොහොමහරි මේ තොරතුරු ලබා දෙන්න. එහෙම නැත්තම් පුරවැසියාගේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම ආරක්ෂා කරන්න. මගේ අත්දැකීමක් අනුව, ගොඩක් තීන්දු දීලා තියෙන්නේ තොරතුරු ඉල්ලීම් කරපු පක්ෂයට පක්ෂපාතීව. රජයේ ආයතන පැත්තට වඩා තොරතුරු කොමිසම ගොඩක්ම බලන්නේ කොහොමහරි මේ තොරතුරු ඉල්ලපු අයට ලබාදෙන්නෙ. ඒ කියන්නේ ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය ආරක්ෂා කරගන්න ඕන විදිහට තමයි කොමිෂන් සභාව කටයුතු කරන්නේ. අධිකරණය ගත්තොත් ගොඩක් අභියාචනා අභියාචනාධිකරණයට ගියාට පස්සේ අභියාචනාධිකරණය බලන්නේ කොහොමද පුරවැසියාගේ අයිතිවාසිකම් ආරක්ෂා කර තොරතුරු දැනගැනීමේ අයිතිය, තොරතුරු දැනගැනීමේ පනත යටතේ මොනවාද දෙන්න ඕන කියලා බලලා දෙන එක සහ අධිකරණය විසින් ඒකට නිර්වචන කිරීමක් සිදුකිරීම. උදාහරණයක් විදිහට වගන්ති අංක 05 යටතේ යම්කිසි තොරතුරක් ලබා නොදී ඉන්න පුළුවන් කියලා තියෙනවා. නමුත් නිර්වචනයක් කරලා නෑ. රටේ ආරක්ෂාව සම්බන්ධ තොරතුරු නොදී ඉන්න පුළුවන්. එතකොට රටේ ආරක්ෂාවට මොනවගේ තොරතුරු නොදී ඉන්න පුළුවන්ද කියල කියලා නෑ. නිර්වචනය කරන්න ඕනේ අධිකරණය තමයි. ඒක අධිකරණයට ගියාට පස්සේ තමා අධිකරණය බලන්නේ ඒක රටේ ආරක්ෂාවට තර්ජනයක් යන කොටසට වැටෙනවද නැද්ද කියල. ඒ වගේ **අපිට විශේෂ නඩු තීන්දුවක් තියෙනවා. හිටපු ජනාධිපතිගේ වත්කම් සම්බන්ධව තොරතුරු ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරා. ඒක තමයි මේ පනත යටතේ අභියාචනා අධිකරණයට ගියපු පළවෙනි නඩුව. එතකොට කොමිෂන් සභාව කිව්වා මේක ජනාධිපතිගේ පෞද්ගලික තොරතුරු මේක ලබා දෙන්න බෑ කියලා. ඊට පස්සේ අභියාචනාධිකරණයට ගියහම කිව්වා, මේක පෞද්ගලික තොරතුරක් තමයි, ඒ වුණාට මහජන උනන්දුව තියෙන හින්දා, මේ තොරතුරු ලබාදෙන්න කියලා.** මේ වගේ විශිෂ්ට තීන්දු තීරණ ලබා දුන් අවස්ථා තියනවා. ඒ වගේම කොමිෂන් සභාව සති දෙකක් තුනක් වගේ ඇතුළත, තීන්දුවක් දුන්නා, පෞද්ගලික මාධ්‍ය ආයතන රාජ්‍ය දේපල යටතට එනවද නැද්ද කියන එක ගැන. ඔවුන් භාවිත කරන ගුවන් කාලය Public Authority හින්දා ඒගොල්ලන් අයිති වෙන්නේ රාජ්‍ය දේපල යටතට කියලා තීන්දුවක් ලබා දුන්නා. ඒ අනුව ගත්තොත් මේගොල්ලෝ ගොඩක් වෙලාවට කටයුතු කරන්නෙ පුරවැසියාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට තමයි කියලා මම විශ්වාස කරනවා.

**යහපාලනයේ වැදගත් අංගයක් හැටියටයි තොරතුරු අයිතිය සැලකෙන්නෙ. ලංකාවේ රාජ්‍ය පාලනයේ ප්‍රජාතන්ත්‍රය වැඩිකරන්න තොරතුරු අයිතිය දායක වෙනවා කියල ඔබ විශ්වාස කරනව ද?**

දැන් අපි අවුරුදු හතක් ඇතුළත බලනකොට ඉස්සරට වඩා යම්කිසි මට්ටමකට තොරතුරු දැනගැනීමේ පනත වගකීමට වගවීමට

## තොරතුරු වසංවෙලා තියෙන දොරටුව දැන් ටිකක් විවෘත වෙලා තියෙනවා



# පනත හොඳ වුණාට ඒක හරියට ක්‍රියාත්මක වෙන්නේ නෑ

හා ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට දායකත්වයක් ලබා දීලා තියෙනවා. හැබැයි එතන පොඩි අඩුපාඩුවකුත් තියෙනවා. අපිට කියන්න බෑ සීයට සීයක්ම මේක දායකත්වයක් ලබා දෙනවා කියලා. යම්කිසි මට්ටමකට අර තොරතුරු වසන්වෙලා තියෙන දොරටුව දැන් ටිකක් විවෘත වෙලා තියෙනවා. තොරතුරු ඕන කෙනාට පුළුවන් ඒ අදාළ තැනට ගිහින් තොරතුරු ලබාගන්න. ඒවගේ මට්ටමකට දැන් ඇවිල්ලා තියෙනවා. දැන් සාමාන්‍යයෙන් යම්කිසි මාධ්‍යවේදියෙකුට තොරතුරු ඉදිරිපත් කරන්න යම්කිසි තොරතුරක් අවශ්‍ය නම් මාධ්‍යවේදියාට පුළුවන් ඒ අදාළ ස්ථානයට ගිහිල්ලා අදාළ තොරතුරු ගන්න. ඒත් ඒක ඉස්සර බෑ.

**ඒ කියන්නේ යම්කිසි විනිවිදභාවයක් මේක තුළ තියෙනවා කියලා ඔබතුමා හිතනවා?**

ඔව් විනිවිදභාවයකුත් තියෙනවා වගේම රාජ්‍ය ආයතනවලට යම්කිසි බයකුත් තියෙනවා. තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලුවොත් තොරතුරු ලබා දෙන්න ඕනේ කියන බය දැන් ඇවිල්ලා තියෙනවා. ඇත්තම කිව්වොත් මේක පාවිච්චි කරන්න ඕන 'පුරවැසියා' තමයි. ඒත් පුරවැසියා අඩුවෙන් පාවිච්චි කරනවා කියලා තමයි මම දකින්නේ. **ඒවගේම පුරවැසියා තාම දැනුවත් වෙලා නෑ මේ පනතට තියෙන බලය මොකක්ද කියලා. ඒ හින්දා තමයි මාධ්‍යවේදීන් මේක අතට අරගෙන ප්‍රජාව වෙනුවෙන් මේ කාර්යය ඉටු කරන්නේ. මම නම් කියන්නේ මේක සිවිල් ජනතාවගේ ආයුධයක් කියලා. තොරතුරු දැනගැනීමේ අයිතිය කියන්නේ අපිට තියෙන ජනතාවට තියෙන ආයුධයක්. සිවිල් ආයුධය භාවිත කිරීමේ අයිතිය අපිට දීලා තියෙනවා. එතකොට අපි තමයි ඒක හරියට පාවිච්චි කරන්න ඕන. සිවිල් ආයුධය අපට දීලා තියෙද්දී ඒක භාවිත කරේ නැත්නම් ඒ ආයුධයෙන් වැඩකුත් නෑ.** උදාහරණයක් හැටියට පොලිස් නීතිය ක්‍රියාත්මක වෙන්නේ පොලිසියෙන්. ප්‍රාදේශීය සභාවලට නීතිය ක්‍රියාත්මක වෙන්නේ ප්‍රාදේශීය සභාවෙන්. ඒවගේම තොරතුරු දැනගැනීමේ අයිතිය කියන්නේ ප්‍රජාවගේ නීතියක්. එතකොට ඒකෙ අයිතිකරු අපි, ප්‍රජාව හැටියට අපි තමයි ඒ නීතිය පාවිච්චි කරන්න ඕන. නීතිය ක්‍රියාත්මක කරන්න ඕන අපි. ඒක ක්‍රියාත්මක කරන කණ්ඩායම හැටියට මම දකින්නේ මාධ්‍යවේදීන්, සිවිල් සමාජ හා ප්‍රජාව. ප්‍රජාව මේක භාවිත කළොත් පුළුවන් විනිවිද භාවයක් ගොඩනගාගන්න.

**ලෝකයේ අනිත් රටවල් එක්ක සසඳනකොට ලංකාව කොතන ද තියෙන්නෙ?**

මං හිතන්නේ ලෝකයේ රටවල් එකසිය විසි හතක් මේ වෙනකොට තොරතුරු දැනගැනීමේ පනත් නිර්මාණය කරලා තියෙනවා. ඒගොල්ලන් ඒ පනත ක්‍රියාත්මක කරනවා. ඒගොල්ලන් අතරින් අපි ලෝකයේ තුන්වෙනි ස්ථානය තමයි ඉන්නේ. ඒ තරම් හොඳ සැලැස්මක් අපේ තොරතුරු දැනගැනීමේ පනතට තියෙනවා. ඇත්තටම ලංකාවේ තොරතුර දැනගැනීමේ පනතේ සැලැස්ම ඉතාම හොඳයි. **ඉන්දියාව එහෙම ගත්තොත් සමහර ස්ථානවලින් තොරතුරු ලබාගන්න බෑ කියලා ඒ පනතෙන්ම කියලා තියෙනවා. ඉන්දියාවේ රාජ්‍ය ආයතන 18කින් තොරතුරු දැනගැනීමේ පනතින් ඉල්ලුම් පත් ඉදිරිපත් කරන්න බෑ. ලංකාවේ එහෙම බාධාවක් නෑ. ලංකාවේ ඕනෑම රජයේ ආයතනයකට ඕනම කෙනෙකුට ගිහිල්ලා අවශ්‍ය තොරතුරු ලබාගන්න පුළුවන්. ඒවගේම රාජ්‍ය නොවන ආයතනවලට ගිහිල්ලත් මේ තොරතුරු දැනගැනීමේ පනත පාවිච්චි කරලා අවශ්‍ය තොරතුරු ලබාගන්න පුළුවන්. රාජ්‍ය ආයතනවලට විතරක් සීමා නොකර රාජ්‍ය නොවන සංවිධානවලටත් මේක විවෘත කරලා තියෙනවා ලංකාවේ.** හැබැයි ප්‍රශ්නෙ තියෙන්නේ මේක ක්‍රියාත්මක වෙනකොට, ඒ ක්‍රියාත්මක වෙන ප්‍රමාණය දිහා බලනකොට අපි පොඩ්ඩක් පසුපසින් තමයි ඉන්නේ, පනත හොඳ වුණාට ඒක හරියට ක්‍රියාත්මක වෙන්නේ නෑ. ඒකට අවශ්‍ය යාන්ත්‍රණය තාම සකස් වෙලා නෑ. යාන්ත්‍රණයේ ප්‍රශ්නයක් තියෙන හින්දා ලෝකයේ හොඳම පනතක් අපිට තියෙනවා වුණාට ක්‍රියාත්මක වීමේදී ප්‍රශ්න තියෙනවා.

**ඔබ කිව්වනේ පනතක් විදිහට හොඳ වුණාට ක්‍රියාත්මක වීමේදී යම් යම් ප්‍රශ්න තියෙනවා කියලා. මොන වගේ ප්‍රශ්නද කියලා දැන ගන්න පුළුවන්ද?**

පළවෙනි ගැටලුව තමයි පනත අපිට ක්‍රියාත්මක කරන්න ඕන නම් අපිට අවශ්‍ය වෙනවා ලොකු මානව සම්පතක්. තොරතුරු ලබාදීමේ නිලධාරින් ආදි වශයෙන් අපිට විශාල මානව සම්පතක් අවශ්‍ය වෙනවා. උදාහරණයක් විදිහට අභියාචනා හාරසිය ගානක් විතර කොමිෂන් සභාව තියෙනවා, හැබැයි ඒවා පොඩි ප්‍රමාණයක් වුණාට ඒවාට අදාළ මුදල් වෙන් කිරීමක් කරලා නෑ. එතකොට කොහොමද ඒගොල්ලෝ මේක ක්‍රියාත්මක කරන්නේ. එතකොට මුදල් ප්‍රශ්න තියෙනවා. මානව සම්පත් ප්‍රශ්න තියෙනවා. තාක්ෂණික ප්‍රශ්න තියෙනවා. ඒ වගේ යාන්ත්‍රණයෙත් ප්‍රශ්න ගොඩක් තියෙනවා. ඒ හින්ද අපිට මේක හරියට ක්‍රියාත්මක කරන්න ලොකු බාධාවල් තියෙනවා. ඒ හැර අනිත් පැත්තෙන් ගත්තොත් ප්‍රජාවට මේ පිළිබඳ හරි දැනුවත්භාවයක් නැතිකම, ඉතින් ඒ අතින් ගත්තොත් අපිට මේක ක්‍රියාත්මක කිරීම පිළිබඳ යම්කිසි සීමාවක් තියෙනවා.

**සාකච්ඡා කළේ හඵසා වහබ්දීන්**
**පිංතූර මිහිරංග දිසානායක**

# තොරතුරු නිලධරයිනි, රාජකාරී කරන හැටි දැනගන්න




මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මගින් අනෙකුත් විධිවිධානයන් අතර තොරතුරු දැනගැනීමේ අයිතිය විශ්ව මානව හිමිකම් අයිතිවාසිකමක් ලෙස තහවුරු කර ඇති අතර එය ආරක්ෂා කිරීමට සියලු සාමාජික රටවල් ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග ගත යුතු බව ප්‍රකාශ කර ඇත. මානව හිමිකම් විශ්ව ප්‍රකාශනයෙහි 19 වැනි වගන්තියේ සඳහන් වන්නේ සෑම තැනැත්තෙකුට ම අදහස් දැරීමේ සහ ප්‍රකාශ කිරීමේ නිදහසේ අයිතිය ඇතත් මෙම අයිතියට බාධාවකින් තොරව අදහස් දැරීමට යන සීමා නොතකා ඕනෑම මාධ්‍යයක් හරහා තොරතුරු සහ අදහස් වෙත ප්‍රවේශ වීමට, ලබා ගැනීමට සහ සන්නිවේදනය කිරීමට ඇති නිදහස ද ඇතුළත් වන බව යි.

මෙම සන්දර්භය මත වර්ෂ 2016 අගෝස්තු මස දී, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කරන ලදී. පුරවැසියන්ට රාජ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දීම හරහා ඔවුන්ව ක්‍රියාකාරී ජන ජීවිතයකට හුරු කිරීමටත්, ඒ තුළින් රජය සහ රාජ්‍ය ආයතන තම එදිනෙදා කටයුතුවලදී වඩාත් විනිවිදභාවයෙන් සහ වගවීමෙන් ක්‍රියා කරන සංස්කෘතියක් නිර්මාණය කිරීමත් පනත හඳුන්වාදීමේ අරමුණු විය. ඒ තුළින් අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන මෙන්ම රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන 4500ක සන්තකයේ පවතින එමෙන්ම එම ආයතන තුළින් පාලනය කෙරෙන තොරතුරුවලට ප්‍රවේශ වීමට හැකියාව ලබා දේ.

**තොරතුරු යනු මොනවා ද?**

2016 වර්ෂයේ ජුනි මස 24 වන දින ඒකමතිකව සම්මත කරනු ලැබූ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතෙහි තොරතුරු යන්න අර්ථ දක්වා ඇත. තොරතුරු යන්නට, පහත සඳහන් ඒවායේ භෞතික ස්වරූපය හෝ ස්වභාවය නොසලකා සටහන්, ලේඛන, සංදේශ, විද්‍යුත් තැපැල්, මත, උපදේශ, මාධ්‍ය නිවේදන, චක්‍රලේඛන, නියම, ලොග් පොත්, ගිවිසුම්, වාර්තා, ප්‍රවෘත්ති පත්‍ර, සාම්පල්, ආදර්ශක, හුවමාරු වන ලිපි, සංදේශ, නීති කෙටුම්පත්, පොත්, පිඹුරු සිතියම්, චිත්‍ර, රූප සටහන්, රූපමය හෝ ප්‍රස්ථාරමය වැඩ හෝ ඡායාරූප, සේයා පට, ක්ෂුද්‍ර සේයාපට, ශබ්ද පටිගත කිරීම්, විඩියෝ පට, යන්ත්‍ර මගින් කියවිය හැකි වාර්තා, පරිගණක වාර්තා සහ වෙනත් ලේඛනගත ද්‍රව්‍ය, ඇතුළු යම් ආකාරයකින් ලේඛනගත කරන ද්‍රව්‍ය සහ ඒවායේ යම් පිටපත් ඇතුළත් මෙමගින් තොරතුරු යන්නට සාමාන්‍ය අර්ථයට වඩා පුළුල් අර්ථයක් ලබා දී ඇත.

**තොරතුරු නිලධාරියා යනු කවුද?**

තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ තොරතුරු ලබා දෙනු ලබන කාර්යයේ දී සක්‍රීයව සම්බන්ධ වන්නේ තොරතුරු නිලධාරියායි. තොරතුරු නිලධාරියා සතුව පවතින තොරතුරු මනා කළමනාකරණයෙන් යුක්තව තොරතුරු ඉල්ලා සිටිනු ලබන පාර්ශවයන් වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ පනතේ 23 (2) වගන්තියෙන් පෙන්වා

දෙන්නේ,

"සෑම තොරතුරු නිලධරයෙකු විසින්ම, ඔහු හෝ ඇය තොරතුරු නිලධරයෙකු ලෙස පත් කරනු ලැබ ඇත්තේ යම් පොදු අධිකාරියක් වෙනුවෙන් ද ඒ අධිකාරිය වෙත ඉදිරිපත් කළ තොරතුරු සඳහා වන ඉල්ලීමක දී, ඒ තොරතුරු ලැබෙන්නට සැලැස්විය යුතු අතර, එවැනි ඉල්ලීමක් සිදු කරන යම් පුරවැසියකුට අවශ්‍ය සියලු සහාය ලබා දිය යුතුය."

නම් කළ නිලධාරියා යනු කවුද?

පොදු අධිකාරියක 'පළමු අභියාචනා අධිකාරී බලය දරන්නා' නම් කළ නිලධාරී නමින් හැඳින්වේ. තොරතුරු නිලධාරියාගේ ප්‍රතිචාර දැක්වීම/නොදැක්වීම පිළිබඳ තොරතුරු ඉල්ලා සිටින්නා සෑහීමකට පත් නොවන්නේ නම්, නම් කළ නිලධාරියා වෙත අභියාචනා සිදු කළ හැකි ය. පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ කාල සීමාව තුළ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, නම් කළ නිලධාරියා විසින් එම අභියාචනය භාරගත යුතු වන්නේ ය. පනතේ 23 වගන්තිය ප්‍රකාරව, තොරතුරු නිලධාරියෙකු පත් කොට නොමැති අවස්ථාවක දී පොදු අධිකාරියේ ප්‍රධානියා හෝ ප්‍රධාන විධායක නිලධරයා එම පොදු අධිකාරියේ තොරතුරු නිලධරයා බවට ඉබේම පත් වේ.

මෙහිදී තොරතුරු නිලධාරියා අවශ්‍ය නිලධාරීන්ගේ සහාය ඇතිව ඉල්ලා සිටින තොරතුරු ලබා දීමට කටයුතු කළ යුතු වේ. ඒ බව පනතේ 23 (3) වගන්තිය "තොරතුරු නිලධරයා විසින් මෙම පනත යටතේ ඔහු හෝ ඇය වෙත පවරන ලද කාර්යය නිසි පරිදි ඉටු කිරීම සඳහා ඔහු හෝ ඇය විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි වෙනත් යම් නිලධරයෙකුගේ සහාය ඉල්ලා සිටින විට එම සහාය ලබා දීම ඒ නිලධරයාගේ කාර්යය වන්නේ ය." යනුවෙන් සඳහන් වේ.

වගකීම් සහගත ක්‍රියාවලිය

මේ අනුව බලන විට තොරතුරු නිලධාරියා ඉතා කාර්යක්ෂමව තොරතුරු ඉල්ලා සිටින පුද්ගලයින් වෙත තොරතුරු ලබා දීමට කටයුතු කළ යුතු වේ. තොරතුරු නිලධාරියා ආයතනික සහ වෘත්තීයමය වශයෙන් ශක්තිමත් විය යුතු බව ද දක්වා ඇත. එනම් මනා පරිචයක් තොරතුරු නිලධාරියා සතු විය යුතු බව දැකිය හැකි ය. තොරතුරු නිලධාරියා තම ආයතනය මඟින් ඉල්ලා සිටින තොරතුරු මනා කළමනාකාරීත්වයෙන් යුතුව අදාළ පාර්ශවයන් වෙත ලබා දීමට සහ තොරතුරු ඉල්ලා සිටින්නන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීමටත් වගබලා ගත යුතු වේ.

ආයතනයක් සතු වැදගත් තොරතුරු ලබා දීමේ දී තොරතුරු නිලධාරියා ආරක්ෂාකාරීව කටයුතු කිරීම ද වැදගත් වේ. ඒ අනුව තොරතුරු නිලධාරියාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විමසා බලන විට තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු නිලධාරියාට පැවරූ කාර්යයක් හෝ බලයක් ඉටු කිරීමේ දී ක්‍රියාත්මක වීමේ දී ඒ නිලධාරියා සද්භාවයෙන් කළ කිසිම ක්‍රියාවකට ඒ පොදු අධිකාරිය හෝ ඒ පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා හෝ වෙනත් නිලධාරියෙක් හෝ කිසිදු සිවිල් හෝ අපරාධ වගකීමකට යටත් නොවිය යුතු බව පනතේ 30 වැනි වගන්තියේ සඳහන් කර ඇත. ඒ අනුව සද්භාවයෙන් කරන රාජකාරීමය කාර්යයන් සඳහා තොරතුරු නිලධාරීන්ට සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව ආරක්ෂාව හිමිවන බව පෙන්වා දී ඇත.

මේ අනුව පුරවැසියෙක් විසින් සිදු කරන තොරතුරු ඉල්ලීමකදී අදාළ පොදු අධිකාරිය තුළ ඔහුට/ඇයට මුලින්ම සම්බන්ධ වන්නේ තොරතුරු නිලධාරියා වේ. මෙම තොරතුරු ඉල්ලීමේ ක්‍රියාවලිය තුළ තොරතුරු නිලධාරියා සතු වගකීම් ප්‍රමාණය ඉතා ඉහළ ය.

තොරතුරු නිලධාරියා මත පැවරෙන වගකීම්

- **තොරතුරු නිලධාරියා විසින් තොරතුරු ඉල්ලා සිටින පුද්ගලයා හට අවශ්‍ය සියලු සහය ලබා දිය යුතු ය.**
- **අදාළ ඉල්ලීම පිළිගත් බවට කුවිතාන්සියක් ලබා දීම.**
- **අදාළ ඉල්ලීමට නිසි කලට ප්‍රතිචාර දැක්වීම, ඒ සඳහා වැඩි කාලයක් අවශ්‍ය වන්නේ නම් එය තොරතුරු ඉල්ලුම් කරන්නාට දැනුම් දීම.**
- **අදාළ ඉල්ලීම වාචිකව සිදු කොට ඇත්නම් එය ලේඛනගත කිරීම.**
- **තොරතුරු ඉල්ලීම්වල ලිපිගොනුවක් පවත්වාගෙන යාම.**
- **තොරතුරු ඉල්ලීම්වලට නිසි ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වේ නම් අනෙකුත් නිලධාරීන්ගේ සහය පැතීම.**
- **අයදුම්පත් යොමු කිරීමට පුරවැසියාට සහය වීම.**
- **කිසිදු අය කිරීමකින් තොරව පනතේ විධිවිධාන අනුව තොරතුරු දැනගැනීමේ අයදුම්පතක් යොමු කිරීම පිණිස පුරවැසියන්ට සෑම ආකාරයකින්ම සහය වීමට තොරතුරු නිලධාරීන් වගකීමෙන් බැඳී සිටී.**
- **යම් හෙයකින් අදාළ පුරවැසියාට තම අයදුම්පත්‍රය ලිඛිතව පුරවා ගැනීමට අපහසු**

**නම් තොරතුරු නිලධාරියා විසින් එම අයදුම්පත ලිඛිතව පුරවා දීමට වගකීමෙන් යටත් වේ.**

තොරතුරු දැනගැනීමේ අයදුම්පත් යොමු කරන සෑම පුරවැසියෙකුටම අවශ්‍ය උපරිම සහය ලබාදීම තොරතුරු නිලධාරියාගෙන් අපේක්ෂා කරයි. ඒ සඳහා වෙනත් නිලධාරියෙකුගේ සහය ලබා ගැනීමට අත්‍යවශ්‍ය යැයි අදාළ නිලධාරියා හෝ නිලධාරිනිය කල්පනා කරන්නේ නම් එම සහය ලබාදෙන ලෙස වෙනත් නිලධාරියෙකුගෙන් ඉල්ලා සිටිය හැකි ය.

තොරතුරු ලබා දීමේ භාෂාව සම්බන්ධයෙන් විමසා බලන විට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම වඩාත් සක්‍රීයව ක්‍රියාත්මක වීමට නම් ඒවා ලබා ගත හැකි භාෂා මාධ්‍ය ඉතා වැදගත් වේ. එනම් රාජ්‍ය භාෂාවන්ගෙන් තොරතුරු ලබා ගැනීමේ හිමිකම පුරවැසියන්ට හිමිවන බව දක්වා ඇත. මේ අනුව භාෂා ශක්‍යතාව තොරතුරු නිලධාරියාට පැවතීම ඉතා වැදගත් වේ.

**තොරතුරු නිලධාරියා අතින් සිදු විය හැකි වැරදි?**

තොරතුරු නිලධාරීන් විසින් සිදුවිය හැකි විෂමාචාර සම්බන්ධයෙන් ද පනත අවධාරණය කර ඇත. තොරතුරු දැනගැනීමේ පනත හරහා තොරතුරු ලබා ගැනීම මූලිකම අයිතියක් වේ. එය සිදු කරන මූලිකම සම්බන්ධීකාරක වන්නේ තොරතුරු නිලධාරීයා ය. එම ඉල්ලා සිටින තොරතුරු ලබා නොදීම හෝ අවහිර කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් වශයෙන් පෙන්වා දී ඇත. එමෙන්ම හෙළි නොකළ යුතු තොරතුරු හෙළි කිරීමත් දඬුවම් ලැබිය යුතු වරදක් වේ. තොරතුරු දැනගැනීමේ පනතේ තොරතුරු නිලධාරියා අතින් සිදු විය හැකි වැරදි විෂමාචාර කිහිපයක් දැකගත හැකි ය.

01 පුරවැසියාට තොරතුරු ලබා දීමේ දී වැරදි ආකාරයට කටයුතු කරන හෙවත් හිතාමතාම තොරතුරු ලබා දීම අවහිර කරන

02 චේතනාන්විතව වැරදි හා අසම්පූර්ණ තොරතුරු සැපයෙන

03 තමා වෙත ලැබුණු තොරතුරු චේතාන්විතව විනාශ කරන, අවලංගු කරන, වෙනස් කරන හෝ පූර්ණ ලෙස හෝ අර්ධ ලෙස වසන් කරනු ලබන

04 කොමිෂන් සභාවේ නියමයන්ට අනුකූල නොවන, කොමිෂන් සභාවට චේතනාන්විතව සාවද්‍ය තොරතුරු සපයන

05 කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හරින

06 කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු අවහිර කරන

07 පනතේ (5)වැනි වගන්තිය සහ උප වගන්තිය මගින් හෙළිදරව් නොකළ යුතු තොරතුරක් හෙළිදරව් කිරීම වේ.

තොරතුරු දැනගැනීමේ පනතේ 39 (උ) උප වගන්තිය මඟින් මේ බව පැහැදිලිව දක්වා ඇත. මෙම උපවගන්තිය මඟින් තොරතුරු නිලධාරියකු විසින් වරදක් කර ඇති බව ප්‍රකාශ කොට මහේස්ත්‍රාත්වරයෙකු විසින් පනවනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරුවකු බවට ඔප්පු වුවහොත් රුපියල් 50, 000.00ක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක (2) කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ මේ දඬුවම් දෙකටම යටත් කිරීමේ හැකියාව පවතී.

පනතේ විධිවිධාන අනුව තොරතුරු නිලධාරියාට පමණක් නොව ඔහුට සහාය ලබාදීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින වෙනත් නිලධාරියකුට වුව ද නඩු පවරා දඬුවම් ලබාදිය හැකි ය. ඒ බව තොරතුරු පනතේ 39(2) වගන්තිය මඟින් පෙන්වා දී ඇත. එහි සඳහන් කර ඇත්තේ තොරතුරු නිලධාරියෙකු විසින් වෙනත් නිලධාරියෙකුගේ සහාය ඉල්ලා සිටින විට එකී නිලධාරියා විසින් අදාළ සහාය ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ සහාය ලබා දීම පැහැර හරින්නේ නම් අදාළ නිලධාරියා මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු වුවහොත් රුපියල් 10,000.00 නොඉක්මවන දඩ මුදලකට යටත් කළ හැකි බවයි. එනම් තොරතුරු නිලධාරියෙකුගේ විෂමාචාර ක්‍රියාවකට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණ නඩු පවරා වැරදිකරු වන අදාළ නිලධාරියාට දඬුවම් ලබාදිය හැකි ය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ මූලික පරමාර්ථය වන්නේ පුරවැසියන් සවිබල ගැන්වීමයි. එමෙන්ම රජයේ වැඩ කිරීමේදී විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම, දූෂණය පාලනය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදය ජනතාව වෙනුවෙන් සැබෑ අර්ථයෙන් ක්‍රියාත්මක කිරීමයි. එමෙන්ම පුරවැසියෙකු ලෙස පාලකයින්ගේ කටයුතු පිළිබඳ අවදියෙන් සිටීම සහ රාජ්‍ය පාලනය තුළ ඇති වගකීම් - වගවීම් ඇති කිරීම සඳහා පුරවැසියන්ට තොරතුරු පනතින් අවකාශය උදා වේ. සැබවින්ම තොරතුරු පනත රජයේ ක්‍රියාකාරකම් පිළිබඳව පුරවැසියන්ට දැනුම්වත් වීම සඳහා තැබූ විශාල පියවරකි. මෙම තත්ත්වය තුළ තොරතුරු නිලධාරියාගේ කාර්යභාරය ඉතා වැදගත් ය.

**සටහන සතුශ්ක ජයවර්ධන**

# Ek Cup Chya (තේ කෝප්පයක්): සිනමා ගවේෂණයක්




මහාරාෂ්ට්‍රයේ ග්‍රාමීය ප්‍රදේශයේ ජීවත් වන අවංක සහ කඩිසර බස් කොන්දොස්තරවරයෙකි. ඔහු නමින් කාශිනාත් ශාවන්ත් (කිශෝර් කාදම්). කාශිනාත් නොසිතූ පරිදි රු. 50,000ක පමණ අසාමාන්‍ය ලෙස ඉහළ ගිය විදුලි බිලක් ඔහුව කලබලයට පත් කරයි. විදුලිබල මණ්ඩලයේ උදාසීන ප්‍රතිචාර නිසා ව්‍යාකූලත්වයට සහ කලකිරීමට පත් වූ කාෂිනාත් මේ බිල්පත පිටුපස ඇති සත්‍යය හෙළි කිරීමේ මෙහෙයුමක් අරඹයි. මුලදී, විදුලිබල මණ්ඩලයෙන් සතුටුදායක පැහැදිලි කිරීමක් ලබා ගැනීමට කාෂිනාත් දරන උත්සාහය නිලධාරිවාදය මඟින් උදාසීනත්වයට පත් කරයි. විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් ඔහුගේ ප්‍රශ්න කිරීම් ප්‍රතික්ෂේප කරන අතර, ප්‍රශ්න නොකර බිල්පත ගෙවන ලෙස යෝජනා කරයි. මෙම ක්‍රමය ඔහු වැනි සාමාන්‍ය පුරවැසියන්ට අලුත් දෙයක් නොවන බැවින් කාෂිනාත් බලාපොරොත්තු සුන් වූ තත්ත්වයකට පත් වෙයි.

නමුත් ඔහුගේ බිරිඳ වන සුමති (දේවිකා දෆ්තාර්දාර්) සහ ඔහුගේ අධිෂ්ඨානශීලී දියණිය විද්‍යා (වීනා ජම්කාර්) විසින් දිරිමත් කළ නිසාම කාෂිනාත් උත්සාහය අත් නොහැරීමට තීරණය කරයි. තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනතින් හඳුන්වා දෙන ප්‍රාදේශීය RTI ක්‍රියාකාරිනියක වූ අම්රුතා සුභාෂ් මුණ ගැසීම කාශිනාත්ගේ උත්සාහයේ හැරවුම් ලක්ෂයකි. ඇය RTI අයදුම්පතක් ගොනු කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඔහුව දැනුවත් කරයි. ඔහුට මඟ පෙන්වයි, මෙම පනත මගින් පුරවැසියන්ට රාජ්‍ය බලධාරීන්ගෙන් තොරතුරු ලබා ගැනීමට සහ ඔවුන්ට වගවීමට බලය ලබා දෙන බව පැහැදිලි කරයි.

මෙම නව දැනුමෙන් සන්නද්ධව, කාෂිනාත් තම විදුලි පරිභෝජනය සහ බිල්පත් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉල්ලා RTI අයදුම්පතක් ගොනු කරයි. ඔහු තවදුරටත් නිලධාරිවාදී බාධක හා ප්‍රමාදයන්ට මුහුණ දෙන බැවින් මේ ක්‍රියාවලිය පහසු නැති බව තේරුම් ගනියි. කෙසේ වෙතත්, කාෂිනාත්ගේ අධිෂ්ඨානය සහ ඔහුගේ පවුලේ අයගේ සහයෝගය ඔහුව ඉදිරියට ගෙන යයි.

**චිත්‍රපටය එහි උච්චතම අවස්ථාවට පැමිණෙන්නේ තම RTI අයදුම්පත්‍රය හරහා රැස් කරගත් සාක්ෂිවලින් සන්නද්ධ වූ කාෂිනාත්, ප්‍රසිද්ධ නඩු විභාගයක දී විදුලිබල මණ්ඩල නිලධාරීන් සමඟ ගැටීමෙනි. දූෂණය සහ නොසැලකිලිමත්කම හෙළිදරව් කරමින් විදුලිබල මණ්ඩලයේ අක්‍රමිකතා පිළිබඳ තොරතුරු සොයා ගැනීමට කාශිනාත්**

**සමත් වෙයි. කාෂිනාත්ගේ ගමන හුදෙක් ඔහුට සිදු වූ අසාධාරණයට අභියෝග කිරීම පමණක් නොවේ. එය පද්ධතිමය දූෂණයට සහ අකාර්යක්ෂමතාවයට එරෙහි පුළුල් සටනක් බවට පත් වේ. අයුක්තියට එරෙහිව නැගී සිටිය හැකි බව පෙන්වා දෙමින් ඔහු තම ප්‍රජාවට සවිබල ගැන්වීමේ සංකේතයක් බවට පත්වේ. සත්‍යය හෙළිදරව් වන ප්‍රබල උච්චතම අවස්ථාවකින් චිත්‍රපටය අවසන් වන අතර කාෂිනාත්ගේ නොපසුබට උත්සාහයට යුක්තිය ඉටු වේ.**



ඉන්දියානු සිනමා ක්ෂේත්‍රය තුළ විවිධ වූ ආඛ්‍යාන මුල් කරගත් සිනමා කෘති දැකගත හැකියි. සුමිත්‍රා භවේ (Sumitra Bhave) සහ සුනිල් සුක්තංකර් (Sunil Sukthankar) විසින් 2009 වර්ෂයේ දී අධ්‍යක්ෂණය කරන ලද මෙම මරාති චිත්‍රපටය තොරතුරු දැන ගැනීමේ පනතේ බලය අවධාරණය කරන ආඛ්‍යානයක් ඉදිරිපත් කරයි. සාමාන්‍ය බස් කොන්දොස්තරවරයෙකු තොරතුරු දැන ගැනීමේ පනත භාවිත කරමින් දූෂණයට එරෙහිව සිදු කරන සටනක් මෙහි දිග හැරෙයි.

"Ek Cup Chya, "තේ කෝප්පයක්" වැනි නමක් මෙම සිනමා කෘතියට තේමා කර ගෙන ඇත්තේ එදිනෙදා ජීවිතයේ සරල බව ඉස්මතු කිරීමට පුළුවන. තේ කෝප්පයක් පානය කිරීම විශේෂයෙන් ඉන්දියාවේ සාමාන්‍ය, දෛනික පුරුද්දකි. එය පවුල හෝ ප්‍රජාව තුළ විරාමයක් සහ සම්බන්ධතාවයක් නියෝජනය කරයි. මෙම මාතෘකාව තෝරා ගැනීමෙන්, චිත්‍රපට නිෂ්පාදකයින් අවධාරණය කරන්නේ, ප්‍රධාන චරිතය වන කාෂිනාත් සාවන්ත්, දූෂණයට එරෙහි ඔහුගේ සටන සාමාන්‍ය ප්‍රේක්ෂකයාට ළං වූ එදිනෙදා අරගලවලට මුහුණ දෙන සාමාන්‍ය මිනිසෙකු බවයි.

**Ek Cup Chya තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත විනිවිදභාවය සහ වගවීම සඳහා මෙවලමක් ලෙස නිරූපණය කිරීමේදී සාර්ථක බව කිව හැකි ය. අධ්‍යක්ෂවරුන් තොරතුරු සහ පෙළඹවීම යන දෙඅංශයෙන්ම ආඛ්‍යානයක් සකසා ඇති අතර, ප්‍රේක්ෂකයින්ට දූෂණයට සහ අකාර්යක්ෂමතාවයට අභියෝග කිරීමට තොරතුරු දැනගැනීමේ පනත භාවිත කළ හැකි ආකාරය පෙන්වයි. මෙම චිත්‍රපටය හරහා තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ ප්‍රායෝගිකත්වය මැනවින් නිරූපණය කර ඇති බව සඳහන් කළ හැකි ය.**

කාශිනාත් සාවන්ත් ලෙස කිශෝර් කාදම්ගේ රංගනය විශේෂයෙන් කැපී පෙනේ. ඔහු තම භූමිකාවට අව්‍යාජභාවයක් රැගෙන එන අතර චරිතයේ අපේක්ෂා භංගත්වයේ සිට බලගැන්වීම දක්වා යන ගමන ග්‍රහණය කර ගනී. දේවිකා දෆ්තාර්දාර්, වීනා ජම්කාර් සහ අම්රුතා සුභාෂ් ඇතුළු සහය නළු නිළියන් ද ප්‍රබල රංගනයන් ඉදිරිපත් කරමින්, ආඛ්‍යානයට පොහොසත් බවක් එක් කරයි. චාරුදත් දුක්බන්දේ විසින් චිත්‍රපටයේ කැමරාකරණය සිදු කර ඇති අතර මහාරාෂ්ට්‍රයේ ග්‍රාමීය භූ දර්ශන ඉතා අලංකාර ලෙස ඔහු ග්‍රහණය කර ගෙන තිබේ.

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ වැදගත්කම ඵලදායි ලෙස පෙන්වා දුන්න ද, Ek Cup Chya චිත්‍රපටියේ අඩුපාඩු නැතුවාම නොවේ. චිත්‍රපටය ගලා යන වේගය කාෂිනාත්ගේ ගමනේ ප්‍රේක්ෂකයින් ගිල්වා ගැනීමට අදහස් කළ ද, ඇතැම් දර්ශන, විශේෂයෙන්ම නිලධාරිවාදී ක්‍රියා පටිපාටි නිරූපණය කරන දර්ශන, ඕනෑවට වඩා දිගු වේ. චිත්‍රපටයේ චරිත තවත් සංවර්ධනය කළ හැකි චරිත බව පෙනී යයි. කාෂිනාත් ප්‍රබල චරිතයක් වූව ද ඔහුගේ පවුලේ අය සහ RTI ක්‍රියාකාරිනිය ඇතුළු සහායක චරිත තරමක් නොදියුණු ය. ද්විතීයික චරිතවල දායකත්වය අඩු වීම සිනමා කෘතියේ දැකිය හැකි දුර්වලතාවයකි.

**මීට අමතරව, යථාර්ථවාදය අවධාරණය කිරීම ඇතැම් තැන්වලදී ප්‍රේක්ෂකයා උදාසීනත්වයට පත් කරයි. කාෂිනාත් මුහුණ දෙන නිලධාරිවාදී බාධාවන් එක එල්ලේ නිරූපණය කර ඇති අතර, එය යථාර්ථවාදී වුවද, තිරය මත නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කිරීමට කළ හැකිව තිබුණි. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත නැවත නැවත අවධාරණය කිරීම මඟින් උපදේශාත්මක ස්වරූපයක්ද චිත්‍රපටයෙන් දිස් වේ.**

කෙසේ වෙතත් Ek Cup Chya යනු RTI පනතේ බලය සහ සාමාන්‍ය පුරවැසියන්ට යුක්තිය සඳහා මෙවලමක් ලෙස භාවිත කිරීමට ඇති හැකියාව කියාපාන චිත්‍රපටයකි. තොරතුරුවල බලය සහ පුරවැසියන් සවිබල ගැන්වීමේ වැදගත්කම අවධාරණය කරන නැරඹිය යුතු චිත්‍රපටයක් ලෙස මෙය අගය කළ හැකි ය.

**සටහන නිසංසලා අබේගුණසේකර**

# නොරට්ටු හොඳ කියති

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක තොරතුරු කොමිසම පිළිබඳවත් තොරතුරු පනතේ අයිතිය ලාංකිකයන් ක්‍රියාවට නංවා ඇති ආකාරය පිළිබඳවත් බංගලාදේශ පුවත්පතක් වන ද ඩේලි ස්ටාර් වෙත 2023 ඔක්තෝබර් 15 වන දා එරට තොරතුරු කොමිසමේ සහකාර අධ්‍යක්ෂ රුහි නාස් සහ ආචාර්ය ෂම්සුල් බාරි සම්පාදනය කළ ලිපියේ පරිවර්තනය.

තොරතුරු දැනගැනීමේ අයිතිය ශ්‍රී ලංකාවට සිය තොරතුරු අර්බුදය කළමනාකරණය කිරීමට උපකාර වූ ආකාරය

රටක යහපාලනය සහ තිරසාර සංවර්ධනය සඳහා ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතියේ වැදගත්කම ඉස්මතු කළද, බොහෝ අවස්ථාවලදී එය ජනතාව සහ රජය විසින් නිහඬව නොසලකා හරිනු ලැබේ. ඒනිසාම, පසුගිය වසර ආරම්භයේදී ශ්‍රී ලංකාව මුහුණ දුන් ආකාරයේ මූල්‍ය හා දේශපාලන අර්බුදයක් නැවත ඇතිවීම වැලැක්වීමට සහ රටේ ස්ථාවරත්වය සහතික කිරීමට, තොරතුරු දැනගැනීමේ අයිතියට (RTI) වැඩි කාර්යභාරයක් පවතින බව මෑත කාලීනව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට (IMF) අදාළ වාර්තාවක ඉදිරිපත් කොට ඇත.

මෙම වාර්තාව ඉදිරිපත් වීමට පසුබිම සකස් වූයේ මේ වසර ආරම්භයේදී ශ්‍රී ලංකා රජය, රට සහ එහි ආර්ථිකය ස්ථාවර කිරීමට දැරූ උත්සාහයන් පිළිබඳ පාලන විනිශ්චය තක්සේරුවක් (Governance Diagnostic Assessment - GDA) සිදු කරන ලෙස IMF වෙත කළ ඉල්ලීමෙන් අනතුරුවයි. මූල්‍ය හා ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම, පාලනය උසස් කිරීම සහ දූෂණ අවදානම අවම කිරීම සඳහා වූ පියවර ගණනාවක් මෙහි ඇතුළත් විය.


ආචාර්ය රුහි නාස්


ආචාර්ය ෂම්සුල් බාරි

මෙම නිර්දේශ අතර තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වඩාත් පිළිගත හැකි මට්ටමේ කරුණක් වූයේ තොරතුරු දැනගැනීමේ අයිතිය මඟින් වඩාත් විනිවිදභාවයෙන් සහ වගවීමකින් යුත් පාලනයක් කෙරෙහි ඔවුන් අවධාරණය යොමු කරමින් එකී විනිවිදභාවයෙන් සහ වගවීමකින් යුත් පාලනය සහතික කිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිය මගින් සිදු කිරීමයි. GDAහි සොයාගැනීම් මගින් පාලනයේ තීරණාත්මක ක්ෂේත්‍රයන්ගේ පුළුල් හා අඛණ්ඩ පාලන දුර්වලතා සහ දූෂණ අවදානම් මෙන්ම ඒවායේ සාර්ව ආර්ථික බලපෑම හෙළිදරව් විය. නමුත් මෙම අධ්‍යයන මඟින් කළු වලාකුළු පිටුපස රිදී රේඛාවක් බඳු යමක් ද සොයාගෙන ඇත. ඒ කුමක්දයත්, තොරතුරු දැනගැනීමේ අයිතියෙහි වැදගත්කම අවධාරණය කරමින් GDA විසින් ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට සහ ඔවුන් ආරක්ෂා කිරීම සඳහා ආයතනික රාමුවක් නිර්මාණය කිරීමට රජය ගන්නා පියවර පැසසුමට ලක් කළේය. තවද ආරම්භයේ සිටම ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව (RTIC) ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහා ඉටු කර ඇති ප්‍රශංසනීය කාර්යභාරය විශේෂයෙන් අවධාරණය කළ අතර එය තවදුරටත් ශක්තිමත් කිරීමට නිර්දේශ කළේය. එහි හොවා දක්වන භූමිකාවක් වන්නේ, විශේෂයෙන්ම දූෂණ විරෝධී ප්‍රයත්නයන්ගේ ප්‍රතිවිපාක වන්නේ මැදිහත්වීම සඳහා වන බොහෝ ඉල්ලීම් පැමිණෙන්නේ සාම්ප්‍රදායිකව දූෂණයට සහ කාන්තා සහ සුළුතර කණ්ඩායම් ඇතුළු මහජන බලය අනිසි ලෙස භාවිත කිරීමට නිරාවරණය වන කණ්ඩායම්වලින් වන බැවිනි.

පාර්ලිමේන්තුවේ මෑත කාලීන පනත් ගණනාවක් එහි අධිකරණ බලයෙන් " සංවේදී" කරුණු හැර තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවෙහි (RTIC) විෂය පථය සීමා කිරීමට හැකියාව ඇති බව පාලන විනිශ්චය තක්සේරුව (GDA) සඳහන් කළ අතර, අනාගතයේදී නීති කිසිවක් RTIC වෙත ළඟා වීම සීමා නොකළ යුතු බව නිර්දේශ කර ඇත. නව දූෂණ-විරෝධී කටයුතු මෙන්ම ත්‍රස්තවාදයට සහ පෞද්ගලිකත්ව නීති මගින් මෙම ස්ථාවරය පිළිබිඹු විය යුතුය. එය අවධාරණය කොට ඇත්තේ, " නිලධාරීන්ගේ වැරදි හැසිරීම් සඳහා පවතින දණ්ඩමුක්තිය, රාජ්‍ය අංශය කෙරෙහි ඇති විශ්වාසය

පළඳු කරන අතර ආරවුල් විසඳීම සඳහා කාර්යක්ෂම සහ රීති මත පදනම් වූ විනිශ්චය කිරීමේ ක්‍රියාවලියට ඇති සීමිත ප්‍රවේශය පිළිබඳ උනන්දුවක් ඇති කරවන බවයි."

**ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පාලන විනිශ්චය තක්සේරුව සහ එහි නිර්දේශ බංග්ලාදේශය ඇතුළු සියලුම සංවර්ධනය වෙමින් පවතින ජාතීන් සඳහා වැදගත් වේ. මෙහිදී තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවෙහි (RTIC) කාර්යභාරය පිළිබඳ නිර්දේශ ඉතාමත් වැදගත් වේ. පුරවැසියන් විසින් රජයෙහි වැඩකටයුතු පිළිබඳව වගකීම් රහිතව අධීක්ෂණය කිරීමට පහසුකම් සැලසීම මගින් පාලනයේ විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීමේදී තොරතුරු කොමිෂන් සභාවලට සැබැවින්ම වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකිය.**

කෙසේ වෙතත්, සෑම රටකම තත්ත්වයන් එක හා සමාන නොවන බැවින්, ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවට (RTIC) සිය කැපවීම සහ අධිෂ්ඨානය තුළින් සාක්ෂාත් කරගත හැකි දේ කලාපයේ අනෙකුත් තොරතුරු කොමිෂන් සභා සඳහා කළ නොහැකි වනු ඇත. තොරතුරු කොමිෂන් සභාවල සාර්ථකත්වය සාධක ගණනාවක් මත රඳා පවතී. ප්‍රධාන වශයෙන්ම නීතියේ අරමුණු ඉදිරියට ගෙන යාමට අධිෂ්ඨාන කරගත් සිවිල් සමාජයක පැවැත්මයි. බංගලිදේශයේ නීතියෙහි පැහැදිලිවම දක්වා ඇත්තේ "පුරවැසියන් බලගැන්වීම සඳහා රජයේ කාර්යාලවල විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීම...... එවිට දූෂණය අඩු වී යහපාලනය ස්ථාපිත වනු ඇත." යන්නයි. රාජ්‍ය කාර්යාලවල මුර බල්ලන් සූක්ෂමව සේවය කිරීමට සහ ඔවුන්ගේ වැඩ ගැන සොයා බැලීමට පුරවැසියන්ට පැහැදිලිවම වගකීමක් පවරා ඇත. රාජ්‍ය ආයතනවලින් තම වගකීම්වලට අදාළ තොරතුරු සෙවීම එම කාර්යභාරය ඉටු කිරීම මිස පුද්ගලික අරමුණු ඉදිරියට ගෙන යාමට අවස්ථාවක් නොවේ.

**දෙවන තීරණාත්මක සාධකය වන්නේ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා උද්ඝෝෂණ කිරීමට මෙන්ම සාමූහිකව ක්‍රියාමාර්ග ගැනීමට සූදානම් පුරවැසි කණ්ඩායම්වල පැවැත්මයි. තොරතුරු කොමිෂන් සභා විසින් බේරුම්කරණ යාන්ත්‍රණය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම මෙන්ම මුර බල්ලන් ලෙස ඔවුන් සේවය කිරීමට නියමිතය. එය සිදු කිරීමට අපොහොසත් වුවහොත් අධිකරණයේ පිහිට පැතීමට ඔවුන් සූදානම් විය යුතුය. මෙම යාන්ත්‍රණය අත්‍යවශ්‍ය වන්නේ මෙවැනි කොමිෂන් සභා තීරණ බොහෝ විට විවිධ ආකාරයේ ආණ්ඩුවේ බලපෑම් සමගින් බැඳී ඇති බැවිනි.**

තෙවන කාරණාව වන්නේ, තොරතුරු කොමිෂන් සභා අත්දැකීම්, වාස්තවිකත්වය, අපක්ෂපාතීත්වය සහ අඛණ්ඩතාව යන අංශවලින් ප්‍රවීණ පුද්ගලයින්ගෙන් සමන්විත විය යුතුය. තොරතුරු දැනගැනීමේ අයිතියෙහි බොහෝ නීති මගින් විවිධ පාර්ශවකරුවන්ගේ අදහස් සලකා බැලීම සහ තේරීම සඳහා නිශ්චිත නීති සහ ක්‍රියා පටිපාටි සපයයි.

මෙම අංශ තුනම බොහෝ දුරට ශ්‍රී ලංකාව තුළ හමු වී ඇති බව පෙනේ. ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිය, දකුණු ආසියාවේ අනෙකුත් බොහෝ රටවලට වඩා මෑතකදී ඉදිරිපත් වුවද, කෙටි කාලයක් තුළ මෙතරම් ආකර්ෂණීය ප්‍රගතියක් ලබා ගැනීමට හැකි වූයේ මන්දැයි මෙයින් පැහැදිලි වේ.

පළමු කරුණ නම්, මෑත කාලීනව ශ්‍රී ලාංකේය පුරවැසියන් විසින් රජයේ කටයුතු විමර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ගැටළු ලැයිස්තුව දෙස බැල්මක් හෙළීම නිදර්ශනයක් ලෙස පෙන්වා දිය හැක. මහජන නියෝජිතයන්ගේ වත්කම් බැරකම්, අගමැතිවරුන්ගේ සහ මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාරවල වියදම්, ඇමැතිවරුන්ගේ රාජ්‍ය මුදල් අධික ලෙස වියදම් කිරීම, බන්ධනාගාර ඇමැතිවරයාගේ නොහොබිනා හැසිරීම් පිළිබඳ විමර්ශන වාර්තාව, විදේශ මුදල් සංචිතයේ තත්ත්වය, අදානිගේ බල ව්‍යාපෘතිය අනුමත කිරීම ඊට ඇතුළත් විය. ගෘෘප් ඔෆ් ඉන්දියා, ශ්‍රී ලංකාවේ චීන ආයෝජන, ආනයනික කිරිපිටිවල අඩංගු අමුද්‍රව්‍ය, කල් ඉකුත් වූ කඳුළු ගෑස් මිලදී ගැනීම, මහ බැංකුව විසින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල් ආයෝජනය, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සහ PIA අතර ගුවන් යානා මිලදී ගැනීමේ ගනුදෙනුව, අධික ළදරු මරණ වවුනියාව මහ රෝහලේදී සහ වර්ගීකරණය නොකළ තොරතුරු කැබිනට් කාර්යාලයේ ඇත.

**සමස්තයක් වශයෙන් ජාතියට බලපාන කරුණු පිළිබඳව තීරණය කිරීමට පුරවැසියන් විසින් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ පනතට ඉඩකඩ ලබා දුනි. මේ සමඟ සසඳන විට බංග්ලාදේශයේ තොරතුරු දැනගැනීමේ අයිතියෙහි ඉල්ලීම් බොහෝ දුරට පුද්ගලික සහ ද්විතියික ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන ලෞකික ස්වභාවයක් ගනියි. අපි නීතියේ භාවිතය ඉහළ මට්ටමකට ලබා නොගන්නේ නම්, බංග්ලාදේශයේ තොරතුරු කොමිෂන් සභාවට, රටේ සමස්ත පාලනයට සුළු හෝ බලපෑමක් ඇති නොවන කාරණා සම්බන්ධයෙන් සොයා බලමින් දිගින් දිගටම කටයුතු කිරීමට සිදුවනු ඇත. දෙරටේ අත්දැකීම් මෙතරම් වෙනස් වීමට එක් හේතුවක් නම්, ශ්‍රී ලංකාවේ බොහෝ මහජන අවශ්‍යතා ඉල්ලීම් ඉදිරිපත් වූයේ රාජ්‍ය නොවන සංවිධාන සහ වෙරිටේ, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ නිදහස් සෞඛ්‍ය සේවය සඳහා වූ ජනතා ව්‍යාපාරය වැනි සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් මගිනි. සිත්ගන්නා කරුණ නම්, බංග්ලාදේශයේ සමාන ආයතන**

**විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිතයක් නොමැති තරම් ය.**

රාජ්‍යය සහ පුරවැසියන් සම්බන්ධව කටයුතු කරන ලද විවාදාත්මක අවස්ථා කිහිපයකදී පවා තොරතුරු කොමිසමේ තීරණවලට එරෙහිව උද්ඝෝෂණ කිරීමට හෝ අභියෝග කිරීමට බංගලාදේශ ජාතිකයන් දරන සාමූහික ප්‍රයත්නයන් පිළිබඳ අත්දැකීම කණගාටුදායකය. සිවිල් සමාජය විසින් ගනු ලබන තීරණ පිළිබඳ සුපරීක්ෂණයක් නොමැති අතර අගතියට පත් පරිශීලකයින්ට උසාවියේදී ඔවුන්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට උපකාර කිරීමට ඒකාබද්ධ උත්සාහයක් නොමැත. මීට පෙර නිර්මාණය කළ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සංසදය තවමත් අභාවයට ගොස් ඇත.

බංග්ලාදේශයේ තොරතුරු කොමසාරිස්වරුන් තෝරා ගන්නා පාරාන්ධ ආකාරය මෙයට අයත් වේ. රජයේ සහ සිවිල් සමාජයේ අදාළ අංශ නියෝජනය කරන පුද්ගලයින්ගෙන් සැදුම්ලත් තේරීම් කමිටුවක් නීතියෙන් විධිවිධාන සලසා ඇතත්, පුරවැසියන්, කොමසාරිස්වරුන්ගේ නම් දැන ගන්නේ ඔවුන් තෝරාගත් පසුවය. මේ හේතුවෙන් වඩා විනිවිද වූ තෝරා ගැනීමේ ක්‍රියාවලියක අවශ්‍යතාවය තක්සේරු කළ නොහැකි ය.

මෙම සියලු බාධාවන් සමඟින්, බංගලාදේශ තොරතුරු කොමිසම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පාලන විනිශ්චය තක්සේරුවෙහි (GDA) තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව (RTIC) සඳහා නියම කර ඇති කාර්යභාරය ඉටු කරන්නේ කෙසේදැයි සිතීම දුෂ්කර ය. සෑම විටම නැතිනම් විශේෂයෙන්ම අර්බුදවලදී, තොරතුරු දැනගැනීමේ අයිතිය වඩාත් හොඳින් භාවිත කිරීම රජයට සහ ජනතාවට පාලනයේ දුර්වලතා සහ ඒවා සමඟ එක්ව සටන් කිරීමට උපකාර කළ හැක්කේ ඇයි සහ කෙසේද යන්න දෙවැන්න මඟින් පැහැදිලි කරයි.

ආචාර්ය ෂම්සුල් බාරි,
සභාපති,
බංග්ලාදේශයේ පර්යේෂණ මුලපිරීම් (RIB)

රූහි නාස්,
සහකාර අධ්‍යක්ෂ (RTI),
බංග්ලාදේශයේ (RIB)

විද්‍යුත් තැපෑල: rib@citech-bd.com

**පරිවර්තනය මහේෂා පියුමාලි**

# අකටයුතු පිළිබඳ නාදකයන් අනතුරේ -IMF කියයි-


**2024 ජූලි මස වන විට තොරතුරු දැන ගැනීමේ පනතට සංශෝධනයන් සිදු කළ යුතු බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිර්දේශ කර ඇත. ඒ 2023 සැප්තැම්බර් මස ඉදිරිපත් කළ එහි තාක්ෂණික වාර්තාව වන Governance Diagnostic Assessment (GDA) මගිනි. එම වාර්තාව මගින් අකටයුතු පිළිබඳ නාදකයන්ගේ Whistle blowers අයිතීන් වඩාත් ඵලදායි ලෙස ආරක්ෂා කිරීම සඳහා නීති සංශෝධනය කිරීම සලකා බලන ලෙස අවධාරණය තිබුණි. ඊට අමතරව මේ වසර අවසාන වන විට නිදහස් හා වගකීම් සහිත මාධ්‍යයේ ආරක්ෂාව ශක්තිමත් කිරීමට සඳහා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් රජයට නිර්දේශ කර තිබේ.**

**ඊට අමතරව එම වාර්තාවේ ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව ක්‍රියාත්මක වීමේදී විනිවිදභාවය තහවුරු කරන ආකාරයෙන් කටයුතු සිදු කළ යුතුය යන්න වැඩිදුරටත් දක්වා ඇත. ශ්‍රී ලංකා තොරතුරු දැනග ැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත මෙන්ම ශ්‍රී ලංකා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව පිළිබඳව කරුණු ගණනාවක් වාර්තාවේ අනු අංක 94 සිට 102 දක්වා සඳහන් කොට තිබේ. සන්නිවේදකයා පාඨකයන් වෙනුවෙන් එහි පරිවර්තනයත් මෙසේ ඉදිරිපත් කෙරේ.**

94. තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමේදී ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව (RTIC) 2016 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත මගින් නිර්මාණය

**ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව**
**இலங்கை தகவலறியும் உரிமைக்கான ஆணைக்குழு**
**RIGHT TO INFORMATION COMMISSION OF SRI LANKA**

කරන ලද්දේ පොදු අධිකාරීන් විසින් අවශ්‍ය පරිදි තොරතුරු බෙදා නොගැනීම පිළිබඳ පැමිණිලි විසඳීම සඳහා ය. RTIC හට විනය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමට සහ පනත යටතේ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමට හැකිය. එය විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතර මාධ්‍ය අමාත්‍යාංශය සමග සම්බන්ධ වී කටයුතු කරයි. රාජ්‍ය ආයතන විසින් පුද්ගලයන්ට ඉල්ලා සිටින තොරතුරු සැපයීම සහතික කිරීම සඳහා RTIC ඵලදායී වී ඇත.


INTERNATIONAL MONETARY FUND

IMF Country Report No. 23/340

**SRI LANKA**

**TECHNICAL ASSISTANCE REPORT — GOVERNANCE DIAGNOSTIC ASSESSMENT**

This technical assistance report on Sri Lanka was prepared by a staff team of the International Monetary Fund. It is based on the information available at the time it was completed in September 2023.

Copies of this report are available to the public from

International Monetary Fund • Publication Services
PO Box 92780 • Washington, D.C. 20090
Telephone: (202) 623-7430 • Fax: (202) 623-7201
E-mail: publications@imf.org Web: http://www.imf.org
Price: $18.00 per printed copy

**International Monetary Fund**

95. RTIC දූෂණ විරෝධී ප්‍රයත්නවල තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි, මන්ද බොහෝ උපකාර සඳහා ඉල්ලීම් පැමිණෙන්නේ දූෂණයට හා අපයෝජනයන්ට වඩාත්ම අවදානමට ලක්විය හැකි කාන්තාවන් සහ සුළු ජාතීන් වැනි කණ්ඩායම්වලින් වන බැවිනි. යුක්තිය පසිඳලීම සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිය නිතර භාවිතා කිරීමෙන් පෙන්නුම් කරන්නේ එහි ව්‍යාප්තිය කෙතරම් ඵලදායි ද සහ එය සපයන තොරතුරු කෙතරම් අගනේ ද යන්නයි.

96. RTIC හි කාර්යභාරය ඉටු කිරීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීම පාලනය සඳහා ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, විශේෂයෙන් ආරක්ෂාව, පෞද්ගලිකත්වය සහ දූෂණ විරෝධී නීති වැනි සංවේදී කරුණු සම්බන්ධයෙන් යෝජිත පනත් මගින් කොමිෂන් සභාවේ අධිකාරිය සීමා කළ හැකි ය. ආරක්ෂාව සහ රහස්‍යභාවය සඳහා රාජ්‍යයේ අවශ්‍යතාව සමග තොරතුරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ප්‍රවේශමෙන් සමතුලිත කිරීම වැදගත් වේ. එසේ නොවුවහොත්, පාරදෘශ්‍යභාවය ප්‍රවර්ධනය කිරීමේදී RTIC හි සඵලතාවය අඩාල විය හැකිය. එහි කාර්යභාරය ඉටු කිරීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීම පාලනය සඳහා ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, විශේෂයෙන් ආරක්ෂාව, පෞද්ගලිකත්වය සහ දූෂණ විරෝධී නීති වැනි සංවේදී කරුණු සම්බන්ධයෙන් යෝජිත පනත් මගින් කොමිෂන් සභාවේ අධිකාරිය සීමා කළ හැකි ය. ආරක්ෂාව සහ රහස්‍යභාවය සඳහා රාජ්‍යයේ අවශ්‍යතාව සමග තොරතුරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ප්‍රවේශමෙන් සමතුලිත කිරීම වැදගත් වේ. එසේ නොවුවහොත්, පාරදෘශ්‍යභාවය ප්‍රවර්ධනය කිරීමේදී RTIC හි සඵලතාවය අඩාල විය හැකි ය.

97. රාජ්‍ය අංශයට සක්‍රියව වැඩි තොරතුරු නිතිපතා බෙදාගැනීමේ අවශ්‍යතාවක් පවතී. RTI පනත මහජන තොරතුරු සඳහා හොඳ මූලධර්ම සපයන නමුත්, එය ක්‍රියාත්මක කිරීම නොගැලපේ. වත්කම් ප්‍රකාශන වැනි තොරතුරු හුවමාරු කිරීම වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත. රජයට වගවීම සඳහා විශ්වාසදායක, යාවත්කාලීන තොරතුරු සහිත


විනිවිදභාවය පිළිබඳ ද්වාරයක් නිර්මාණය කිරීමට රජයෙන් උත්සාහයක් අවශ්‍ය වේ. ජනමාධ්‍ය අමාත්‍යාංශය වඩාත් ක්‍රියාශීලී සහ ස්ථාවර තොරතුරු හෙළිදරව් කිරීමට සහාය විය යුතු ය.

98. මහජනතාව පාලනයට සම්බන්ධ වීම හරහා තොරතුරු සඳහා මහජන ප්‍රවේශය සහ වගවීම ශක්තිමත් වේ. විෂමාචාර අනාවරණය කර වාර්තා කිරීමට ගවේෂණාත්මක මාධ්‍යවේදීන්ට නිදහස ලබා දෙන නිදහස් හා වගකීම් සහිත මාධ්‍යයක් ප්‍රධාන වේ. ශ්‍රී ලංකාව එහි ක්‍රියාකාරී මාධ්‍ය සහ විමර්ශන වාර්තාකරණ මධ්‍යස්ථානය (CIR - Center for Investigative Reporting ) වැනි ආයතනවලින් ප්‍රතිලාභ ලබයි. ජාතික ක්‍රියාකාරී දූෂණ සැලැස්මේ CIR සමඟ සහයෝගීතාව වැනි අඛණ්ඩ උත්සාහයන්, මෙම සිවිල් අවකාශයට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ.

99. දූෂණ විරෝධී ප්‍රයත්නවල නියැලීමට ඍජු මාර්ගයක් වන්නේ දූෂිත ක්‍රියාවන් වාර්තා කරන රහස් හෙළිකරන්නන් ආරක්ෂා කරන නීති රීති මගිනි. එක්සත් ජනපදයේ මෙන් ජාත්‍යන්තර අත්දැකීම් පෙන්නුම් කරන්නේ දූෂණ හෙළිදරව් කිරීම සඳහා තොරතුරු හෙළිකරන්නන් ඉතා වැදගත් බවයි. දූෂිත පුද්ගලයන් බොහෝ විට තම ක්‍රියා සඟවා නිල නිරීක්ෂකයන්ට බලපෑම් කරන නිසා පුද්ගලික තොරතුරු මූලාශ්‍ර අත්‍යවශ්‍ය වේ. තොරතුරු හෙළි කරන්නන්ට තිසි සැලකිල්ල සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා පැහැදිලි මූලධර්ම ක්‍රියාත්මක වේ.

100. ශ්‍රී ලංකාවේ දැනට රාජ්‍ය නිලධාරීන් සඳහා විශේෂිත වූ රහස් හෙළි කිරීමේ ක්‍රමයක් නොමැත. UNODC (United Nations Office on Drugs and Crime) විසින් දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (UNCAC - The United Nations Convention against Corruption) විසින් ඉල්ලා සිටින පරිදි, දූෂණ වාර්තා කරන පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා පියවර එක් කිරීමට නිර්දේශ කරන ලදී. මෙම පියවර 2015 පනත යටතේ අපරාධ වින්දිතයින් සහ සාක්ෂිකරුවන් සඳහා ආරක්ෂාව වැඩි කරයි. මෙම පනත නීතිය බලාත්මක කිරීමට වාර්තා කරන අය ආරක්ෂා කරන අතර, එය විශේෂයෙන් තොරතුරු හෙළි කරන්නන් ආවරණය නොකරයි.

101. තොරතුරු සපයන්නන්, තොරතුරු හෙළි කරන්නන් සහ සාක්ෂිකරුවන්ගේ අනන්‍යතාවය සහ ආරක්ෂාව දූෂණ විරෝධී පනත (ACA - 



Anticorruption Act) විසින් ආරක්ෂා කරන අතර, අවශ්‍ය නම් පොලිස් ආරක්ෂාව ඇතුළුව ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීමට කොමිසමට ඉඩ සලසයි. කෙසේ වෙතත්, නීතියේ රහස් හෙළිකිරීමට හානි කළ හැකි විධිවිධාන ඇත. 119 වගන්තිය දැනුවත්ව හෝ තිසි හේතුවක් නොමැතිව අසත්‍ය චෝදනා කරන අයට දඩ පැවරීමට ඉඩ සලසයි. 122 වගන්තියට අනුව දැන දැනම කොමිසමට අසත්‍ය හෝ නොමග යවන සුළු තොරතුරු ලබාදීම වරදක් වේ. මෙම කොටස පුළුල් ලෙස අර්ථ දක්වා ඇති අතර, වැරදි ක්‍රියාවක් වාර්තා කළත්, අපැහැදිලි හෝ අසම්පූර්ණ තොරතුරු සපයන අයෙකුට එරෙහිව දඩ පැවරීමට කොමිසමට ඉඩ සැලසිය හැකිය.

102. අසත්‍ය චෝදනා අපරාධ කිරීම මිනිසුන් වැරදි වාර්තා කිරීමෙන් අධෛර්යමත් කළ හැකිය, විශේෂයෙන් ඔවුන් හෙළි කිරීමට බලාපොරොත්තු වන කරුණු වැරදි දැයි ඔවුන්ට විශ්වාස නැත්නම්. අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසම (CIABOC - Commission To Investigate Allegations Of Bribery Or Corruption) විසින් OECD (Organisation for Economic Cooperation and Development) මාර්ගෝපදේශය වැනි පවතින මගපෙන්වීම් භාවිත කරමින්, තොරතුරු හෙළිකරන්නන් දිරිමත් කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා පැහැදිලි නීති නිර්මාණය කළ යුතුය. අනාගතයේදී, වැරදි වාර්තා කිරීමට පුද්ගලයන් ඉදිරිපත් වීමේ වැදගත්කම පෙන්වීමට නීතිය වෙනස් කිරීම නුවණට හුරු විය හැකි ය.

**පරිවර්තනය දෙව්මි තුම්බෝවිට**

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ කොමසාරිස්වරිය ජ්‍යෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ -ජයවර්ධන සමඟ තොරතුරු පනතේ ප්‍රායෝගික භාවිතය පිළිබඳවත්, නව ප්‍රවණතා, අභියෝග සහ තොරතුරු කොමිසමේ ක්‍රියාවලිය පිළිබඳවත් සන්නිවේදකයා කළ සාකච්ඡාව.**

# "අධි
# ප්‍ර



## ජ්‍යෂ්ඨ නීතිඥ කි

### තොරතුරු දැනගැනීමේ අයිති

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ තත්ත්වය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් පවතින රජයේ රාජ්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය මතද?**

කොහෙත්ම නැහැ. තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් පවතින රජයේ රාජ්‍ය ප්‍රතිපත්ති, දේශපාලන කැමැත්ත තිබිය යුතුය. නමුත් සෑම රටකම පාහේ තොරතුරු පනත සම්බන්ධයෙන් දක්වන දේශපාලන කැමැත්ත අඩු බවක් දකින්න පුළුවන්. මොකද කිසිම ආණ්ඩුවක් කැමති නෑ පනත නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වෙනවට. උදාහරණ විදියට ඉන්දියාවේ මැතිවරණ කාලයේ දී මැතිවරණ ක්‍රියාවලියේ විස්තර ලබා ගැනීම සඳහා පුරවැසියන් එය භාවිතා කිරීම වැළැක්වීමට රජය විසින් තොරතුරු පනත හැල්ලුවට ලක් කළා. ඒ වගේම එංගලන්තයේ හිටපු අගමැති බ්ලෙයාර් වරක් පවසා තිබෙනවා ඔහු කරපු ලොකුම වරද තොරතුරු පනත ගෙන ඒම කියලා. ඒ නිසා මම හිතන්නේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම රඳා පවතින්නේ ජනතාව තුළ ඒ පිළිබඳව පවතින උනන්දුව සහ ඔවුන්ගේ බලය පාවිච්චි කිරීම මත. උදාහරණයක් විදියට ඉන්දියාවේ තොරතුරු පනත ගෙන ඒම සම්බන්ධයෙන් වැඩිපුර උනන්දු වුණේ රාජස්ථාන් වගේ දුර පළාත්වල ජනතාව. ඒ අතර කාන්තාවන් විශේෂ වුණා. ඒත් ලංකාවේ තත්ත්වය එහෙම නෙවෙයි. තොරතුරු පනත පිළිබඳ මුලින්ම උනන්දුවක් ඇතිවුණේ කොළඹ අවට. ඒ වුණත් අපිට නිරීක්ෂණය වුණ දෙයක් තමයි පනත බලාත්මක වුණාට පස්සෙ ලංකාවේ මහජනතාව සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව ඉතා බලවත් ලෙස මේ පනත පාවිච්චි කරලා තියෙනවා. ඒ පිළිබඳව අපි සෑහෙන ආඩම්බර වෙන්න ඕන. ඇත්තටම අභියාචනාධිකරණයෙන් පැවසූ කාරණයක් තමයි මේ පනත නිසා දැන් මහජනතාවට බලය ලැබී තිබෙනවා කියලා. ඒ, ලිට්‍රෝ ගෑස් සමාගම, තමන් පනත යටතේ පොදු අධිකාරියක් නොවන බවත්, එහි ඉහළ කළමනාකාරීත්වයේ වැටුප් සහ අනෙකුත් වරප්‍රසාද පිළිබඳ තොරතුරු හෙළි කළ නොහැකි බවත් පවසමින් අභියාචනාධිකරණයට අභියාචනයක් ගොනු කළ අවස්ථාවේ දී. අධිකරණය තොරතුරු දැනගැනීමේ කොමිසන් සභාව මත පිහිටා එම තොරතුරු හෙළි කරන ලෙස ලිට්‍රෝ ගෑස් සමාගමට නියෝග කළා. මේ පනත හරහා ආණ්ඩුව සතු වූ බලය ජනතාවට ලැබිලා තියෙනවා. තොරතුරු පනතක් පවත්වාගෙන යන්නේ මහජනතාව එය භාවිත කරන ආකාරය මත. ප්‍රමාද වීම්, තර්ජන, ගැටළු ආදිය පිළිබඳව සිතිය යුත්තේ සම්පූර්ණ ක්‍රියාවලිය මත පදනම්ව මිස සිද්ධීන් එකක් දෙකක් මත පදනම්ව නෙවෙයි. ඒ නිසා ලංකාවේ පාලන ක්‍රියාවලියේ වෙනසක් බලාපොරොත්තු වෙන අය ඒ විදියට පනත පාවිච්චි කිරීම අවශ්‍යයි.

**තොරතුරු පනත ආරම්භ කර දැනට අවුරුදු 8 කට ආසන්නයි. පොදු අධිකාරීන් විසින් තොරතුරු පනත සැලකිල්ලට ගන්නවාද? එහි ඇති විධි විධාන පිළිබඳ ඔවුන්ගේ දැනුවත්භාවය කෙසේද?**

ලංකාවට මුලින්ම තොරතුරු පනත ගෙන එන විට ජනමාධ්‍ය අමාත්‍යංශයෙන් තොරතුරු නිලධාරීන්, නම් කළ නිලධාරීන් පිරිසක් මාස 03,06,08 ක් වගේ

# ි බලය තිබුණත් වේශමෙන් තමයි එය භාවිත කරන්නෙ”

## ශාලි පින්ටෝ -ජයවර්ධන

**වාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ කොමසාරිස්වරිය**

කාලයක් පුහුණු කළා. අමාත්‍යාංශයට අවශ්‍ය වුණා පනත පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමට. නමුත් දැන් ඒ තත්ත්වය වෙනස් වෙලා තියෙන්නේ. මුලදී තිබුණ උනන්දුව, ධෛර්යමත්කම දැන් මට එච්චර පේන්නෙ නැහැ. එයට හේතුව මුලදී පුහුණු කෙරූ තොරතුරු නිලධාරීන් සියල්ලන්ම පාහේ වෙනත් ස්ථාන සඳහා මාරුවීම් ලබා ගිහින්. අලුත් අය හොඳට පුහුණු කරන එක වගේම හරියට ‘තොරතුරු නිලධාරී තනතුරු’ දර එක සම්බන්ධයෙන් අමාත්‍යාංශයට තිබෙන උනන්දුව සැහෙන අඩුයි. එය දැනට 100% ක්‍රියාත්මක වන බව මට පේන්නෙ නැහැ. කොමිසම පැත්තෙන් අපට ඒකට සම්පත් නැහැ. සම්පත් තිබුණත් අපට ඒක කරන්න බැහැ. මොකද පනතෙම තියෙනවා වගකීම් දෙකට බෙදිලා. කොමිසමේ කාර්යයභාරය තමයි අභියාචනා විභාග කිරීම මෙන්ම ප්‍රතිපත්ති සම්පාදනය හා අධීක්ෂණය කිරීම කියන කාරණය.

**තොරතුරු ලබාදීම පමා වීම සම්බන්ධයෙන් ඇති පැමිණිලි පිළිබඳ ඔබේ අදහස?**

පළවෙනි අවුරුදු 5 ඇතුළත කොමිසම වෙතට නැවිත් තොරතුරු නිලධාරියා පැත්තෙන් විශාල වශයෙන් තොරතුරු නිදහස් වුණා. දැන් සැහෙන පැමිණිලි ප්‍රමාණයක් කොමිසමට එනවා. සාමාන්‍යයෙන් මාස 06, 07 ක් වගේ යනවා කොමිසමට පැමිණිලි එන්න. සමහර තොරතුරු තියෙනවා ලේසියෙන් ලබා දිය හැකි ප්‍රගාමී තොරතුරු. මේ වසරේ සිට කොමිසමෙන් ප්‍රතිපත්තියක් අරන් තියෙනවා. පැමිණිලි අහන විට ප්‍රමාදවන බව දුටුවොත් අදාළ දිනයට පෙර තොරතුරු ලබාදීමට නොහැකි වූ හේතු ඉල්ලනවා. එය නොදුන්නොත් අපි ඊට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්නා බව සුපර්වයිසින් ඔතෝරිටි එකට දන්වලා තියෙන්නේ. ඒක පනතෙහි 38වෙනි වගන්තිය යටතේ සිදු කළ හැකියි. අපි දැන් පැමිණිලි ගණනාවකම මේ ප්‍රතිපත්තිය අනුගමනය කරලා තියෙනවා. නැත්නම් මේ ප්‍රමාදය නවත්තන්න බැහැ.

**කොමිසමෙන් අභියාචනා විභාග කරන්න වැඩි කාලයක් ගත වෙනවා නේද?**

කොමිසමේ කාර්ය මණ්ඩලය නිලධාරීන් 29යි. ඒ අයගෙන් නව දෙනෙක් හෝ එකොලොස්දෙනෙක් තමයි අපට ඉන්නෙ. නීති අංශවල ඉන්නේ එක නීති නිලධාරියෙක් විතරයි. ඊට අමතරව සහකාර නීති නිලධාරීන් දෙන්නෙක් තුන්දෙනෙක් විතර ඉන්නවා. අපිට අභියාචනා එනවා සැහෙන ප්‍රමාණයක්. අපි දවස් තුනකට අභියාචනා විසිපහක් තිහක් පමණ අහනවා. සතියකට 70-75 පමණ අභියාචනා අහනවා. මාසයක් ඇතුළත කොමිසම තීන්දු දෙන්න අවශ්‍යයි කියලා පනතෙහි සදහන් වුණත් එය ප්‍රායෝගිකව කරන්න බැහැ. නීති අංශයට තව නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය බව අපි ආණ්ඩුවටත් දැන්වූවා. අනිත් කොමිසම් වගේ නෙවෙයි මේ කොමිසමේ කොමසාරිස්වරු පස් දෙනාම එකට තමයි හැම නඩුවක්ම හැම කේස් එකක්ම අහන්නේ. ඒ නිසා මාසයක් හෝ දෙකක් වගේ කාල සීමාව තුළ අවසන් කරන්න අමාරුයි. පළවෙනි කොමිසමේ මාස 06, 08ක් වගේ ප්‍රමාද වුණා. දැන් මාස 03, 04ක් වගේ ඇතුළත රුටීන් කේසස් වගේ ඒවා අවසන් කරනවා. සමහර සංකීර්ණ නීතිමය ගැටලු හෝ බරපතළ කේසස් එනකොට නීතිපතිතුමාගේ නිලධාරීන් සම්බන්ධ වෙනවා. නැත්නම් පොදු අධිකාරීන්ගේ නීතිඥයින් සම්බන්ධ වෙනවා. ගොඩක් ජ්‍යෙෂ්ඨ නීතිඥයින් එනවා කොමිසම ඉස්සරහට. ඒ වගේ දේවල් නිසා සමහරවිට අවුරුද්දක් පවා කල් යනවා. වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ අගමැති වෙලා

ඉන්න කාලේ ඔහුගේ වත්කම් බැරකම් ප්‍රකාශ නිකුත් කරන ලෙසට ඒ දිනවල නියෝගයක් ලැබුණා. ඒකට වසර එකහමාරක් විතර ගත වුණා. නීතිය පිළිබඳ සංකීර්ණ ගැටලු ඇතුළත් වන අවස්ථාවල දී මෙම ප්‍රමාදයන් සිදු වෙනවා.

**ඔබ දැක්වූ අදහස්වලට අනුව පනත ගෙන ආව මුල් කාලයට වඩා දැන් එන පැමිණිලි ප්‍රමාණය වැඩියි නේද?**

ඔව්. 2023 දී සැහෙන වැඩි වුණා. මොකද පළවෙනි අවුරුදුවලට සාපේක්ෂව තොරතුරු නිලධාරීන්ගේ ලෙවල් එකෙන් තොරතුරු නිදහස් වෙනවා කියලා දැන් අපට පේන්නෙ නැහැ. ඒ නිසා කොමිසමට කේසස් එනවා. නමුත් ඇත්තටම ඉස්සරහට ඒ දේ නිසාම මිනිස්සු අතර ප්‍රශ්නයක් එන්න පුළුවන්, ඉක්මනට ගන්න පුළුවන් තොරතුරුවලට ඇයි මේ කාලෙ නාස්ති කරන්නෙ කියලා. ඒ නිසා මේ අවුරුද්දෙ ඉඳන් ඒ ගැන තදින් සළකලා බලන්න කොමිසම තීරණය කරලා තියෙනවා.

**පුරවැසියෙක් තොරතුරු ඉල්ලීම කරනු ලබන අවස්ථාවේ දී අදාළ තැනැත්තාගේ අනන්‍යතාවය පැහැදිලි කළ යුතුද? ඒ හරහා තොරතුරු ලබා ගන්නා පුද්ගලයාට වක්‍රාකාරව බලපෑම් එල්ල වී ඇති අවස්ථා තිබෙනවාද?**

සාමාන්‍යයෙන් තොරතුරු ඉල්ලනකොට RTI 01 ෆෝරමය තමයි පාවිච්චි කරන්නේ. ඒකෙ තියෙනවා පුරවැසියෙක් ද, නැද්ද කියලා පුරවන්න. ඒකට ප්‍රතිචාර දක්වන්න ඕන ඔව්ද නැද්ද කියලා විතරයි. ඔව් කියලා තිබිලා පොදු අධිකාරීන්ට ඒ ගැන සැකයක් තියෙනව නම් විතරයි තවත් තොරතුරු ඉල්ලන්න පුළුවන්. ඒ වගේ තීන්දු දෙක තුනක් අපි දීලා තියෙනවා. දිලපමුත්තම් සාමි ඔහු උතුරේ මාධ්‍යවේදියෙක්. තොරතුරු ඉල්ලනකොට හමුදාවෙන් ඔහුගේ හැඳුනුම්පත ඉල්ලුවාම ඔහු අහලා තියෙනවා "ඇයි මම මගෙ හැඳුනුම්පත පෙන්නන්නෙ මම පුරවැසියෙක් කියලා කියලා තියෙද්දී" කියලා. ඊටපස්සෙ අපි තීන්දුවක් දුන්නා. ඔහු ප්‍රසිද්ධ මාධ්‍යවේදියෙක්. ගොඩක් අය ඔහුව දන්නවා අනික ඔහු ලංකාවෙ ඉන්නේ. ඒ අවස්ථාවල ඔහුව අත්අඩංගුවට ගන්න ඔහොම ඉල්ලනවනම් ඒ සඳහා පොදු අධිකාරීන්ට බලයක් නැහැ. ඒත් පිටරට ඉන්න කෙනෙක් තොරතුරු ඉල්ලීමක් කරන විට ඒ කෙනා පුරවැසියෙක් ද නැද්ද කියලා හොයාගන්න පොදු අධිකාරීන්ට බලයක් තියෙනවා. පිටරටින් පර්යේෂණ සඳහා තොරතුරු ලබාගන්න ඊමේල්, තොරතුරු ඉල්ලීම් එවනවිට ඔබ පුරවැසියෙක් ද කියලා අනන්‍යතාවය පැහැදිලි කරගන්න ප්‍රශ්න අහනවා. ප්‍රශ්නයක් මතුවෙන අවස්ථාවලදී පමණයි අනන්‍යතාවය හොයා බලන්නෙ. ඒ වගේම පනතේ සෘජුව දක්වලා තියෙනවා තොරතුරු ඉල්ලීම් කරලා තියෙද්දී ඒ පුද්ගලයාගෙන් හේතු අහන්න බැරි බව.

**පනතට අනුව දින 14ත් 21ක් දක්වා වූ කාලය තුළ ඉල්ලුම්කරුවන්ට තොරතුරු ලබාදිය යුතුයි. ඉල්ලුම්කරුවන්ට තොරතුරු ලබා නොදී මාස ගණන් ගතවන ඇතැම් අවස්ථා දකින්නට තිබෙනවා. පොදු අධිකාරීන් විසින් විවිධ හේතු ඉදිරිපත් කරනවා. මේ කාලසීමාව තුළ ඇතැම් තොරතුරු සීමා කිරීමකට ලක්වන්නට පුළුවන් නේද?**

ඔව්. අපි පොදු අධිකාරීන්ට දැඩිව අවවාද කරලා තියෙන්නේ ඒ පිළිබඳව. අපිට ඒ ප්‍රමාදයට හේතු දක්වන්න කියලා තියෙනවා වාචිකව වගේම ලිඛිතවත්. නිලධාරීන් හිතාමතාම තොරතුරු ප්‍රමාද කරනවා අපිට නිරීක්ෂණය වුණොත් ඔවුන්ගේ සේවා වාර්තාවලට (service record) බලපාන විදියට ක්‍රියා කරන්න පුළුවන්. පනතේ සඳහන් වෙන බලවත්ම දේ තමයි කොමිසමේ තීරණයට අවනත නොවන පුද්ගලයන්ව උසාවි ගෙන යාමට පුළුවන් වීම. නමුත් අපි බලය තිබුණත් ප්‍රවේශමෙන් තමයි එය භාවිතා කරන්නේ. එම නිසා අපි පොදු අධිකාරීන්ව දැනුවත් කරනවා මේ නීතිවලට අවනත වීම හා එම නීති පිළිනොපැද්දොත් හමුවන විපාක සම්බන්ධයෙන්. මේ බලය නොතිබුණානම් පනත ඉතාමත් දුර්වල පනතක් වෙනවා. නේපාලය, බංග්ලාදේශය වගේ පනතට බය නොවන රාජ්‍ය සේවයක් තමයි එතකොට බිහිවෙන්නේ.

**පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම්, වත්කම් බැරකම් ප්‍රකාශන ලබා ගැනීමට සහ ඒවා ප්‍රසිද්ධ කිරීමට මේ පනත ප්‍රායෝගිකව භාවිත කරන්න පුළුවන් නේද?**

ඔව්. එහෙම අවස්ථා තියෙනවා. 2021 දී විතර රුබතීසන් කියලා මාධ්‍යවේදියෙක් පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම්, අපරාධ වාර්තා පිළිබඳ තොරතුරු ඉල්ලීමක් ගොනු කළා. නමුත් පාර්ලිමේන්තුව පැවසුවේ ඒවා පුද්ගලික කාරණා නිසා තොරතුරු හෙළි කිරීමට නොහැකි බව. ඔවුන් මතු කරන ලද අනිත් කරුණ වූයේ එම තොරතුරු ඔවුන් සතුව නොමැති බවයි. එනම් ව්‍යවස්ථාවෙන් හෝ පාර්ලිමේන්තු පනතකින් හෝ මැති ඇමතිවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම්

## වත්කම් බැරකම් සම්බන්ධව නඩු දෙකක් තිබෙනවා එකක් රනිල් වික්‍රමසිංහ මහතාගේ අනෙක චාමර සම්පත් නම් මාධ්‍යවේදියා ගොනු කරන ලද නඩුව

ආදි තොරතුරු ගැනීමට ඔවුන්ට අයිතියක් නැති බව. ඊට විරුද්ධව කොමිසමට පැමිණි විට අප තීන්දුව දෙනු ලැබුවේ ඒවා කොහෙත්ම පුද්ගලික කරුණු නොවන බවයි. පාර්ලිමේන්තුවේ එසේ වුණත් එම තොරතුරු සන්තකයේ තබා ගන්න නීතියක් නැති බව අපි පිළිගත්තා. පසුව කොමිසම මඟින් පාර්ලිමේන්තු නියෝජිතයින්ට තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලීමක් කළත් එයට අවනත වුණේ කිහිප දෙනෙක් පමණයි. වත්කම් බැරකම් සම්බන්ධව නඩු දෙකක් තිබෙනවා. එකක් රනිල් වික්‍රමසිංහ මහතාගේ. අනෙක චාමර සම්පත් නම් මාධ්‍යවේදියා ගොනු කරන ලද නඩුව. පාර්ලිමේන්තු නියෝජිතයන් කී දෙනෙක් කථානායකවරයාට වත්කම් බැරකම් භාරදුන්නද නැද්ද යන්න පිළිබඳව ලැයිස්තුවක් ලබා දෙන ලෙසට. එතකොට හිටපු කථානායක කරූ ජයසූරිය මහතා එකඟ වුණාට පාර්ලිමේන්තුවේ මහලේකම් කිව්වා මේවා පුද්ගලික කරුණු නිසා දෙන්න බෑ කියලා. එම තොරතුරු ප්‍රසිද්ධියට පත් නොකර සිටීමට අවකාශය හිමිවන පාර්ලිමේන්තු වරප්‍රසාදයත් වත්කම් බැරකම් ප්‍රකාශ පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධියේ නිකුත් කිරීම වැළැක්වූ 1970 වර්ෂයේ වත්කම් බැරකම් නීතියටත් වඩා තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීතිය (2016) ප්‍රමුඛ වන බව පාර්ලිමේන්තුවේ ස්ථාවරය වුණා. මේ පිළිබඳ අභියාචනා කොමිසමට ආවට පස්සේ එය අපට පිළිගැනීමට නොහැකි බවත් ඔවුන් නීතියට අනුව වැඩ කරන බව දැනගැනීමට ජනතාවට අයිතියක් ඇති බවත් පවසා පිටු 25ක තීන්දුවක් ලබා දීමට අපි කටයුතු කළා. 2023 වර්ෂයේදී අභියාචනාධිකරණය තීන්දුවක් දුන්නා කොමිසමේ තීරණයට එකඟ වෙලා මේ තොරතුරු නිදහස් කරන ලෙසට. පාර්ලිමේන්තුව එය පිළිගෙන එම තොරතුරු නිදහස් කළා.

**ව්‍යතිරේක මත පදනම් වෙලා තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරන අවස්ථා තිබෙන බවට අදහසක් තිබෙනවා. ඒ ගැන ඔබේ මතය?**

ගොඩක්ම තොරතුරු ප්‍රතික්ෂේප කරන්නෙ පුද්ගලික තොරතුරු ලෙස. අනිත් එක තුන්වන පාර්ශවයේ තොරතුරු ඉල්ලනවා කියලා. අපි සෑහෙන තදින් කියලා තියෙන්නෙ පුද්ගලික කාරණා කියලා හැම එකකටම යොදාගන්න බැහැ, ප්‍රවේශමෙන් ඒක භාවිත කළ යුතුයි කියලා. ඒ වගේම මහජන සුබසිද්ධිය සම්බන්ධ ඒවා අනිවාර්යයෙන්ම සළකා බැලිය යුතුයි කියලා. 29 වෙනි වගන්තියේ තියෙන්නෙ තුන්වෙනි පාර්ශවයක් විසින් රහසිගත තොරතුරු පොදු අධිකාරියකට දෙන්නේ නම් එම තොරතුරු නිදහස් කරන්න තුන්වෙනි පාර්ශවයෙන් පොදු අධිකාරියට අවසර ඉල්ලන්න පුළුවන්. සතියක් ඇතුළත එයට ප්‍රතිචාර නොදැක්වුවහොත් එම තොරතුරු නිදහස් කළ යුතුයි. ප්‍රතිචාර දක්වලා තොරතුරු ලබා දීමට නොහැකි බව පැවසුවහොත් මහජන සුබසිද්ධිය වෙනුවෙන් එම තොරතුරු නිදහස් කිරීමට කොමිසමට බලය තිබෙනවා. ඇත්තටම තොරතුරු පනත තොරතුරු ඉල්ලන එක විතරක් නෙවෙයි ජනතාව තම බලය භාවිත කිරීම අතිනුත් වැදගත්.

**හිරු මාධ්‍ය ආයතනය මහජන අධිකාරියක් බවට තීන්දුවක් ලබා දී තිබුණා මෑතක. ඒක අපට දේශපාලන පක්ෂවලටත් අදාළ කරගන්න හැකියාවක් නැද්ද?**

තාම අපට දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් එවැනි තොරතුරු ඉල්ලීමක් ලැබිලා නැහැ. ඒ නිසා එන්න කලින් ඒ සම්බන්ධයෙන් ඇති නීතිමය කාරණා පිළිබඳ කතා කරන එක පොඩි ප්‍රශ්නයක්. නමුත් පනතේ අරමුණ තමයි වඩා පුළුල් ලෙස පොදු අධිකාරීන්ට භාවිත කිරීම යන කාරණය. කොමිසමත් බලන්නෙ ඒ විදියට. මාස කීපයකට කලින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය තොරතුරු දැනගැනීමේ පනතට අයත් පොදු අධිකාරියක් බවත් පුරවැසියන්ට නීතිඥ සංගමයෙන් තොරතුරු ඇසිය හැකි බවටත් කොමිසම තීරණය කළා. විශේෂයෙන්ම ට්‍රාන්ස්පේරන්සි කියන එක ආණ්ඩුව වගේම අනෙකුත් පෞද්ගලික සංවිධානවලටත් පොදුයි. එම නිසා පෞද්ගලික ආයතනවලටත් පනත ඇතුළත් කිරීම අවශ්‍යයි.

**තොරතුරු පනත පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සමඟ ගැටෙන අවස්ථා තිබෙනවා නේද?**

ඔව්. IMF එකෙනුත් ගිය වසරේ (2023) ලංකාව සම්බන්ධයෙන් නිකුත් කරපු Governance Diagnostic වාර්තාවේ පවසා තිබුණා තොරතුරු දැනගැනීමේ කොමිසන් සභාවේ කටයුතු ලංකාවේ යහ පාලනය වැඩි දියුණු කරන්නට විනිවිදභාවය ඇති කිරීමට හොඳම උදාහරණයක් බව. තොරතුරු දැනගැනීමේ පනත සහ තොරතුරු දැනගැනීමේ කොමිසන් සභාවේ වැඩකටයුතුවලට හානි නොවන නව පනත් ගෙන ඒම හෝ තිබෙන පනත් (උදාහරණයක් ලෙස පෞද්ගලික ආරක්ෂණ පනත) ක්‍රියාත්මක කිරීමට වග බලා ගන්නා ලෙස IMF පවසා තිබුණා. උදාහරණයක් ගත්තොත් පෞද්ගලික ආරක්ෂණ පනතට අනුව නමක් යනු පුද්ගලික දත්තයක්. ප්‍රශ්නය වන්නේ තොරතුරු කොමිසන් සභා තීරණවල දූෂණ ආදියට අදාළ පුද්ගලයන්ගේ නම් ප්‍රකාශ කර තිබීමයි. ඒ නිසා කොමිසම ඉදිරියට ගිය ආකාරය වෙනස්. නමුත් මේ පනත් දෙකම හානි නොවන විදියට යොදාගැනීම අවශ්‍යයි. එමනිසා මෙම පනත් දෙකම සමබරව තබාගෙන කටයුතු කිරීම අත්‍යවශ්‍ය කරුණක්.

**සාකච්ඡා කළේ නිසංසලා අබේගුණසේකර**

# රාජ්‍ය ආයතනවල ප්‍රගාමී තොරතුරු මන්දගාමී



මහජන අධිකාරි භාරයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීම 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ ලාංකේය පුරවැසියන්ගේ ව්‍යවස්ථාපිත අයිතිවාසිකමක් බවට පත් විය. මේ අයිතිය සාක්ෂාත් කර දීමේ වගකීම රජයට සමස්තයක් වශයෙනුත් 2016 අංක 12 දරන තොරතුරු අයිතිවාසිකම පිළිබඳ පනත (RTI) මගින් නිර්ණය කර ඇති පොදු අධිකාරිවලට සුවිශේෂ වශයෙනුත් පැවරේ. තොරතුරු අයිතියේ නීත්‍යානුකූල හිමිකරුවන් වන පුරවැසියන්ට එම අයිතිය බාධාවකින් තොරව භුක්ති විඳ ගැනීමට ඉඩ සැලසීමට එකී ආයතන සියල්ල නීතියෙන්ම බැඳී සිටී. පොදු අධිකාරි සන්තකව පවත්වා ගෙන යන තොරතුරුවලට ප්‍රවේශ වීම දෙයාකාරයකට කළ හැකි ය. ඉන් එක් ක්‍රමයක් වන්නේ තමන්ට අවශ්‍ය කරන තොරතුරු මොනවා දැයි නිශ්චිතව සඳහන් කරමින් පුරවැසියෙකු විසින් පොදු අධිකාරියකට යොමු කරනු ලබන අයදුම්පතකට පිළිතුරු ලෙස තොරතුරු ලබා ගැනීමයි. දෙවැනි ක්‍රමය වන්නේ එවැනි විශේෂ ඉල්ලීමක් නොලැබුණ ද පොදු අධිකාරියක් සිය කැමැත්තෙන්ම තමන් සතු පළ කළ හැකි හැම තොරතුරක්ම ප්‍රගාමී ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කිරීම මගින් තොරතුරු ලබා ගැනීමයි. පළමු ක්‍රමය ප්‍රතික්‍රියක අනාවරණය (Reactive Disclosure) ලෙස ද පොදු අධිකාරියක් සිය කැමැත්තෙන් කල් තියා ම තොරතුරු ප්‍රසිද්ධ කිරීම ප්‍රගාමී අනාවරණය (Proactive Disclosure) ලෙස ද හැඳින්විය හැකි ය.

ප්‍රගාමී අනාවරණය යනුවෙන් හඳුන්වන්නේ අයදුම්පත්වලට අනුව ඉල්ලුම් කරන පුරවැසියන්ට පමණක් මදින් මද තොරතුරු ලබා දීමකට සීමා නොවී විවෘතව මහජනතාවට ප්‍රසිද්ධියේ දැන ගැනීමට සැලැස්වීම පිණිස සැම පොදු අධිකාරියක් ම තමන් සතු සියලු තොරතුරු ප්‍රගාමී ලෙස ප්‍රකාශයට පත් කිරීමයි.


ප්‍රගාමී තොරතුරු යනු, පාරිභෝගිකයන්ට සහ සමාජයට සත්‍යාපන සහ නිවැරදි තොරතුරු ලබා දීමට නිර්මාණය කරන ලද තොරතුරු ප්‍රකාශනයක් වේ. රාජ්‍ය වෙබ් අඩවි, නීතිමය වාර්තා, නිල පුවත්, සහ විවිධ සේවා පිළිබඳ තොරතුරු මෙම කාණ්ඩයට අයත් වේ. මේ තොරතුරු, පරිශීලකයන්ට රාජ්‍ය සේවාවන්, නීති සම්මතයන් සහ වෙනත් විශේෂිත කරුණු සොයාගැනීමට සහ පහසුකම් ලබා ගැනීමට උපකාරී වේ.

ප්‍රගාමී තොරතුරු සහ පරිශීලක අත්දැකීම් එකට එකතු වීමෙන්, වෙබ් අඩවි භාවිත කිරීමේ හැකියාවන් වඩාත් කාර්යක්ෂම හා සත්‍යාපන ලෙස සැලැකිය හැකි ය. වෙබ් අඩවිවල නිවැරදි තොරතුරු සහ පරිශීලක අත්දැකීම්, පාරිභෝගිකයන්ට හොඳම සේවාවන් ලබා දීමට උපකාරී වේ.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන තමන්ගේ කාර්යභාරය පවත්වාගෙන යාමේදී මහජනතාව සමඟ අන්තර්ක්‍රියාකාරීව සම්බන්ධවීමේ මූලික මෙවලමක් ලෙස වෙබ් අඩවි භාවිත කරයි. විධායක

හා පාලන ආයතන, අධ්‍යාපන ආයතන, සෞඛ්‍ය සේවා ආයතන සහ තවත් රාජ්‍ය ආයතන තමන්ගේ සේවා හා ක්‍රියාවලි පාරිභෝගිකයන්ට පැහැදිලිව සහ සවිස්තරව පෙන්වමින්, එම සේවාවන්ට ප්‍රවේශවීම පහසු කරයි. **රාජ්‍ය වෙබ් අඩවි, පරිශීලකයන්ට සහ සමාජයට රාජ්‍ය සේවා, තොරතුරු සහ විවිධ ප්‍රාථමික පහසුකම් සපයන සාර්ථක මාධ්‍යයන් ලෙස කටයුතු කරයි. මේ වෙබ් අඩවි, රජයේ ආයතන සහ සේවා පිළිබඳ තොරතුරු සපයන අතර, පාරිභෝගිකයන්ට අයදුම්පත්, බලපත්‍ර සහ විශේෂ සේවා සඳහා අයදුම් කිරීමේ පහසුකම් ලබා දේ. මෙම වෙබ් අඩවි, පාරිභෝගිකයන්ට සහ සමාජයට වඩාත් වැදගත් තොරතුරු සැපයීමේ කාර්යභාරයක් සඳහා සකස් කර ඇති අතර, ඒවා ඔන්ලයින් අයදුම්පත්‍ර, නිල පුවත්, නීති සම්මතයන් සහ ආයතනික වාර්තා සඳහා ප්‍රවේශය සැපයෙයි. මේ තොරතුරු මඟින්, පාරිභෝගිකයන්ට සහ සමාජ ප්‍රජාවට විශේෂිත සේවා සඳහා අවශ්‍යතාවය වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට උපකාරී වේ. රාජ්‍ය වෙබ් අඩවි භාවිතයේ පරිශීලක අත්දැකීම් සහ තාක්ෂණික අභියෝග මත පදනම්ව, අනාගත සංවර්ධන සඳහා නව්‍යතා සහ තාක්ෂණික යාවත්කාලීන කිරීම් මත අවශ්‍යතා පවතී.**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය වෙබ් අඩවි, පාරිභෝගිකයන්ට සහ සමාජයට විශේෂිත තොරතුරු හා සේවා සපයන අරමුණින් සකස් කර ඇත. මෙම වෙබ් අඩවිවල තිබෙන ප්‍රධාන තොරතුරු විශේෂාංග පහත පරිදි වේ.




■ නීති සම්මතයන් සහ නීතිමය වාර්තා

රාජ්‍ය වෙබ් අඩවි, නීති සම්මතයන්, පනත් සහ නීතිමය වාර්තා සඳහා ප්‍රවේශයක් සපයයි. මෙවැනි තොරතුරු, පාරිභෝගිකයන්ට නීතිමය සම්බන්ධීකරණ සඳහා සහ වාසි ලබා ගැනීමට උපකාරී වේ.

■ සේවා සඳහා ඔන්ලයින් අයදුම්පත්

ඔන්ලයින් අයදුම්පත්‍ර, බලපත්‍ර ලබා ගැනීමේ පහසුකම් සහ විවිධ රාජ්‍ය සේවා සඳහා අයදුම් කිරීමේ හැකියාව, පාරිභෝගිකයන්ට කාලය ඉතිරි කිරීම සහ කාර්යක්ෂම සේවා ලබා ගැනීමට මඟ පෙන්වයි.

■ නිල පුවත් සහ යාවත්කාලීන තොරතුරු

වාර්ෂික වාර්තා, නිල පුවත්, සහ අනෙකුත් යාවත්කාලීන තොරතුරු, පාරිභෝගිකයන්ට සහ සමාජයට නවතම තොරතුරු ලබා දීමට නිර්මාණය කර ඇත.

■ සමාජ සේවා සහ උපකාරී තොරතුරු

රාජ්‍ය වෙබ් අඩවි, සමාජ සේවා සහ මූල්‍ය සහාය පිළිබඳව පරිශීලකයින්ට මාර්ගෙ ්පදේශයන් සහ ආධාරක තොරතුරු ලබා දේ.

මෙම තොරතුරු විශේෂාංග, ශ්‍රී ලංකාවේ රාජ්‍ය වෙබ් අඩවි පාරිභෝගිකයන්ට සහ සමාජයට වඩාත් පහසු සහ වටිනා සේවාවන් ලබා දීම සඳහා අත්‍යවශ්‍ය වේ.

මෙම ලිපියෙන් ප්‍රගාමී තොරතුරු ඇතුළත් කර ඇති ශ්‍රී ලංකාවේ රාජ්‍ය වෙබ් අඩවි කිහිපයක් නිරීක්ෂණය කරන ලද අතර ඒ අනුව බලශක්ති අමාත්‍යාංශයේ RTIC පිටුව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ සවිස්තරාත්මක සහ ප්‍රවේශ විය හැකි තොරතුරු සැපයීම කෙරෙහි අවධානය යොමු කරයි. පිටුවෙහි අමාත්‍යාංශයේ වගකීම්, ආයතනික ව්‍යුහය සහ වාර්ෂික වාර්තා සහ කාර්ය සාධන වාර්තා වැනි මෙහෙයුම් තොරතුරු පිළිබඳ විස්තර ඇතුළත් වේ. එය අදාළ රෙගුලාසි, RTI චක්‍රලේඛ සහ රජයේ ප්‍රතිපත්ති මාර්ගෙ ්පදේශ ද ලැයිස්තුගත කරයි. පිටුව නිර්මාණය කර ඇත්තේ විනිවිදභාවය සහතික කිරීම, තොරතුරු සඳහා මහජන ප්‍රවේශය පහසු කිරීම සහ RTI නිලධාරීන් සඳහා පැහැදිලි සම්බන්ධතා තොරතුරු ලබා දීම සඳහා ය. මීට අමතරව, එය අදාළ ආයතන සහ අත්‍යවශ්‍ය ලේඛන වෙත ඉක්මන් සබැඳියක් දක්වයි. පරිශීලකයින්ට අදාළ තොරතුරු කාර්යක්ෂමව සොයා ගැනීමට සහ තේරුම් ගැනීමට හැකි බව එමගින් සහතික කරයි.


ජනාධිපති කාර්යාලයේ ප්‍රගාමී තොරතුරු පිටුව, මහජනතාවට තොරතුරු සෙවීමේ පහසුකමක් ලෙස ගෙන එන අත්දැකීමක් වේ. මෙහි නිල සහ සත්‍යාපන තොරතුරු, නිලධාරීන්ගේ විස්තර, සහ අයදුම් කිරීමේ ක්‍රම පිළිබඳ විස්තර පවතින

අතර සෙවීමේ පද්ධතියක් සහ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ හැකියාවන් සපයයි. එහි පරිශීලක අතුරුමුහුණත් (User Interfaces) පහසුකම් ඇතත්, යාවත්කාලීන නොවීමේ අඩුපාඩු පවතින බව දක්නට ඇත.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවියේ, පාර්ලිමේන්තුවේ වගකීම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු සපයයි. මෙහි අන්තර්ගත කර ඇති තොරතුරු නිල සහ සත්‍යාපන සහිතයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විස්තර, කමිටු වාර්තා, නීති පනත් කෙටුම්පත් සහ පාර්ලිමේන්තු සැසි සටහන් ආදිය පිළිබඳ තොරතුරු පහසුවෙන් සොයාගත හැකි ය. අන්තර් මුහුණත සරල හා පරිශීලකයා සඳහා පහසුකම් සපයන ආකාරයෙන් සැකසී ඇත. යාවත්කාලීන නොවීමේ අඩුපාඩුවලින් සමන්විත වුවද, පාරිභෝගික අත්දැකීම් සඳහා මනා පහසුවක් ලබා දේ.

**ශ්‍රී ලංකා රේගුව නිල වෙබ් අඩවියේ, භාණ්ඩ ආනයන සහ අපනයන පිළිබඳ නීතිමය උපදෙස්, ප්‍රතිපත්ති, සහ පරිශීලක මාර්ගෝපදේශයන් අඩංගු වේ. පාරිභෝගිකයින්ට සහ ව්‍යාපාරිකයින්ට අවශ්‍ය නිවැරදි තොරතුරු ලබා දීම, සේවා ඉල්ලීම්, අයදුම්පත්, සහ විශේෂාංග පිළිබඳ තොරතුරු පහසුවෙන් සොයා ගැනීම සඳහා පහසුකම් සපයයි. ආයතනයේ නීතිමය හා පාලන නීති තොරතුරු ලබා ගැනීමට මෙම වෙබ් අඩවිය වැදගත් වේ.**

ගලිගමුව ප්‍රාදේශීය සභාවේ නිල වෙබ් අඩවිය, ප්‍රාදේශීය සභාවේ සේවාවන්, විශේෂාංග සහ ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු සපයයි. මෙම පිටුව, ප්‍රාදේශීය




**මූලාශ්‍රය - වෙරිටේ රිසර්ච්**

සභාවේ ව්‍යාපෘති, සභාපති විස්තර සහ ප්‍රාදේශීය මට්ටමේ සම්බන්ධ කටයුතු පිළිබඳ විශේෂාංග, වාර්තා සහ තොරතුරු ලබා දේ. වෙබ් අඩවිය, ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යයන්, පද්ධති සහ නිවේදන සොයා ගැනීම සඳහා පහසුකම් සපයයි. මෙම පිටුව, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරුන්ගේ තොරතුරු සහ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබා දී ඇත, ප්‍රාදේශීය මට්ටමේ ජනතාවට නිවැරදි සහ සවිස්තරාත්මක තොරතුරු ලබා දෙයි.

බස්නාහිර පළාත් සභාවේ නිල වෙබ් අඩවිය, පළාත් සභාවේ වාර්තා, සේවා, සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා දෙයි. අඩවියේ ඇති විශේෂාංග අතර, පළාත් සභාවේ නීතිමය, පාලන, සහ කළමනාකරණ කටයුතු පිළිබඳ යාවත්කාලීන තොරතුරු, වාර්තා, සහ නිවේදන අඩංගු වේ. මෙම පිටුව, පළාත් සභාවේ සේවා, ව්‍යාපෘති සහ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු පිළිබඳ විශේෂාංග හා මාර්ගෝපදේශයන් සොයා ගැනීමට සහ නවතම තොරතුරු ලබා ගැනීමට පහසුකම් සපයයි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය වෙබ් අඩවි, තොරතුරු සැපයීමේ සහ පරිශීලක අත්දැකීම් මෙරට සංවර්ධනයේ දී මූලික සාධකයන් ලෙස සලකනවා. මේ වෙබ් අඩවිවල තොරතුරු යාවත්කාලීන කිරීම සහ නිවැරදිභාවය පිළිබඳව පරීක්ෂාවන් මගින්, විශේෂිත තොරතුරු ඉදිරිපත් කිරීමේ වගකීම ඇත. නමුත්, විශේෂයෙන්, සාමාන්‍ය අවශ්‍යතා පිළිබඳව අඩුපාඩු පවතිනවා. බොහෝ වෙබ් අඩවි ප්‍රගාමී තොරතුරු නමින් වෙන්කොට ඉදිරිපත් කර නැති අතර තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් RTI චක්‍රලේඛ සහ රජයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ දක්වා නොමැත. තව ද තොරතුරු ප්‍රේරණයේ කාර්යක්ෂමතාව, තොරතුරු නිවැරදිව සපයන ලෙසින් හැසිරවීමේදී ඇති අභියෝග සහ තාක්ෂණික ගැටළු පැහැදිලිව පෙනේ. සමස්තයක් වශයෙන්, මෙම වෙබ් අඩවිවල අන්තර්ගතය සහ පරිශීලක අත්දැකීම් අනාගතයේ වඩාත් කාර්යක්ෂම රාජ්‍ය වෙබ් අඩවි නිර්මාණය සඳහා නිර්දේශ සපයයි.

**සටහන දිමුතු ජිනසේන**

# තරිඳු තොරතුරු පනතින් වැඩ ගත් හැටි

**තොරතුරු දැනගැනීම ලාංකිකයින්ගේ අයිතිවාසිකමක් බවට පත් වන්නේ 2016 වර්ෂයේ පටන් ය. එතැන් පටන් සිය ජනමාධ්‍ය භූමිකාව සඳහා තොරතුරු පනත භාවිත කරමින් 6000ක් පමණ ඉල්ලුම්පත් යොමු කරමින් සිද්ධි ගණනාවක් පිළිබඳව සත්‍ය හා නිවැරදි තොරතුරු ලබා ගනිමින් විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් තොරතුරු විශ්ලේෂණය කරමින් අනාවරණය කිරීම් කළ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ගවේෂණාත්මක මාධ්‍යවේදියකු, පර්යේෂකයකු මෙන්ම සමාජ ක්‍රියාකාරිකයකු ලෙස තරිඳු ඉරංග ජයවර්ධන හැඳින්විය හැකි ය.**


පාසල් අවධියේ පටන් විප්ලවවාදී අදහස් දැරූ තරිඳු පහළයාගොඩ ශ්‍රී ස්වර්ණපාලි මහා විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය හා ගනේමුල්ල ගලහිටියාව මධ්‍ය විද්‍යාලයෙන් ද්විතීයක අධ්‍යාපනයත් ලබා ගනී. පාසලේ ශිෂ්‍ය නායකයකුව සිටියදී තම පාසලේ විදුහල්පතිගේ අක්‍රමිකතා බලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට ඔහු කටයුතු කළේ ය. ලංකා ගුරු සංගමයේ සභාපති ජෝශප් ස්ටාලින්, මානව හිමිකම් කොමිසම, සිරස ටීවී විමර්ශන වැඩසටහන ආදිය සමඟ එක්ව විදුහල්පතිට විරුද්ධව නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඔහු කටයුතු කළේ ය. මෙම සිදුවීම් හරහා විවිධ ක්ෂේත්‍රයන්හි පුද්ගලයන් හමුවීම, තමන් ඇතුළු කණ්ඩායම විසින් ලබාදෙන තොරතුරු පදනම් කරගනිමින් එකල මාධ්‍යවේදීන් සිදු කළ වාර්තාකරණයන් දැකීමත් නිසා මාධ්‍ය වෘත්තියට පිවිසීමට තරිඳුට උවමනාව සහ ආශාව ඇති විය. උසස් පෙළ විභාගයට කලා විෂය ධාරවෙන් පෙනී සිටීමෙන් අනතුරුව 2011 වර්ෂයේදී පමණ ලංකාදීප පුවත්පතෙන් තරිඳු මාධ්‍ය වෘත්තිය ආරම්භ කළේ ය.




මාධ්‍ය වෘත්තියේ ආරම්භයේ සිටම ඔහු මානව හිමිකම් සම්බන්ධවත්, විවිධ දූෂණ, වංචා හා අක්‍රමිකතා පිළිබඳවත්, ස්වභාවධර්මය පිළිබඳවත් ගවේෂණාත්මක ලිපි රචනා කරමින් පුරවැසියන් වෙනුවෙන් පෙනී සිටියේ ය. මෙම වකවානුවේදී මෙරට තුළ තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක නොවුණත් ඔහු තම ලිපි සඳහා විවිධ මූලාශ්‍ර සහ උපක්‍රම භාවිත කරයි. ඒ සත්‍ය සහ නිවැරදි පුවත් ජනතාව වෙත රැගෙන යාමටයි. රාජ්‍ය නිලධාරියාගේ පටන් සැකකරුවා දක්වා විවිධ තරාතිරම්වල පුද්ගලයින්ගෙන්, විවිධ ආයතනයන්ගෙන් යනාදී වශයෙන් විවිධ මූලාශ්‍ර හරහා තොරතුරු ලබා ගැනීමටත්, ලබා ගන්නා තොරතුරුවල නිවැරදිභාවය තහවුරු කරගැනීමටත් ඔහු විවිධ උපක්‍රම භාවිත කරයි. 2016 වර්ෂයේ තොරතුරු දැනගැනීමේ පනත සම්මත වීමත්, 2017 පෙබරවාරි මස 03 වන දින පනත ක්‍රියාත්මක වීමත් සමඟ තොරතුරු ලබා ගැනීමට හා විවිධ උපක්‍රම මගින් ලබා ගන්නා තොරතුරු තහවුරු කර ගැනීමට තරිඳු භාවිත කළේ තොරතුරු දැන ගැනීමේ පනතයි.

ඔහුගේ පළමු තොරතුරු ඉල්ලීමේ අයදුම්පත්‍රය යොමු කරන්නේ 2017 පෙබරවාරි මස දෙවන

සතියේ දී ය. මේ වන විට ඔහු තොරතුරු ඉල්ලීමේ අයදුම්පත්‍ර 6000ක් පමණ යොමු කර ඇත. බොහෝ අවස්ථාවන්වලදී මෙම අයදුම්පත්‍ර හරහා තොරතුරු ලබා ගත්ත ද, ඇතැම් විටෙක මේ හරහා තොරතුරු ලැබී නොමැත. නමුත් අභියාචනා ඉදිරිපත් කර හෝ ඔහු නොලැබෙන තොරතුරු ලබා ගනී.




රතුපස්වල ජනතාව විසින් බීමට පිරිසිදු ජලය ඉල්ලා කළ උද්ඝෝෂණයට අදාළ සිදුවීම සම්බන්ධයෙන් ජනතාව විසින් දැනගත යුතු සත්‍ය හෙළි කිරීමට 2016 වර්ෂයේ දී ඔහු 'ජනඅරගලයක දිය සලකුණ' නමින් ග්‍රන්ථයක් ප්‍රකාශ කළේ ය. මේ කාලයේ තොරතුරු පනත ලංකාව තුළ ක්‍රියාත්මක නොවූ නිසා තොරතුරු පනත ක්‍රියාත්මක කර මාස කිහිපයක් තුළ එහි ඇතුළත් කරුණු තොරතුරු ලබාගැනීමේ අයදුම්පත්‍ර යොමුකරමින් තහවුරු කර ගැනීමට ඔහු කටයුතු කරයි.

**ඔහුගේ ප්‍රසිද්ධම හෙළිදරව් කිරීම් වන අරණායක නාය යෑමේ සිද්ධිය, මීතොටමුල්ල කුණු කන්ද නාය යාම, පරණ කදුළු ගෑස් භාවිතය හා ප්‍රමිතියෙන් තොර කදුළු ගෑස් භාවිතය, පාස්කු ප්‍රහාරය හා ශානි අබේසේකර අත්තනෝමතික ලෙස සිරගත කිරීම, පාරිසරික වාර්තාවන් සැලකිල්ලට නොගෙන සිදු කළ උමා ඔය ව්‍යාපෘතිය, වෛද්‍ය ශාෆිගේ සිදුවීම ආදිය පිළිබඳව අනාවරණය කිරීමට ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස භාවිත කරන්නේ තොරතුරු දැනගැනීමේ පනතයි.** ඇතැම්විට එකම සිදුවීමක් ගැඹුරින් විශ්ලේෂණය කිරීමේ දී එක් සිදුවීමක් වටා නැවත තොරතුරු ඉල්ලීමේ අයදුම්පත්‍ර සැලකිය යුතු ප්‍රමාණයක් ඔහු විසින් ඉදිරිපත් කරයි. ගෙවා ගත නොහැකි ලෙස ශ්‍රී ලංකාව ණය ලබාගෙන ඇත්තේ ව්‍යාපෘති සඳහා වන අතර එම බහුතරයක් ව්‍යාපෘති අසාර්ථක ය. මේ සියල්ල සම්බන්ධයෙන් තරිඳු අනාවරණය කරන්නේ තොරතුරු පනත හරහා ය. තොරතුරු පනත නොතිබුණා නම් මෙවැනි ආන්දෝලනාත්මක හෙළිදරව් සිදු කිරීමට තමාට නොහැකි වන බව ද තරිඳුගේ අදහසයි. එම නිසා මෙම පනත මාධ්‍යවේදියකුට භාවිත කළ හැකි හොඳම මෙවලමක් ලෙසයි, තරිඳු සලකන්නේ.



ඉන්දියාවේ 'ශ්‍යාම්ලාල් යාදව්' වැනි මාධ්‍යවේදීන් එක් ලිපියකට තොරතුරු ඉල්ලීම් 70, 80 පමණ සිදු කරමින් වාර්තාකරණයේ නියැලෙන නිසා ඒවා වඩාත් බලපෑම් සහගත බව තරිඳුගේ අදහසයි. තරිඳු ද එක් තොරතුරු ඉල්ලීමක් හරහා එක් ලිපියක් මගින් සිදුවීමක් පිළිබඳව වාර්තා නොකරයි. ඒ සමස්ත සිද්ධියක් ගවේෂණය කර කතාවක් ලිවීම හරහා වැඩි බලපෑමක් කළ හැකි බවට ඔහු විශ්වාස කරන නිසායි.

වසර 13ක පමණ ඔහුගේ මාධ්‍ය ජීවිතය තුළ ඔහු විසින් රචිත කිසිඳු ලිපියක් අභියෝගයට ලක් වී නැත. ඔහුගේ ලිපියක නිවැරදි කිරීම් හෝ සිදු කර නොමැති වීම ද විශේෂත්වයකි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශන ආරම්භ කිරීම සඳහා ඔහුගෙන් කටඋත්තර ලබා ගැනීමට පස් හය වතාවක් කැඳවා ඇත. ඒ ඔහු පනත හරහා ලබාගන්නා තොරතුරු විශ්ලේෂණය කරමින් ආන්දෝලනාත්මක හෙළිදරව් සිදු කළ නිසායි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විසින් පොලිස්පති ලෙස පත් කරනු ලැබුවේ 'ශ්‍රී ලංකා පොලිසියේ සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් අතුරෙන් වැඩිම චෝදනා ලත් පොලිස් නිලධාරියා මෙන්ම මූලික අයිතිවාසිකම් කඩ කළ පුද්ගලයකු ලෙස ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය විසින් තීන්දු කරනු ලැබූ නිලධාරියකු" යනුවෙන් තරිඳු විසින් ව්‍යවස්ථා විරෝධීව පොලිස්පති පත් කිරීමට අදාළව බලධාරයින් වෙත ලිපියක් ද යොමු කරයි.

තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය හරහා පොලිස්පතිගේ පත්වීම අහෝසි කරන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ද ගොනු කරයි. මේ සෑම කාර්යයකදීම ඔහු සත්‍ය

හා නිවැරදි තොරතුරු ලබා ගැනීමට මෙවලමක් ලෙස තොරතුරු පනත භාවිත කරයි.

ඔහු ලංකාදීප පුවත්පතේ සේවය කරන කාලයේදීම එනම් 2019 වර්ෂයේදී පමණ මිතුරකු හා එක්ව MediaLK.com නමින් වෙබ් අඩවියක් ආරම්භ කළේ ය. ඒ පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව ජනමාධ්‍ය ජාතිවාදී අන්තවාදී කාරණා වාර්තා කරමින් සත්‍ය තොරතුරු යට ගැසූ නිසාවෙනි. මුල් කාලීනව මෙම වෙබ් අඩවිය තුළ ලිපි පළ කරන්නේ ඔහුගේ මිතුරා පමණි. ඔහු මෙම වෙබ් අඩවිය තුළ ලිපි පළ කිරීම ආරම්භ කරන්නේ කලක් ගත වූ පසුව ය. ඒ **ඔහු විසින් වෛද්‍ය ශාෆි නිර්දෝෂී බවත්, දේශපාලනික කාරණා මත අසත්‍ය පුවත් ප්‍රචාරය වන බවටත් හෙළි කරමින් ලංකාදීපයේ සත්‍ය ගවේෂණ විශේෂාංගය සදහා සඳහා රචනා කළ ලිපි පළ නොවීමත් සමඟ ය. තොරතුරු පනත ආදිය භාවිත කරමින් තමන් විසින් ගවේෂණය කරන ලද සත්‍ය හා නිවැරදි තොරතුරු පුවත්පත තුළ පළ නොවීමත්, තවදුරටත් එවැනි ස්ථානයක ජනමාධ්‍යවේදියකුගේ භූමිකාව තමාට ඉටු කිරීමට නොහැකි නිසාවෙනුත් තරිඳු ලංකාදීප පුවත්පතෙන් ඉවත්වීමට තීරණය කරයි.** අනතුරුව තමා නිර්මාණය කළ වෙබ් අඩවියේ ඔහුගේ ලිපි පළ කිරීමට කටයුතු කරයි.



2016 - 2018 දක්වා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම් ධුරය හා 2019 වර්ෂයේ සිට එහි සභාපති ධුරයත් දරන තරිඳු අද වන විට සිය කණ්ඩායම සමඟින් මානව හිමිකම් කොමිසමට පැමිණිලි 100ක් පමණ ඉදිරිපත් කර ඇත. මාර්ගගත ආරක්ෂණ පනත, පුනරුත්ථාපන කොමසාරිස් කාර්යාංශ පනත ආදී මර්දනීය පනත් සම්බන්ධයෙන් නඩු ගොනුකරමින් මෙරට පුරවැසි අයිතිවාසිකම් වෙනුවෙන් ද ඔවුහු පෙනී සිටී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 53 වැනි නිත්‍ය සැසිවාරයේ 29 වැනි රැස්වීමේදී සංවිධාන තුනක් වෙනුවෙන් තරිඳු සිදු කළ ප්‍රකාශය ද වැදගත් වේ. ''ශ්‍රී ලංකාවේ පසුගිය කාලයේ පැවැති උද්ඝෝෂණ අතරතුරදී අත්අඩංගුවට ගෙන නඩු කටයුතුවලට මුහුණ දෙන පිරිසට එරෙහි චෝදනා ඉවත් කර ඔවුන් මුදා හරින ලෙසත්, ක්‍රියාකාරීන් අපරාධකරුවන් කරන මර්දනීය නීති ඉවත් කරන ලෙසත්, විරෝධතා අතරතුරදී පොලිසිය සහ ආරක්ෂක අංශය කළ උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් විමර්ශනය කර අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ නඩු කටයුතුවලට මුහුණ දී සිටින නීතිඥ හිජාස් හිස්බුල්ලා මහතාගේ චෝදනා ඉවත් කරන ලෙසත්, නතාෂා එදිරිසූරියට එරෙහි අයි. සී. සී. පී. ආර් චෝදනා ඉවත් කරන ලෙසත්" ඉල්ලා සිටියේ ය.

ඔහු පර්යේෂකයෙකු මෙන්ම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් දේශකයෙක් ලෙස ද කටයුතු කරයි. වර්තමානය වන විට තමා විසින් ලබා ගන්නා තොරතුරු ජනතාවට වඩාත් පැහැදිලිව සහ බලපෑම්කාරී ලෙස රැගෙන යාම සඳහා නව අත්දැකීමක් ලබා ගනිමින් ඔහු වාර්තා චිත්‍රපටකරණය ද සිදු කරයි. SSP Shani නම් වාර්තා චිත්‍රපටය සඳහා ශානි අබේසේකර පිළිබඳව පර්යේෂණ කරමින්, විවිධ මූලාශ්‍ර හා තොරතුරු පනත හරහා ද තොරතුරු ලබා ගනී. SL Vlog Daily Dose තුළ පවසන ආකාරයට සම්මුඛ සාකච්ඡා 60ට ආසන්නව සිදු කරමින් ඔහු තරිඳු උඩුවරගෙදර සමඟ එක්ව එහි පිටපත රචනා කර ඇත. වෛද්‍ය ශාෆි පිළිබඳ නිර්මාණය කළ වාර්තා චිත්‍රපටයට ද ඔහු සිය අත්දැකීම් හා තොරතුරු ලබා දෙයි.

**කිසිවිටෙකත් සම්මාන බලාපොරොත්තුවෙන් නොව පුරවැසියන් වෙනුවෙන් වගකීම් ඉටු කිරීම පමණක් සිය අභිලාෂය කරගන්නා තරිඳු කිසිදු සම්මානයක් සඳහා අයදුම් කර නැත. ඒ ඔහුගේ අරමුණ නිවැරදි හා සත්‍ය තොරතුරු වාර්තාකරණය පමණක් නිසාවෙනි. නමුත් ඔහුගේ මිතුරකු විසින් සම්මාන සඳහා අයදුම්පත් යොමු කිරීමෙන් 2018 වර්ෂයේදී ඔහු සම්මාන 02ක් ජයග්‍රහණය කරයි. ඒ ශ්‍රී ලංකා කර්තෘ සංසදය හා පුවත්පත් ආයතනය විසින් 2018 දී සංවිධානය කරන ලද 'ජනමාධ්‍යකරණයේ විශිෂ්ටයන් ඇගයීමේ සම්මාන උළෙලේ දී තොරතුරු දැන**

**ගැනීමේ පනත භාවිතයෙන් රචනා කරන ලද හොඳම ප්‍රවෘත්ති විශේෂාංගය සහ සැමට ප්‍රථමයෙන් ප්‍රවෘත්ති වාර්තා කිරීම සඳහා වන වසරේ "ස්කූප් ඔෆ් ද ඉයර්" සම්මානය දිනා ගැනීමයි.** මින් එක් සම්මානයක් ඔහු ජයග්‍රහණය කරන්නේ තොරතුරු ලබාගැනීමේ අයදුම්පත් යොමුකරමින් රචිත උතුරේ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් දෙදෙනෙකු පොලිසිය විසින් ඝාතනය කිරීම සම්බන්ධයෙන් රචනා කළ ලිපියටයි. 2019 වර්ෂයේදී ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් සංවිධානය කරන ලද පුරවැසි අභිමන් තොරතුරු සඳහා ප්‍රවේශවීම සම්බන්ධ ජාත්‍යන්තර උත්සවයේදී සමාජ යහපත සහ මහජන අරමුණ වෙනුවෙන් තොරතුරු දැන ගැනීමේ පනත භාවිත කිරීම පිළිබඳව විශේෂ ජූරි සම්මානය ද ඔහු දිනාගනී. 2022 වර්ෂයේ දී මහනුවර මානව හිමිකම් කාර්යාලය නම් සිවිල් සංවිධානය මගින් සංවිධානය කළ සම්මාන උලෙළේ දී මානව හිමිකම් ආරක්ෂකයකු ලෙස සිදු කරන කාර්යභාරය වෙනුවෙන් 'මානව හිමිකම් උත්තමාචාරය' නම් සම්මානයෙන් ද ඔහු පිදුම් ලබයි.

තියුණු බුද්ධියකින් යුතුව ලබා ගන්නා තොරතුරු විශ්ලේෂණය කිරීම හරහා කිසිවකු නොදකින පැතිකඩ හා වංචා දූෂණ අක්‍රමිකතා ආදිය පිළිබඳව සිදු කරන හෙළිදරව් නිසා ඔහුට ජීවිත තර්ජන ද එල්ල වී ඇත. තරිඳු ජයවර්ධන එක් ලිපියක සඳහන් කරන ආකාරයට '**මා ජනමාධ්‍යවේදියකු ලෙස දේශබන්දු තෙන්නකෝන් සම්බන්ධයෙන් මාධ්‍ය හමු දෙකක දී කැබිනට් මාධ්‍ය ප්‍රකාශකගෙන් සහ මහජන ආරක්ෂක අමාත්‍යවරයාගෙන් 2021 වසරේ දී අසනු ලැබූ ප්‍රශ්න දෙකකට උරණ වූ එවකට බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් විසින් සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රතිචාර දක්වමින් මට තර්ජනය කළේ ය. ආයුධ සන්නද්ධ හමුදා සාමාජිකයන් අතින් ඝාතනයට ලක්වී යැයි සැලකෙන එල්ටීටීඊ සංවිධානයේ නායක ප්‍රභාකරන්ට අත්වූ ඉරණම මාහට ද අත්වනු ඇති බවට දේශබන්දු තෙන්නකෝන් ප්‍රකාශ කළේ ය. එසේම අනිකුත් අපරාධකරුවන්ට අත් වූ ඉරණම මට ද අත්වනු ඇතැයි දේශබන්දු තෙන්නකෝන් ප්‍රකාශ කළ අතර ඔහු එම ප්‍රකාශය කරන ලද්දේ අපරාධකරුවන් යැයි සැකපිට අත්අඩංගුවට ගන්නා පිරිස් පොලිසිය විසින් මරා දමමින් සිටි පසුබිමක දී ය'** යනුවෙන් සඳහන් කරන්නේ ගවේෂණාත්මක මාධ්‍යවේදියකු වූ ඔහුට තිබූ ජීවිත තර්ජනය පිළිබඳවයි.

තර්ජන හමුවේ මාධ්‍යවේදීන් බොහෝ විට නිහඬ වුවත් කිසිඳු තර්ජනයකින්, මිල මුදල් හෝ වෙනත් උපක්‍රම හරහා නිහඬ කිරීමට නොහැකි මාධ්‍යවේදියකු ලෙස තරිඳු හඳුන්වාදිය හැකි ය. ඔහු කිසි විටෙක පක්ෂග්‍රාහී නොවී ජනතාව වෙනුවෙන් සත්‍ය පමණක් වාර්තා කරයි. සැම විටම කිසිවකු නොදකින පැතිකඩක් ඔහු සිය වාර්තාකරණයේ දී හෙළිදරව් කරයි. කිසිඳු බලපෑමකින් නිහඬ කළ නොහැකි වූ තරිඳු ජයවර්ධන 2022 නිර්පාක්ෂික අරගලයේ දී පුරවැසියන් වෙනුවෙන් පෙරට ආ මාධ්‍යවේදියෙකි. පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, එක් රැස්වීමේ අයිතිය කඩවන විට බලධාරීන්ව ප්‍රශ්න කරන, පුරවැසි අයිතිවාසිකම් සහ අසාධාරණය දුටු තැන පෙනී සිටින, සත්‍ය හා යුක්තිය වෙනුවෙන් පෙනී සිටින තොරතුරු පනත මාධ්‍යකරණයට භාවිත කරන මෙරට ප්‍රමුඛතම ගවේෂණාත්මක මාධ්‍යවේදීන් අතුරින් තරිඳු ජයවර්ධන ප්‍රමුඛයෙකි.

**සකස් කළේ හංසනී ජයවික්‍රම**

# පනත ගමට වැඩ

**ගතවන සෑම නිමේෂයකම පාහේ නවයතාවයකින් යුක්තව ලොව පුරා සංසරණය වන්නා වූ තොරතුරු ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රමුඛයා ජනමාධ්‍යයි. නමුත් ජනමාධ්‍යයෙහි මැදිහත් වීමකින් තොරව තොරතුරු වෙතට ප්‍රවේශ වීමට 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත පුරවැසියාට භාවිත කළ හැකි ය. ජනතාවගේ බදු මුදලින් නඩත්තු වන්නා වූ පොදු අධිකාරීන්ට අදාළ තොරතුරු ලබා ගැනීමට මහජනතාවට තිබෙන්නා වූ අයිතිය තොරතුරු පනත ඔස්සේ බලාත්මක වේ. තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳව මුල් කාලීනව දුර්මත පැවතියද වර්තමානය වන විට එය සාමාන්‍ය ජනතාවට වාසි සහගත ලෙස හසුරුවා ගැනීමට ඔවුන් සමත් වී ඇත. ශ්‍රී ලංකා තොරතුරු දැන ගැනීමේ කොමිසමෙහි වාර්තාවලට අනුව කොළඹ ප්‍රදේශයට වඩා මාතර, යාපනය, අනුරාධපුර වැනි ප්‍රදේශයන්හි ජනතාව තොරතුරු පනතෙහි උපරිම ප්‍රයෝජන ලබා ගනිති.**

තොරතුරු දැනගැනීමේ පනතේ භාවිතයක් වන්නේ පොදු ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ලබා ගැනීමයි. මාර්ග ඉදිකිරීම්, පාසල් ගොඩනැගිලි සහ ප්‍රජා මධ්‍යස්ථාන වැනි දේශීය යටිතල පහසුකම් ව්‍යාපෘතිවල අරමුදල් වෙන් කිරීම, ව්‍යාපෘති කාල නියමයන් සහ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයන් පිළිබඳව පුරවැසියන් බොහෝ විට විස්තර ඉල්ලුම් කොට ඇත. කරවෙඩ්ඩි ප්‍රාදේශීය සභාවෙහි මුරුගන් ජනාවාස කරා ගමන් කරන මාර්ගයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු ඇණහිට තිබූ කාලවකවානුවක එම ප්‍රදේශයෙහි තරුණ පිරිසක් අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල අනාගත සැලසුම් පිළිබඳව තොරතුරු ඉල්ලා කරවෙඩ්ඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තොරතුරු ඉල්ලීමක් සිදු කරන ලදී. එහි ප්‍රතිඵල වශයෙන් අදාළ තොරතුරු ලැබුණු අතර මාස දෙකක් යන්නට මත්තෙන් මාර්ග යෙහි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට අදාළ පාර්ශවයන් කටයුතු කරන ලදී. මේ ආකාරයට මහජන මුදල් ඵලදායි ලෙස පරිහරණය කිරීම සහ ව්‍යාපෘති නියමිත කාලවකවානු තුළ අවසන් කිරීම සහතික කරන්නේද යන වග දැනගැනීම උදෙසා මෙම පනත සාමාන්‍ය ජනයා විසින් ඵලදායි ලෙස භාවිත කර ඇත.



එසේම විවිධ රාජ්‍ය සේවාවන්හි තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ පනත පුද්ගලයන් විසින් නිරන්තරයෙන් භාවිත කරනු ලැබේ. උප්පැන්න සහතික, හැඳුනුම්පත්, ඉඩම් ඔප්පු, සහ අනෙකුත් අත්‍යවශ්‍ය ලියකියවිලි සඳහා අපේක්ෂිත අයදුම්පත් පිළිබඳ තොරතුරු ලබා ගැනීම ආදිය ද එයට ඇතුළත් ය. තම ඉඩම් ඔප්පු ලබා ගැනීම සඳහා මාස ගණනක් බලා සිටින පුරවැසියන් විසින් එහි ක්‍රියා පටිපාටිය පිළිබඳව යාවත්කාලීන දත්ත ලබා ගැනීමට පනත භාවිතා කරනු ලැබේ. එසේම සිවිල් සමාජ සංවිධාන සහ ක්‍රියාකාරීන් ඔවුන්ගේ උපදේශන කටයුතු සඳහා සහාය වන දත්ත ලබා ගැනීම සඳහා RTI පනත භාවිත කරයි. රජයේ වියදම්, සෞඛ්‍ය සංඛ්‍යාලේඛන, අධ්‍යාපනික ප්‍රතිඵල සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් අවශ්‍ය ගැටළු ඉස්මතු කළ හැකි වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු ඉල්ලීම් ද එකී භාවිතාවට ඇතුළත් ය. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ ව්‍යාපෘති සම්බන්ධීකාරක දිනේෂිකා ජයසේකර මෙනවිය අවධාරණය කළේ **"රාජ්‍ය ආයතනවල විනිවිදභාවය සහ වගවීම පවත්වා ගැනීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් තොරතුරු දැනගැනීමේ පනත මඟින් ඉටු කරන"** බවයි.

විවිධ රජයේ දෙපාර්තමේන්තු ක්‍රියාකාරීත්වය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටීමට පුරවැසියන් තොරතුරු දැන ගැනීමේ පනත භාවිත කරයි. මෙය රාජ්‍ය නිලධාරීන් ඔවුන්ගේ ක්‍රියාවන් සහ තීරණ සඳහා වගකිව යුතු බව සහතික කිරීමට උපකාරී වේ. මෙහිදී රාජ්‍ය ආයතන මගින් පුද්ගලයින්ට සිදුවන්නා වූ අසාධාරණයන් විසඳීමට පෞද්ගලිකව තොරතුරු දැනගැනීමේ පනත භාවිත කරයි. ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් හෝ සේවා සැපයීමේ ප්‍රමාද සඳහා පැහැදිලි කිරීම් සෙවීම මෙයට ඇතුළත් විය හැකි ය. නාවින්න ග්‍රාමයෙහි වාසය කරන නස්මියා මහත්මියගේ සොයුරියට අසාධාරණ ලෙස අහිමි කරන ලද ජලය ලබා ගැනීමේ අයිතිය පිළිබඳව කරුණු දැන ගැනීමට තොරතුරු දැන ගැනීමෙහි පනත යටතේ ජල සම්පාදන මණ්ඩලයෙන් ඉල්ලීමක් කරන ලදී. අදාළ අංශයන් විසින් දිගින් දිගටම ලබාදීමට ප්‍රතික්ෂේප කළ ජල පහසුකම මෙම තොරතුරු ඉල්ලීමත් සමඟ ඇයට ලබාග ැනීමට හැකියාව ලැබිණි. මේ ආකාරයට සිය පෞද්ගලික අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම උදෙසා තොරතුරු පනත භාවිතා කළ අවස්ථා බොහෝමයක් ඇත.

මීට අමතරව පුත්තලම රත්මල්යාය ප්‍රදේශයෙහි උග්‍රව පැවති ජල අර්බුදය හේතුවෙන් ප්‍රදේශවාසීහු දැඩි සේ පීඩාවට පත්විය. අපිරිසිදු ජලය පානය කිරීම හේතුවෙන් විවිධ රෝගාබාධයන්ට ගොදුරු වූ ඔවුහු ප්‍රජා කණ්ඩායමක් වශයෙන් සංවිධානය වී ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලයේ පුත්තලම කාර්යාලය වෙතින් තොරතුරු

ඉල්ලීමක් සිදුකළ අතර එම ස්ථානයෙහි තොරතුරු නිලධාරියකු නොමැති වීම නිසා කුරුණෑගල කාර්යාලය වෙත යාමට ඔවුනට සිදුවිය. එහි ප්‍රතිඵල වශයෙන් ප්‍රදේශයට පිරිසිදු පානීය ජල පහසුකම ලබා ගැනීමට අදාළ ප්‍රජා කණ්ඩායමට හැකියාව ලැබිණි. මේ ආකාරයට ප්‍රාදේශීය ප්‍රජා කණ්ඩායම් සහ පදිංචිකරුවන්ගේ සංගම් විසින් තම ප්‍රජාවන්ට බලපාන්නා වූ තොරතුරු ලබාගැනීම සඳහා තොරතුරු දැනගැනීමේ පනත භාවිත කොට ඇත. එමගින් ප්‍රාදේශීය පාලනය තුළ ප්‍රජා සහභාගිත්වය වර්ධනය වී ප්‍රජාවගේ අවශ්‍යතා නියෝජනය වීමට ඉඩකඩ සැලසේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි නීතිරීතිවලට යටත්ව ලබාගන්නා ඇතැම් තොරතුරු ඔස්සේ යම් යම් ආයතන, පුද්ගලයින් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට ජනතාවට හැකියාව ඇත. එලෙස ලබා ගන්නා ලද තොරතුරු පොදු සමාජය තුළ සංසරණය කොට ජනතාව බල ගන්වමින් දූෂිත ක්‍රියාකලාපයන් මර්දනය කිරීමට මාධ්‍යවේදීන් හැරුණු කොට පොදු ජනතාව උත්සහ දැරූ අවස්ථා පවතිනුයේ බෙහෙවින් අල්ප වශයෙනි.

මේ පනතින් පුරවැසියාට හිමිවන බලය දිනේෂිකා ජයසේකර මෙනවිය විග්‍රහ කළේ මෙලෙසිනි. "**කිසියම් පුද්ගලයෙකු විසින් තොරතුරු දැනගැනීමේ පනත භාවිත කරමින් ලබාගන්නා තොරතුරු ඔස්සේ සනාථවන්නා වූ පොදු අධිකාරීන් හි විනිවිදභාවය පිළිබඳව සමස්ත සමාජයම දැනුවත් කරන්නට හැකියාව ලැබෙනවා. පොදු අධිකාරීන් හි විනිවිදභාවය සනාථ කිරීමටත් ප්‍රජාව ඒකරාශී කර ගනිමින් ඔවුන්ව බලගැන්වීමටත් මෙම පනත භාවිත කරන්න පුළුවන්. මෙය ඔබේත් මගේත් අයිතියක්. එය භාවිත කරන්න.**"

සාමාන්‍යයෙන් රටක රාජ්‍ය නිලධාරින්ගේ සහ මහජන නියෝජිතයින්ගේ වත්කම් බැරකම් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට 1975 අංක 01 දරණ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත භාවිත කළ හැකි මුත් එමගින් ලබාගන්නා තොරතුරු ප්‍රසිද්ධ කිරීමකින් තොරව හුදෙක් පරිශීලනය සඳහා පමණක් යොදාගත යුතුවේ. නමුත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතෙහි වත්කම් බැරකම් පිළිබඳව ලබාගන්නා තොරතුරු ප්‍රසිද්ධ කිරීමට හැකියාවක් ඇත. ගාල්ල ප්‍රදේශයෙහි එක්තරා ප්‍රසිද්ධ පාසලක විදුහල්පතිතුමියකගෙ න් වත්කම් බැරකම් පිළිබඳව සහතික කළ පිටපතක් සහ අදාළ වර්ෂය තුළ සහ තවත් පාසල් කිහිපයකටම දරුවන් ඇතුළත් කරගැනීමේ විස්තර ඉල්ලුම් කොට ඇත. කෙසේ හෝ දෙවැනි නඩු වාරය තුළ අදාළ තොරතුරු ඉල්ලුම්කරුට ලබා ගැනීමට හැකියාව ලැබිණි. බොහෝ අවස්ථාවන්හිදී රාජ්‍ය නිලධාරීන්ගේ සහ මහජන නියෝජිතයන්ගේ අයතා උපයා ගැනීම් පිළිබඳව හෙළිදරව් කිරීමට සාමාන්‍ය ජනතාව මෙම පනත භාවිත කොට ඇත.

එපමණක් නොව ඉතිහාසඥයින්, පර්යේෂකයන් සහ සිසුන් රජයේ ලේඛනාගාරය සතු ඓතිහාසික වාර්තා සහ දත්ත වෙත ප්‍රවේශ වීමටද මෙම පනත භාවිතා කරයි. මෙමගින් ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා සහය විය හැකි අතර රටේ ඓතිහාසික උරුමය සුරැකීමට උපකාරී වේ. මීට අමතරව ඉඩම් පරිහරණ වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයක් සඳහා ඉඩම් හිමිකම සහ කෘෂිකාර්මික භාවිතයන් සම්බන්ධ යටත් විජිත යුගයේ ලියකියවිලි වෙත ප්‍රවේශ වීමටද තොරතුරු ඉල්ලීම් ගොනු කළ අවස්ථා බොහෝ ය.

තොරතුරු දැන ගැනීමේ පනතෙහි භාවිතය එහි භාවිතය රාජ්‍ය ව්‍යාපෘති සහ සේවාවන් අධීක්ෂණය කිරීමේ සිට ප්‍රතිපත්ති වෙනස්කම් වෙනුවෙන් පෙනී සිටීම දක්වා පුළුල් පරාසයක විහි දී ඇත. එමගින් පොදු අධිකාරින් පිළිබඳව තොරතුරු සෙවීමට සහ රාජ්‍ය බලධාරීන්ට වගවීමට පුරවැසියන් වෙත බලය ලබාදී තිබේ. එම බලය ප්‍රජාවෙහි එක් පිරිසක් මගින් ප්‍රශස්ත ලෙස භාවිතා කරන අතරම තවත් පිරිසක් මෙම පනතෙහි භාවිතය පිළිබඳව අඩු අවබෝධයකින් පසු වන බවක් දක්නට ලැබේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ මහතාට අනුව තොරතුරු දැනගැනීමේ පනතින් ප්‍රයෝජන ගන්න ඒ පිළිබඳ මනා දැනුමක් පුරවැසියාට අවශ්‍යයි. "**යම් යම් පුද්ගලයින්ට තිබෙන ප්‍රශ්නවලට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා මෙම පනත භාවිත කරන්න පුළුවන්. නමුත් සමහර අවස්ථාවන්හිදී අවශ්‍ය තොරතුරු සොයමින් සිටින අවස්ථා, වෙනත් ක්‍රමවලින් තොරතුරු ලබා ගැනීමට උත්සාහ කරන අවස්ථා අපි දකිනවා. ඒ වගේම තමයි ඇතැම් අවස්ථාවන්හිදී අනවශ්‍ය ලෙස අදාළ ආයතනවලින් තොරතුරු නොවන දෑ ලබා ගැනීමට තොරතුරු පනත භාවිත කිරීමට උත්සාහ දරන අවස්ථා තිබෙනවා. එයින් පැහැදිලි වන්නේ තොරතුරු පනතෙහි භාවිතය පිළිබඳව සාමාන්‍ය ජනතාව තුළ පවත්නා දැනුවත්භාවය අවම මට්ටමක පවතින බවයි.**"

අවසන් වශයෙන්, වඩාත් විනිවිද පෙනෙන, වගවීම සහ සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය පෝෂණය කරන්නා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම මහජනයා සතු වගකීමක් බව අවධාරණය කළ යුතු වේ.

**සටහන නවෝදා හඳරාගම**

# RTI ජනමාධ්‍යකරණය සඳහා Tool එකක් නොවෙයි



## මාධ්‍යවේදී කෝසල ගුණවර්ධන

**තොරතුරු දැනගැනීමේ පනත භාවිත කරමින් මාධ්‍යකරණයේ නියුතු මාධ්‍යවේදී කෝසල ගුණවර්ධන සමඟ සිය අත්දැකීම් දැනගැනීමට සන්නිවේදකයා සම්මුඛ සාකච්ඡාවක නිරත විය. කෝසල නිදහස් මාධ්‍යවේදියෙකි. පුරවැසි මාධ්‍යකරණයේ සහ ගවේෂණාත්මක මාධ්‍යකරණයේ නියුතු කෝසල ප්‍රතිභා මීඩියා නෙට්වර්ක්හි සේවය කරයි. එමෙන්ම ඔහු SDJF ආයතනයේ තොරතුරු දැනගැනීමේ අයිතිය සහ ප්‍රකාශන නිදහස වැඩසටහනේ ප්‍රදානලාභියෙකි.**

**ඔබේ වෘත්තියේ උන්නතියට තොරතුරු දැනගැනීමේ පනත කොහොම ද ඔබ භාවිත කරගන්නේ?**

බොහෝ වෙලාවට අපි වාර්තාකරණයක් කරද්දි මූලාශ්‍ර කිහිපයකින් තොරතුරු ගන්නවා. ඒ අවස්ථාවලදී අපට සමහර විටදී ලැබෙන්නේ ගොඩක් ප්‍රාථමික මූලාශ්‍රයන්. එනම් කිසියම් පුද්ගලයෙක් ඔහු හිතන දෙයක් අපිට කියනවා, නැතිනම් එයා උපකල්පනය කරනවා මෙන්න මේ කෙනාගෙ වරදක් නිසා මෙය සිදුවෙලා ඇති, නැතිනම් යම් කිසි ව්‍යාපෘතියක අකාර්යක්ෂමතාවයක් නිසා මෙන්න මේ දේ සිදුවෙලා ඇති වගේ කියලා අපට මේ ගැටළුවලට මුහුණ දෙන පුද්ගලයන් පවසනවා. එතකොට මෙම තොරතුරු සත්‍යාපනය කර ගන්න තමයි පළමුවෙන්ම අප මේ පනත භාවිත කරන්නේ. ඊළඟට දෙවැනි කාරණාව විදියට අපි Article එකක් ලියද්දි නැත්නම් Visual Production එකක් කරද්දී අපේ ආටිකල් එකට හරි විශුවල් ප්‍රඩක්ෂන් එකට හරි තියෙන විශ්වසනීයභාවය ගොඩනැගෙනවා ඒකට අපි විසින් ඇතුළත් කරන දත්ත සහ මූලාශ්‍රයන් වැඩි ගණනකින් තොරතුරු ඉදිරිපත් කිරීම තුළින්. ඒ නිසාවෙන් අපිට තොරතුරු දැන ගැනීමේ පනත විශාල වැදගත්කමක් තිබෙනවා. විශේෂයෙන්ම මම මාධ්‍ය ක්ෂේත්‍රයේ බොහොමයක් වැඩ කටයුතු සිදු කරන්නේ රජය ඔස්සේ සිදුකරන ව්‍යාපෘතිවල අවභාවිතා කිරීම් නැතිනම් මහජන බදු මුදල් වලට තියෙන වගකීම් විරහිතභාවය වගේ වැනි කාරණා සමගින්. ඒ අවස්ථාවලදී හොඳ තත්ත්ව ලබාග න්නට Tool එකක් විදියට RTI එක මම භාවිත කරනවා.

**තොරතුරු දැනගැනීමේ පනත භාවිත කරල ඔබ සකස් කළ ස්ටෝරි එක එහෙම නැත්තම් අනාවරණය කරගත්ත වැදගත්ම දේ මතක් කළොත්?**

හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිමුතුගම ගමට අවුරුදු දාසයක් වතුර තිබුණෙ නැහැ. අවුරුදු දාසයක් මේ ගමට වතුර බෙදල තිබ්බේ ප්‍රාදේශීය සභාවේ වතුර බවුසරයක් භාවිතා කරල සතියකට දවස් දෙකක් තමයි වතුර දීලා තිබුණේ. මෙහිදී මේ සම්බන්ධයෙන් මම තොරතුරු දැන ගැනීමේ පනත මගින් විමසීමේදී තමයි දැන ගන්න ලැබුණේ ජල සම්පාදන මණ්ඩලය ඒ ගමට වතුර ලබා දෙන එක සම්බන්ධව මිනුම් කටයුතු පවා තවම පටන් ගෙන නොමැති බව. ප්‍රාදේශීය සභාවෙන් මම අසා බැලුවා කොපමණ මුදලක් වියදම් වනවාද කියලා, එහිදී දැන ගන්න ලැබුණේ ඇත්තම කාරණාව විදියට ඒ **වතුර දෙන්න යන මුදල වගේ දහගුණයක් විතර මුදලක් වියදම් වෙලා තිබෙනවා දැනට අර ප්‍රාදේශීය සභාවෙන් සතිපතා ඇවිත් වතුර බෙදන කාර්යයට. ඉතින් අන්න ඒ වගේ ආයතන සහ මෙම රජයේ ව්‍යුහයන් අතර තිබෙන නොගැලපීම් සිදුවුණු හොඳම සිද්ධියක් ලෙස මට එම සිදුවීම දෙන්න පුළුවන්.** එම අනාවරණයෙන් පසුව බලධාරීන් ඒ ගම්මානය දෙසට යොමු වෙලා මේ වෙනකොට ඒ සඳහා විසඳුම් ලබාදෙන මට්ටමටම තීරණ ඇවිත් තිබෙනවා. ඒ වගේ සිදුවීමක් තමයි අමතක නොවන

සිදුවීමක් ලෙස තිබෙන්නේ.

**තොරතුරු දැනගැනීමේ පනත භාවිත කරල තොරතුරු ඉල්ලද්දි ඔබ අපහසුතාවයට පත් වූ අවස්ථා තියෙනව ද?**

ඔව්. සමහර අවස්ථාවලදී පනත පිළිබඳව නිලධාරීන්ගෙන් තිබෙන යම් යම් අනවබෝධය නිසා අපි අපහසුතාවයට පත්වුණු වේලාවන් තිබෙනවා. ඒ කියන්නේ දැන් පනත තුළ සඳහන් කරන්නේ රජයෙන් අපට තනි කොළයක් ලබා දෙන බව. මේ සම්බන්ධව මට සිදු වුණු එක් සිදුවීමක් තියෙනවා. මම එක තොරතුරු ඉල්ලලා ඒකදි මට තිබුනේ තනි කොළයයි. මට එයට රුපියල් පහක මුදලක් ගෙවන්න තිබුණේ. නමුත් ඒ නිළධාරීන්ට රුපියල් හතක රිසිට් එකක් ඒ සඳහා ලබා දෙන්න වෙනවා. මගෙන් රුපියල් පහක මුදල ලබාගෙන ඔවුන් ඒ රිසිට් එක කඩනවා. තනි කොළයක් නිසා එයාලා මට එය මුදල් නොගෙන ලබා දෙන්න පුළුවන්. නමුත් මම එතනදි එය ලබා ගන්නවා මොකද තොරතුරු නිළධාරියා අපට තොරතුරු ලබා දෙන්නේ ඉදිරිපත් වන නිසා. මම ඒ පිළිබඳ ප්‍රශ්න කරන්නේ නැතිව එය ලබා ගත්තා. එවැනි සමහර තැන්වලදී ඒ වගේ කාරණා තියෙනවා. මේ වගේ අවස්ථා මෙහි තිබෙන හරි හාස්‍යජනක සිදුවීම්. **සමහර අවස්ථාවන්වලදී නිළධාරින්ට ඇත්තටම තවම අවබෝධය මදි බවක් පෙනෙනවා. නමුත් එය මීට පෙර කාලවලට වඩා මේ වනවිට ගොඩක් දුරට දියුණුවෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම නිළධාරීන් ඒ අවශ්‍ය තොරතුරු ලබා දීමට හොඳින් කටයුතු කරනවා.** මට ඒ විදියට තොරතුරු ලබා දෙන්න එක අවස්ථාවක හරියටම දින 21ක කාලයක් ඉල්ලා සිටියා. හැබැයි නිළධාරියා බොහොම උනන්දුවෙන් මට අවශ්‍ය තොරතුරු ලබා දුන්නා. ඒ නිසා පෙරට වඩා තොරතුරු පනතට නිළධාරීන් අවනත වෙලා තිබෙනවා. ඉතිං මම හිතනවා නිළධාරීන්ගේ තිබෙන අවබෝධය තව වැඩි කරොත් හොඳයි මේ තොරතුරු පනත සම්බන්ධව කියලා.

**තොරතුරු දැනගැනීමේ පනත පාවිච්චි කරද්දි පැන නැගෙන පොදු ගැටලු මොනව ද?**

මට පුද්ගලික වශයෙන් ඇතිවෙලා තියෙනවා අමාත්‍යාංශවල සිදුවන වෙනස් වීම් සම්බන්ධව ගැටලු. ඒ සිදුවීම ඒ කාලයේ තිබ්ලා තිබෙන්නේ තරුණ කටයුතු ක්‍රීඩා හා සංස්කෘතික තාක්ෂණ මෙන්න මේ ආකාරයට විෂයන් ගොඩක් එකතු කරපු අමාත්‍යාංශයක්. එතකොට තොරතුරු සොයන විට ක්‍රීඩා අමාත්‍යාංශ වෙනමත් තරුණ කටයුතු අමාත්‍යාංශය වෙනමත් පවතිනවා. මම ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශයෙන් තොරතුරු විමසන විට එයාල පවසන්නේ කලින් අපි තිබුණේ මේ අමාත්‍යාංශය එකට නමුත් එයාලා ළඟ තොරතුරු නෑ කියලා. ඒවගේම තරුණ කටයුතු අමාත්‍යාංශයෙන් විමසීමේදීත් ඔවුන් ළඟ තොරතුරු නැති බව පවසනවා. ලංකාවේ විටින් විට වෙන අවිධිමත් අමාත්‍යාංශ බෙදීම් විද්‍යානුකූල පදනමකින් තොරවයි සිදුවන්නේ. ඒ නිසා මෙහි පොදු අධිකාරිය සොයා ගැනීමේදී බොහෝ අර්බුදයන් අපට ඇතිවෙලා තිබෙනවා. නිදසුනක් විදිහට තේ, පොල්, රබර් යනුවෙන් වෙන් කරලා තිබෙනවා ඒ සඳහා අමාත්‍යාංශ, අමාත්‍යවරුන් වෙන් කර තිබෙනවා. ඒ වගේම මැටි, කුඹල් මේ ආදියෙනුත් වෙන්කරලා තිබෙනවා. මේ විදියට සිදුවෙද්දී අපට ටිකක් අපහසු වෙනවා මේ කියන පොදු අධිකාරිය සොයා ගන්නට. මෙය විද්‍යාත්මක ක්‍රමයකට අමාත්‍යාංශ බෙදීම් සිදුකර යම්කිසි ක්‍රියා පටිපාටියකට මෙය පවත්වාගෙන යනවානම් අපට ලෙහෙසි වෙනවා බොහොම විනිවිදභාවයෙන් මේ තොරතුරු ලබාග ැනීම සිදුකරන්න. අමාත්‍යාංශවල තිබෙන විචල්‍යයන් සහ ඒ අමාත්‍යවරුන්ගේ වෙනස්කම්, ඔවුන්ගේ ආසාවන් නැතහොත් සිත සනසන්නට ලබා දෙන පත්වීම් නිසාවෙන් අපට විශාල ගැටලුවක් වෙලා තිබෙනවා තොරතුරු පනත හරහා යම් යම් තොරතුරු ලබා ගැනීමේ දී.

**ඔබේ කතාවක් ගොඩනගනකොට ඒකට තොරතුරු පනතින් ගන්න තොරතුරු වැදගත් කියල ඔබේ ආයතනය හිතනව ද? එවැනි කතා පාඨකයා කොහොමද භාරගන්නේ.**

අපි ලබා ගන්න අමු දත්තයම අපේ ආටිකල් එකට යොමු කරන්නෙ නැහැ. ඇයි මේ දෙය මිනිසුන්ට වැදගත් වෙන්නේ කියන එක ගැන හිතලා ආටිකල් එකෙත් එම තොරතුරු පළ කරනවා. උදාහරණයක් ගත්තොත් අපට සංඛ්‍යාලේඛනයක් ලැබෙනවා. එහිදී එක් ගම්මානයක මිනිසුන් 1000ක් ජීවත් වෙනවා. එයින් 500ක් පමණ ප්‍රමාණයක් මාර්ග ගැටලුවකට මුහුණ දෙනවා. මේ තොරතුරු අපි ලබා දෙන්නෙ තොරතුරක් ආකාරයට. ඒ වගේම මිනිසුන්ට මානුෂික හැඟීමක් ඇතිවෙන අයුරින් අපි ඒ තොරතුරු ලබා දෙනවා. ඒ වගේම ගොඩක් සංඛ්‍යාත්මකව දත්ත තොරතුරු තිබෙන වෙලාවට අපි භාවිත කරනවා chart වගේ දේවල්. ඉලක්කම් මතම සිටින ග්‍රාහක ප්‍රමාණය අඩුයි. වුවමනාවෙන් පත්තරයක් හෝ නැතිනම් අපි ලියන ලිපියක් මම මෙය කියවිය යුතුයි යන මට්ටමෙන් බලන අයෙක් තමයි බොහෝ දුරට මේ කියන සංඛ්‍යාත්මක දත්ත ගොඩක් කියවන්නේ. නමුත් දත්ත පාදක කර ගනිමින් තොරතුරක් සමාජයට ලබා දෙන විට මිනිසුන් බොහොමයක් ඒ තොරතුරු ලබාගන්න තියෙන අවස්ථාව වැඩියි. ඒ නිසා අපි ගොඩක් උත්සාහ කරන්නේ ඇයි, මෙය මිනිස්සුන්ට වැදගත් වෙන්නේ ඇයි මේ ගැන හිතන්න ඕනි කියන තැනට එම ලබාදෙන දත්ත අපි තොරතුරු බවට පත් කරන්න. ඒ ආකාරයෙන් තමයි අපි බොහෝ

දුරට කතාවකට හෝ ලිපියකට ඒ දේවල් අපි ඇතුළත් කරනු ලබන්නේ.

**තොරතුරු දැනගැනීමේ පනත මඟින් ඔබේ වෘත්තිය සඳහා ලැබෙන වටිනාකම පිළිබඳ ඔබේ අදහස කුමක්ද?**

තොරතුරු දැන ගැනීමේ පනත එන්න කලින් ගොඩක් වෙලාවට අපට මූලාශ්‍ර පරීක්ෂා කර ගැනීමට අප භාවිත කළේ වෙනත් ක්‍රම. මාධ්‍යවේදීන් විදියට අපිට ඇත්තටම තොරතුරු ලබාදෙන පුද්ගලයන් සිටිනවා. එවිට ඒ සැඟවුණු චරිත අපට ඒ අයව ආචාරධර්මයක් විදියට හඳුන්වා දෙන්න හැකියාවක් නැහැ. මට යම්කිසි තොරතුරක් දුන්නේ මේ කෙනා කියල අපි කියන්නේ නැහැ. කිසියම් අයෙක් හෝ පුද්ගලිකව හෝ වෙන්න පුළුවන් අපට තොරතුරු ලබාදෙන පුද්ගලයන්. ඒවගේ පුද්ගලයන් මගින් තමයි අපි මේ දත්ත ලබාගනු ලබන්නේ. **මෙම තොරතුරු පනත පැමිණීමට පෙර අවස්ථාවලදී රජය මිනිසුන්ගෙන් තොරතුරු වසන් කරන්න ගත්ත ප්‍රමාණය වැඩියි. මේ වන විට පනත බලාත්මක වී තිබීම හේතුවෙන් විශාල ප්‍රගතියක් තිබෙනවා තොරතුරු ඉල්ලා ගැනීමට හැකියාවක් තිබෙනවා. මම හිතනවා මෙය ජනමාධ්‍ය ක්ෂේත්‍රයට ආපු Energy drink එකක් වගේ කියලා.** ඒ වගේම අපට තොරතුරු පනත භාවිත කරලා අපේ ආටිකල් එක තව පියවරක් ඉදිරියට ගෙනියාමට හැකියාවක් ඇවිත් තිබෙනවා. එසේම මම ගොඩක් අවධානය යොමු කරන සහ මම ක්‍රියා කරන ක්ෂේත්‍රයක් පුරවැසි මාධ්‍යකරණය මේ විෂයේ දී ත් පුරවැසියා බලාත්මක කිරීමට සහ පුරවැසියාගේ මාධ්‍ය ක්ෂේත්‍රය බලාත්මක කිරීමට මෙම තොරතුරු පනත භාවිතා කරනු ලබනවා. **ජනමාධ්‍යවේදියෙක් සඳහාම තොරතුරු පනත තියෙනවා කියන තැන මම විශ්වාස කරන්නේ නැහැ. මාධ්‍යවේදීන් ද මෙය භාවිත කරනවා කියන එක තමයි හරි අදහස. මෙම පනත තිබෙන්නේ පොදු මහජනතාව වෙනුවෙන් ඔවුන්ගේ බදු මුදල් කුමන ආකාරයෙන්ද නිලධාරීන්, බලධාරීන් භාවිත කරන්නේ කියන දෙය දැනගැනීමට මෙම තොරතුරු පනත භාවිත කරනවා කියන දේ තමයි මගේ අදහස වන්නේ. මේ පනත භාවිත කරනවා ප්‍රජාව නියෝජනය කරන ප්‍රජාවගේ අදහස් නියෝජනය කරන පිරිසක් වන මාධ්‍යවේදීන්. එසේ නොමැතිව මාධ්‍යවේදීන් සඳහා සැකසුනු Tool එකක් නොවෙයි RTI.** මීට අමතරව ප්‍රජා මාධ්‍යකරණයේදී බොහෝ වේලාවට ඒ අයගේ තිබෙන තොරතුරු ලඟා කර ගැනීමේ හැකියාව සහ විශේෂයෙන්ම නීත්‍යානුකූලව නිවැරදි තොරතුරු ලඟා කර ගැනීමේ හැකියාව එය 100% නිවැරදි නොවන විය හැකි නමුත් මහජනතාවට නිවැරදි තොරතුරු ලබන්න පිටිවහලක් විදියට මෙම පනත මම පෞද්ගලිකව දකිනවා.

**සාකච්ඡා කළේ උත්තරා සෙව්වන්දි**

# ජනයා නොදන්නා ජන පනතක්



ජන අයිතීන් සුරැකීම පිණිස ජාතික වශයෙන්, ජාත්‍යන්තර වශයෙන් විවිධ වූ පනත් බිහි වී තිබුණ ද, මේ අතරින් බොහොමයක් ජනතාව භාවිතයට ගනුයේ ඉතා සුළු වශයෙනි. ඊට බලපාන ප්‍රධානතම හේතු සාධකය ලෙස පෙනෙන්නට ඇත්තේ එම පනත් පිළිබඳව මහජනතාව තුළ පවතින නොදැනුවත්භාවයයි.

ඉහත කියමනට දිය හැකි හොඳම සාක්ෂියක් ලෙස 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත පෙන්වාදිය හැකිය. මෙම පනත භාවිතයට ගනිමින් තොරතුරු හෙළි කර ගැනීමේ ඉතිහාසය දෙස බැලීමේදී පෙනී යන ප්‍රධාන කාරණයක් වන්නේ සාමාන්‍ය ජනතාව මෙම පනත

භාවිතා කර ඇත්තේ ඉතා අඩු වශයෙන් බවයි.

මෙලෙස 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත මහජන අයිතීන් සුරැකීම පිණිස සම්මත වූවක් වුවද, සාමාන්‍ය ජනයා අතර එය අඩු වශයෙන් භාවිත වීම යන ගැටළුව මුල් කර ගනිමින් ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ කොට්ඨාසයේ අහඹු ලෙස තෝරාගත් පුද්ගලයන් දසදෙනකු සමඟ වෙන් වෙන් වශයෙන් සම්මුඛ සාකච්ඡාවක නිරත විය. මෙම පුද්ගලයන් දසදෙනා අතරට වයස අවුරුදු 18-25 අතර බාණ්ඩයේ තිදෙනකු, අවුරුදු 26-35 අතර බාණ්ඩයේ සිව්දෙනකු සහ අවුරුදු 36-45 අතර බාණ්ඩයේ තිදෙනෙකු ඇතුළත් ය. එමෙන්ම මෙම 10 දෙනා විශ්වවිද්‍යාල ශිෂ්‍යයාවකගෙන්, ගෘහණියන් තිදෙනකුගෙන්, ගොවි මහතුන් දෙදෙනෙකුගෙන්, පෞද්ගලික ආයතනයක රැකියාවන්හි නිරත වන පුද්ගලයන් තිදෙනකුගෙන් සහ ගුරුවරියකගෙන් සමන්විතය.

මෙම පුද්ගලයන් දසදෙනා සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡාවන්හිදී පැහැදිලිවම අනාවරණය වූ ප්‍රධාන කාරණය වූයේ ඔවුන් දසදෙනාම තොරතුරු පනත පිළිබඳ නොදන්නා බවයි. ඔවුන්ගෙන් කිසිවකුට මෙම පනත පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බවයි. ඔවුන්ගෙන් සිව්දෙනකු මෙවැනි පනතක් තිබෙන බව අසා තිබුණ ද, එය කුමක්දැයි යන්න නොදන්නා බවත්, අනෙක් හයදෙනා එවැනි පනතක් පවතින බව හෝ නොදන්නා බවත් ඉන් අනාවරණය විය.

මහජනයාට තොරතුරු වෙත ප්‍රවේශ වීම පිණිස 2016 වසරේ ජුනි 24 වැනි දින පාර්ලිමේන්තුවේ සම්මත කෙරුණු පනතක් ලෙස 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත නම් පනතක් පවතින බවත්, එමඟින් සාමාන්‍ය ජනයාට යම් ක්‍රියාවලියක් හරහා තොරතුරු වෙත ප්‍රවේශ වීමට වැඩි බලයක් ලබා දී ඇති බවත් දැනුවත් කිරීමෙන් අනතුරුව, මා ඔවුන්ගෙන් විමසා සිටියේ මෙම පනත පිළිබඳ දැනුවත් කිරීම ඔවුන්ට වැදගත් වන්නෙහිද යන්නයි. එහිදී ඔවුන් දස දෙනාගේම අදහස වූයේ මෙම තොරතුරු පනත පිළිබඳව සාමාන්‍ය ජනයා තුළ පැහැදිලි දැනුවත් කිරීමක් සිදුවිය යුතු බවයි. මේ අතර සිටි විශ්වවිද්‍යාල සිසුවිය, ගුරුවරිය සහ පෞද්ගලික ආයතනයන්හි රැකියාවල නිරත වන තිදෙනා හට මෙම පනත ස්මාර්ට් ජංගම දුරකථනය හරහා බාගත කරගෙන (Download) කියවා අවබෝධයක් ලබා ගත හැකි බව ඔවුහු පැවසූහ. නමුත් ගෘහණියන් තිදෙනා සහ ගොවි මහතුන් දෙදෙනාගේ අදහස වූයේ ඔවුන්ව දැනුවත් කිරීමට ගම් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ නම් එය ඉතා වැදගත් වනු ඇති බවයි. මේ අතර සිටි අනන්‍යතාවය හෙළි කිරීමට අකමැති වූ ගොවි මහතකු ඒ බව මෙසේ සඳහන් කළේ ය.

**"මේ වගේ පනතක් තිබෙන බව ඇත්තටම අපිට දැනුවත්භාවයක් නෑ. මම හිතන්නේ ගොඩක් අපි වගේ සාමාන්‍ය ජනතාවට මේ ගැන අවබෝධයක් නෑ. මේ පනත ගැන පැහැදිලිව දැනුවත් කිරීමේ වැඩසටහන් ගම් මට්ටමින් ක්‍රියාත්මක කරනවා නම් පාරවල් ඉදි කරනවා කියලා කරන වංචාවන්, විවිධ ඉදිකිරීම් මුවාවෙන් කරන වංචාවන් ගොඩක් හෙළි වෙයි."**

තොරතුරු පනත පිළිබඳව මින් පෙර දැනුවත්ව සිටියේ නම් එහි වැදගත්කම කියා නිම කළ නොහැකි බව සම්මුඛ සාකච්ඡාවේදී එක් ගෘහණියක් කියා සිටියේ මේ ආකාරයෙනි. **"මේ පනත ගැන කලින් දැනගෙන හිටියා නම් මොනතරම් වැදගත් ද කියල මට දැන් හිතෙනවා. අපිට සමෘද්ධිය නෑ. ඒත් අපේ ගමේ අපිට වඩා ගොඩක් මුදල් තියෙන, පහසුකම් තියෙන, ස්ථිර රැකියා කරන අයටත් සමෘද්ධිය තියෙනවා. මේ වෙන අසාධාරණේ ගැන පසුතැවෙනවා ඇරෙන්න වෙන කරන්න දෙයක් තිබුණෙ නෑ. මේ විදිහෙ පනතක් තියන බවත්, මේ පනතින් එවැනි තොරතුරුවලට ප්‍රවේශ වෙන්න අයිතියක් දීලා තියන බවත් මීට කලින් දැනගෙන හිටියා නම් අපිට සමෘද්ධිය නැති වෙන්න හේතුව අහලා දැනගන්න තිබුණා. ඒ නිසා මන් හිතන්නෙ අපි වගේ අය ඕනි තරම් ඉන්නව ඇති ගම්වල. ඒ අයට මේ පනත ගැන දැනුවත් කරනවා නම් ඒක ගොඩාක් වැදගත් වෙනවා."**

සම්මුඛ සාකච්ඡාවේදී අදහස් දැක්වූ විශ්වවිද්‍යාල සිසුවිය ද පැවසුවේ තොරතුරු පනත පිළිබඳව මේ මොහොතේ හෝ දැනුවත් වීම සතුටට කාරණයක් බවයි. ඇය ඒ බව මෙලෙස පවසා සිටියාය. **"මම රජයෙන් මහපොළ ශිෂ්‍යාධාර හිමි කෙනෙක් වුණත් ගොඩක් අවස්ථාවල ඒක කලට වේලාවට ලැබුණෙ නෑ. සමහර වෙලාවට මාස දෙක තුනක් යනකන් මහපොළ ශිෂ්‍යාධාර ලැබෙන එක කල් ගියා. මේ විදියට ප්‍රමාද වෙන්න හේතුව දැනගන්න ඕනිකමක් තිබුණත්, ඒක කොහොමද කරන්නෙ කියලා අවබෝධයක් තිබුණෙ නෑ මේ වෙනකන්. නමුත් දැන් ඒකට හොඳ විසඳුමක් ලැබුණා. මම ඉදිරියේදී යාළුවෝ එක්ක එකතු වෙලා තොරතුරු පනත හරහා මහපොළ ශිෂ්‍යත්ව ආධාර මේ විදියට ප්‍රමාද වෙන්න හේතුව මොකක්ද කියල හොයලා බලනවා."**

ඒ අනුව මෙම සම්මුඛ සාකච්ඡාවන්හිදී අනාවරණය වූ පරිදි පොදු ජන අයිතියක් වන තොරතුරු පනත පිළිබඳව තව තවත් ජනතාව දැනුවත් කළ යුතු බවයි. එමඟින් පොදු ජන අයිතීන් සුරැකිය යුතු බවයි.

**සටහන තක්ෂිලා උදයංගනී**



# තොරතුරු ගවේෂකයන්ට අත්පොතක්


තොරතුරු අයිතිය ඉන්දියාව තුළ තහවුරු වන්නේ 2005 වසරේ දී ය. එනම් ශ්‍රී ලංකාවේ තොරතුරු අයිතිය නීතිගත කිරීමට වසර දොළහකට පෙර දී ය. ලංකාවේ තොරතුරු අයිතිය පිළිබඳ සාකච්ඡාවට ඉන්දියානු තොරතුරු අයිතිය යම් උත්තේජනයක් සැපයූ බවත් ඒ ඔස්සේ ලබා ගත් ජයග්‍රහණ යම් බලපෑමක් කළ බවත් නොරහසකි.

ඉන්දියාවේ තොරතුරු අයිතිය පනත ජනමාධ්‍යකරුවන් යටතේ තවදුරටත් වර්ධනය වුණි. තොරතුරු අයිතිය සක්‍රිය ලෙස භාවිත කළ ජනමාධ්‍යකරුවන් අතර ශාම්ලාල් යාදව් ට හිමි වන්නේ සුවිශේෂී තැනකි. ඉන්දියාවේ තොරතුරු අයිතියට වසර දහයක් ගතවූ පසු ඔහු විසින් රචිත Journalism through RTI (Information Investigation Impact) කෘතිය තොරතුරු අයිතියේ යා හැකි දුර පිළිබඳ බොහෝ දේ අපට කියාපානු ලබයි.

රාජ්‍ය නිලධාරීන්ගේ විදේශ ගමන් හා ඒ සඳහා වන වියහියදම් ගැන අපේ රටේ විවිධ අවස්ථාවල සාකච්ඡාවට ලක් වේ. එමෙන්ම මැති ඇමතිවරු ඇතුළු දේශපාලනඥයින් විදේශ සංචාර සඳහා පිරිවර සහිතව ගමන් කිරීම විදේශ සංචාර සඳහා වෙනම ගුවන් යානා වෙන් කිරීම විදේශ සංචාරවල වියදම් කිරීම සඳහා ලබාගනු ලබන අත්තිකාර මුදල් මෙන්ම විදේශ සංචාරවල හෝටල් බිල් පියවීම සඳහා වන වියදම් යනාදී බොහෝ කාරණා

මෙරට සමාජය තුළ ගත වූ පහළොස් වසරක කාලය තුළ සංවාදයට බඳුන් විය.

එහෙත් ඒ පිළිබඳ ව තොරතුරු හුදු කටකතා කැලෑ පත්තර යනාදී සීමාවේ පවතින ප්‍රකාශ විනා නිශ්චිත ලිපි ලේඛන සහිතවත් නිල වශයෙන් තහවුරු කරන ලද දත්ත සහිත තොරතුරු ලෙස වාර්තා වුණු අවස්ථා ඇත්තේ ස්වල්ප වශයෙනි. ශාම්ලාල් යාදව් මෙම කෘතිය තුළින් ඉන්දියාවේ තොරතුරු අයිතිය භාවිත කරමින් සිදු කරනු ලැබූ එවැනි සිදුවීම් පිළිබඳ වාර්තා ගණනාවක් ඉදිරිපත් කරන්නේ එක් අතකට තොරතුරු අයිතියේ ස්වරූපය පැහැදිලි කරන ආකාරයෙන් මෙන්ම ඉතා විධිමත් මූලාශ්‍ර ගණනාවක් පරිශීලනය කිරීමෙනි. ඇමතිවරුන්ගේ විදේශ ගමන් පිළිබඳ තොරතුරු ලබාගෙන ඔහු සැපයූ පුවත්පත් ලිපිය පදනම් කරගෙන දෙවැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කරනු ලබන්නේ ලෝකය වටා 256 වතාවක් ගමන් කරනු ලැබූ ඇමතිවරුන්ගේ විදේශ සංචාර ලෙසිනි. ඒ තොරතුරු අයිතිය යටතේ එකතු කරන ලද ඇමතිවරු 71 දෙනෙකුගේ ගුවන් ගමන් විස්තර දත්ත විශ්ලේෂණය කිරීමෙනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එවකට අගමැති මන්මෝහන් සිං සියලුම ඇමතිවරුන්ට ලිපියක් යවමින් ඉන්දියානු ආර්ථිකය හා එහි මූල්‍යමය තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබුණි. (පිටුව 41).




එය තොරතුරු අයිතිය මගින් සිදු කළ හැකි බලපෑම පිළිබඳ ව එක් උදාහරණයක් පමණකි.

රාජ්‍ය නිලධාරීන්ගේ විදේශ ගමන් පිළිබඳ ව ලබාගත් තොරතුරු වාර්තාකරණය කෘතියේ තුන්වන පරිච්ඡේදයෙන් ඔහු පෙන්වා දෙන්නේ 74 වතාවක් හඳට ගමන් කර පැමිණීමට ඇති දුර ඒ සඳහා ගෙවා ඇති බව දක්වමිනි.

වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම, මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය තුළ පවුලේ සාමාජිකයන් සිටීම වැනි ලංකාව තුළ සාකච්ඡාවට ලක්වන කාරණාවලට සමීප බොහෝ දේ මෙම කෘතිය තුළින් ඉදිරිපත් වේ.

තොරතුරු අයිතිය භාවිත කරමින් තමන් සිදුකළ වාර්තාකරණයේ විස්තර ඉදිරිපත් කිරීමට අමතරව මෙම කෘතිය තුළින් ඔහු ජනමාධ්‍යවේදීන් සඳහා අධ්‍යාපනික ප්‍රවේශයක් ද ලබා දෙයි.

ශාම්ලාල් යාදව්ගේ වසර දහයක තොරතුරු අයිතිය භාවිතය හා වාර්තාකරණය ඇසුරින් නවක ජනමාධ්‍යවේදීන් සඳහා කරුණු 20කින් යුත් ප්‍රායෝගික ප්‍රවේශයක් එකොළොස්වන පරිච්ඡේදයෙන් හඳුන්වා දී තිබේ. තොරතුරු අයිතිය යටතේ යම් තොරතුරක් ලබාගැනීම සඳහා කිසියම් අදහසක් ගොඩනගා ගන්නේ කෙසේ ද? ඒ සඳහා කටයුතු ආරම්භ කරන ආකාරය, ආකෘතිය, තොරතුරු ඉල්ලා සිටින ආකාරය යනාදී වශයෙන් එක් එක් පියවර ඉතා සරලව විස්තර කෙරේ.

එම අර්ථයෙන් සලකා බැලුවහොත් ශාම්ලාල් යාදව් ගේ කෘතිය ලාංකේය ජනමාධ්‍යකරුවන්ට තොරතුරු අයිතිය භාවිත කිරීම සඳහා උත්තේජනයක් ලබා ගත හැකි අත්පොතකි.

**සටහන විජයානන්ද රූපසිංහ**

# "තොරතුරු පනතේ ප්‍රධාන බාධාව භාෂාවයි"

## -මාධ්‍යවේදී ආතිෆ්-

**තොරතුරු දැන ගැනීමේ පනත භාවිත කරමින් මාධ්‍යකරණයේ නියුතු මාධ්‍යවේදි මොහොමඩ් ආතිෆ් සමඟ සම්මුඛ සාකච්ඡාවක නිරත වීමු. මොහොමඩ් ආතිෆ් දමිළ භාෂාවෙන් නිකුත් වන තුනින්දෙලු මාසික සඟරාවේ නියෝජ්‍ය කතෘ වරයෙකි. එමෙන්ම ඔහු SDJF ආයතනයේ තොරතුරු දැනගැනීමේ අයිතිය සහ ප්‍රකාශන නිදහස වැඩසටහනේ ප්‍රදාන ලාභියෙකි.**

**ඔබේ වෘත්තියේ උන්නතියට තොරතුරු දැන ගැනීමේ පනත ඔබ කොහොමද භාවිත කරන්නේ?**

බොහෝ ලිපිවලට ඒ වගේම Digital Stories කරන වෙලාවේ RTI හරහා තොරතුරු ලබාගන්න මං සලකා බලනවා. තොරතුරු පනත හරහා මං හොයාගත්ත වැදගත් සිද්ධියක් තමයි 2019 දී චීන සමාගමක් මල්වාන ප්‍රදේශයේ තෝට්ටම් පාර සංවර්ධන කටයුතු කිරීම ගැන. 2019 වසරේ ආරම්භ කළ ඒ ව්‍යාපෘතිය අද වෙනතෙක්ම බාගෙට නවත්තලා තියෙනවා. ඒ ප්‍රදේශයේ අපද්‍රව්‍ය සහ අප ජලය එකතු වෙනවා ඒ හින්දා. අනිත් දේ තමයි වහින වෙලාවට එතැන වතුර රැඳෙන නිසා එම ප්‍රදේශයට බොහෝ බලපෑම්වලට මුහුණ දීමට සිදුවෙලා තියෙනවා. ඩෙංගු හැදෙන්න ඉඩකඩ වැඩියි. ඒවගේම ඒ වැඩ ආරක්ෂිත නොවන ආකාරයට තමා අතහැර දාලා තියෙන්නේ. ඒ නිසා වැස්ස කාලෙට පොඩි ළමයි වැටෙනවා, වාහන අනතුරු වගේම බොහෝ අනතුරු සිදුවෙනවා එතැන. එතකොට ඇත්තටම මේක කවුද කරේ, ඇයි මේ වගේ අතරමග නතර කරලා තියෙන්නේ, කියලා අපි ඒ ප්‍රදේශයට ගිහින් ප්‍රදේශයේ ජනතාවගෙන් අහද්දි ඔවුන් මේ පිළිබඳව කිසිදු දෙයක් දන්නේ නෑ. එහෙනම් ඒ පාර කොහෙට ද අයිති ද කියලා හොයනකොට, ඒ ප්‍රාදේශීය සභාවට අයිති පාරක්. ඒ නිසා ප්‍රාදේශීය සභාවට ගිහින් නිළදාරීන්ගෙන් ඇහුවා "2019 වසරේ පාර්ලිමේන්තු මැතිවරණයට කලින් මේ වගේ සංවර්ධනයක් ආරම්භ කරලා තියෙන්නේ ඇයි? ඒකට කොයි විදිහට ද එකග වෙලා තියෙන්නේ? ඒ ප්‍රදේශය කිසිම ප්‍රශ්නයක් නැතිව වතුර ගලන් යන්න තිබුණා නමුත් ඔයාලා මේ වගේ දෙයක් පටන් අරන් මැදින් නවත්තලා තියෙන නිසා ඒ ප්‍රදේශය ලොකු ගැටළුවකට මුහුණලා දීලා තියෙනවා. ඒ නිසා මේක කවු ද කරේ? මොකට ද කරේ? මේකේ අරමුණ මොකද් ද? මේ සඳහා මොනවා හරි සැළැස්මක් තියෙන්න ඕනිනේ. ඉතින් මේකේ සැළැස්ම මොකද් ද? ඒ සදහා කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තියෙනව ද? මේ දේවල් අපි ඇහුවා. ඒක අහපු වෙලාවේ අපට දුන්න ප්‍රතිචාරය තමා ප්‍රාදේශීය සභාවෙන් මේ වගේ සංවර්ධන ව්‍යාපෘතියක් කරේ නෑ. ඉතින් එතන තමා අපේ ප්‍රධාන හැරවුම් ලක්ෂය. ඒ නිසා ඒ අදාළ ප්‍රදේශයේ මේ වගේ ගොඩක් ප්‍රශ්න ඇතිවෙන්න හේතුව වුණු සංවර්ධන ව්‍යාපෘතිය කවුද කරේ, ප්‍රාදේශීය සභාවෙන් කළේ නැත්නම් කවුරුහරි දේශපාලනඥයෙක් එයාගේ ලාභ ප්‍රයෝජන වෙනුවෙන් මේ වගේ දෙයක් පටන්ගෙන ඇති. එතකොට අපේ ප්‍රධාන අනුමානය වුණේ යම් ගනුදෙනුවක් කොතන හරි වෙලා තියෙනව කියා. මේ විදිහට මේ කතාව ඊළග අදියරයට ගෙනියන්න RTI එකට පුළුවන් වුණා.

**තොරතුරු දැන ගැනීමේ පනත භාවිත කළ විට ඔබේ කතාවට කොහොම හැඩයක් ද ලැබෙන්නේ?**

ඒක මෙහෙම පැහැදිලි කරන්නම්. එක්තරා ප්‍රදේශයක රෙදිකඩවල් ප්‍රමාණය කොවිඩ්වලින් පස්සේ වැඩි වෙනවා. එතකොට මට ඕන වුණා මේ කතාව ගැන මුළු ලංකාවටම කියන්න. මුලින්ම මට ඕන වුණා, කොවිඩ්වලට පස්සේ කඩවල් කොච්චර විවෘත කරල ද? මේ ප්‍රදේශයේ තියෙන රෙදිකඩවල් අයිති වෙළඳ සංගමයෙන් ගිහින් ඇහුවම සංගමයෙන් නියම කරන ලද යම් මුදලක් තියෙනවා සංගමයට බැඳෙන්න. ඉතින් සමහර කඩවල් තියෙන්න පුළුවන් ලියාපදිංචි වෙලා නැති. ඒ නිසා පිරිපුන් කතාවක් දෙන්න නම් RTI පාවිච්චි කරන්න වෙනවා. එතකොට මම RTI එකක් ඉල්ලුම් කරලා ප්‍රාදේශීය ලේකම්තුමාගෙ



න් ඇහුවා, "මේ ප්‍රදේශයේ මේ ළඟකදි ඉදන් කඩවල් ප්‍රමාණය වැඩි වෙමින් යනවා ඉතින් ඒ නිසා මේ ප්‍රදේශයේ මේ වගේ කඩවල් කීයක් කොවිඩ්වලින් පස්සේ ආරම්භ කරලා තියනවද? ඒ කඩවල් ලියාපදිංචි වෙලා තියනවද? කියලා. ඉතින් ඒ වෙලාවේ අපිට අවුරුදු 5කට කලින් තිබුණු වාර්තා ලබා දුන්නා. story එකට ඒකත් එකතු කළාට පස්සේ ඒ story එක හොඳ මට්ටමේ පිරිපුන් කතාවක් විදිහට තිබුණා.

**තොරතුරු දැන ගැනීමේ පනත භාවිත කරලා තොරතුරු ඉල්ලද්දි අපහසුතාවයට පත් වූ අවස්ථා තියෙනවද?**

ඔව් ඇත්තටම අපහසුතාවයට පත් වූ අවස්ථා තියෙනවා. නැගෙනහිර පළාත, උතුරු පළාත වගේ පළාත්වල දෙමළෙන් ඉල්ලුම් කළොත් එතන ගැටලුවක් නැහැ. ඒ වගේම බස්නාහිර පළාත ගත්තොත් සිංහලම තමා පාවිච්චි කරන්න ඕනි. එතකොට භාෂාව කියන බාධකය RTI එකේදී මට ලොකු අභියෝගයක් වුණා. ලිඛිත සිංහල භාෂාව හසුරන විදිහ මට අභියෝගයක්. ඒ නිසා මම මගේ යාළුවෝ මාර්ග යෙන් ඒවා ලිඛිත භාෂාවට පරිවර්තනය කරගෙන තමයි ඉල්ලුම් කරන්නේ. එතකොට ඊළග කාරණය කීවොත් සමහර තැන්වල තොරතුරු ලබාදෙන නිළධාරීන් තවමත් නැහැ. එතකොට හැම දෙපාර්තුමේන්තුවකටම එක තොරතුරු ලබාදෙන නිළධාරියෙක් ඉන්නවා කියලා කියනවා ඒත් සමහර තැන්වල තොරතුරු ලබා දෙන නිළධාරීන් කවුරුත්ම නෑ. එතකොට ඒ වගේ තැන්වලින් අපට ලැබෙන ප්‍රතිචාරය වන්නේ **'තවම එහෙම තොරතුරු නිළධාරියෙක් නෑ' කියලා, එහෙම නැත්නම් 'එයාලා නිවාඩු ඉන්නේ' එහෙම නැත්නම් 'ඒ තනතුර පුරප්පාඩුවේ තියෙනවා'** ඒ වගේ ප්‍රතිචාර තමා ලැබෙන්නේ. මට මෙහෙම පිළිතුරු බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබුණා.

**තොරතුරු ලබා නොදෙන තවත් අවස්ථා තියෙනව ද?**

අපි RTI එකක් ඉල්ලුම් කරද්දි නියම විදිහට ඒක අදාළ දෙපාර්තමේන්තුවට තමයි දාන්න ඕනි. සමහර පාරවල් තියෙනවා ප්‍රාදේශීය සභාවට අයිති, සමහරක් පාරවල් පළාත් සභාවට අයිති, ඒ වගේම මාර්ග සංවර්ධන අධිකාරියට එකට අයිති පාරවලුත් තියෙන්න පුළුවන්. මේ වගේ එක එක දෙපාර්තමේන්තු තියෙනවා. එතකොට අපි අර RTI එකක් ඉල්ලුම් කරන අවස්ථාවේදී පළාත් සභාවට අයිති පාරක් සම්බන්ධව හරි ඒ වගේ වෙන සම්බන්ධ මොකක් හරි RTI එකක් ප්‍රාදේශීය සභාවට දානවානම් ඒක අපේ වෙලාව අපතේ යෑමක් වෙනවා. ඊටපස්සේ එයාලා කියයි "නෑ ඒක ඔයා එහෙන් තමයි කරගන්න ඕනි කියලා කියලා" එතකොට අපි ආපහු ඉල්ලුම් කරන්න ඕනි.

**තොරතුරු දැන ගැනීමේ පනත පාවිච්චි කරද්දි පැන නගින පොදු ගැටළු මොනවාද? ඒ ගැන කියන්න පුළුවන්ද?**

ගැටලුව කියන්නේ මං මුලින්ම RTI එක දානකොට දෙපාරක්ම එහෙටම ගිහිල්ලා තමා භාර දුන්නේ. එතකොට තව පාරක් දේශපාලනඥයන්ගේ වැඩසටහනක් තියලා ඒ ගැන RTI **එකක් දානකොට ඒ දේශපාලනඥයාට පණිවිඩය ගිහින් තියනවා "මෙහෙම** RTI **එකක් ඇවිල්ලා තියනවා කියලා" ඊටපස්සේ එයාලගේ පැත්තෙන් පොඩි තර්ජනයක් වගේ ආවා. "ඉතින් මල්ලි ඔයාගේ පාඩුවේ ඔයාගේ වැඩ ටික කරගන්න, මේක අපි බලාගන්නම්" කියලා.**

**ඔබේ කතාවක් ගොඩනගනකොට ඒකට තොරතුරු පනතින් ගන්න තොරතුරු එකතු කළහම එවැනි කතා ගැන පාඨකයා කොහොමද භාර ගන්නේ?**

ඇත්තටම කීවොත් අපි නිකන් story එකක් කරන වේලාවට ඇතැම්විට අපි ඒකෙන් මේක මේ විදිහට තමා තියෙන්නේ අර විදිහට තමා තියෙන්නේ කියලා අපි සංස්කරණය කරද්දි බොරු පණිවිඩයක් පාඨකයාට ලබාදෙන්න පුළුවන්. ඒකම අපි RTI දාලා RTI එක මාර්ගයෙන් කතාවක් ගොඩනගනවානම් එතකොට රාජ්‍ය අංශයෙන් අපිට දෙනු ලබන ප්‍රතිචාරය, අපිට ලබාදෙන තොරතුරු මත පදනම්ව තමයි අපි ඒක කරන්නේ. ඉතින් ඒ වෙලාවේ අපිට වැරදෙන දේවල් එහෙම නැත්නම් බොරු තොරතුරු තමයි අපි සමාජයට ලබා දෙන්නේ කියන කතාවක් පැන නැගුනත් ඒක අපිට පැටවෙන්නෙ නෑ. ඒකට හේතුව  අපි සම්පූර්ණයෙන්ම කතාව ගොඩනගලා තියෙන්නේ RTI ප්‍රතිචාරය පදනම්ව තමයි. ඒ වගේම සාමාන්‍යයෙන් **'එයා එහෙම තමයි කියන්නේ කියාලා' කියනවට වඩා රාජ්‍ය අංශයෙන් කියනවා මේ දෙපාර්තුමේන්තුවෙන් මෙහෙම තමා කරලා තියෙන්නේ, කියද්දි මහජනතාව ඒක භාරගන්නවා වැඩි. ඒ කියන්නේ රාජ්‍ය අංශයෙන් ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු හෝ ඒ සම්බන්ධ අංශයෙන් ලබා දුන්න ප්‍රතිචාරය මත ගොඩනගන කතාවට මහජනතාව දෙන අවධානය වැඩියි.**

**සාකච්ඡා කළේ ෆාතිමා නෆීහා**

# පනතට පණ දෙමු

ඔබේ පළාතේ උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගයෙන් වැඩි ලකුණු ලබා ගත්තේ කවු ද? එහි පුරප්පාඩු සඳහා බඳවාගත් ගුරුවරුන් කවු ද? බඳවා ගත් අය සියල්ලෝම වැඩි ලකුණු ගෙන ඉහළින්ම සුදුසුකම් සපුරපු අයවලුන් ද? බඳවා ගත් අයගේ ලකුණු මොනව ද? යන කරුණු පිළිබඳව පළාත් සභාවෙන් නිල ලේඛනයක පිටපතක් ලබාගැනීමට එම විභාග යට පෙනී සිටි අපේක්ෂකයෙකු වූ ඔබට හැකියාවක් තිබේ ද? බොහෝ විට නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වූ අපේක්ෂකයින්ගේ චෝදනා එයට සාක්ෂි ය. තොරතුරු දැන ගැනීමේ පනත භාවිතයේ ඇති ගැටලුව එයයි.

එසේ ම, ගමේ ප්‍රජා ශාලාව, කොන්ක්‍රීට් පාර, පාසල් ගොඩනැගිල්ල, ඩිස්පැන්සරියේ ගොඩනැගිල්ල, ඇලේ වේල්ල යනාදිය ඉදි කිරීම සඳහා කොපමණ මුදලක් වැය වීද? මේ සඳහා ටෙන්ඩර් දැමූවන් කවුරුන්ද? අඩුවෙන්ම ටෙන්ඩරේ දැමුවේ කවුද? ඔහුටම ටෙන්ඩරය හිමි වීද? මෙම ඉදිකිරීම්වල ප්‍රමිතිය කුමක්ද? යනාදී පොදු කරුණු පිළිබඳව අදාළ රජයේ ආයතනවලින් නීත්‍යානුකූල ලිපි ලේඛනවල පිටපත් ලබා ගැනීමට රටට බදුගෙවන පුරවැසියෙකු ලෙස ඔබට හැකියාවක් තිබේද? එයම ප්‍රශ්නයකි. එය තොරතුරු දැන ගැනීමේ පනත පනතක්ව පමණක් තිබීමට නිදසුන් ය.

ඉහත ප්‍රශ්න දෙකට ම  පිළිතුර වන්නේ නැත යන්නයි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පුරවැසියන්ගේ භාෂණයේ නිදහස, කැමති මතයක් දැරීමේ නිදහස හා ලිවීමේ නිදහස තහවුරු කර ඇති මුත්, රාජ්‍ය ආයතනවලින් තොරතුරු ලබා ගැනීම සඳහා වූ අයිතිය තහවුරු කර දී ඇති බව ලිඛිත ව පමණක් පවතින්නක් ද? එය ප්‍රායෝගික භාවිතයේ පවතින ගැටළුවකි. එයට සුදුසු යාන්ත්‍රණයක් අවශ්‍යය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වගන්තිය මගින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කර ඇති අතර, තොරතුරු දැනග ැනීමේ අයිතිය බලාත්මක කිරීම මගින් රාජ්‍ය අධිකාරීන් තුළ විනිවිදභාවය සහ වගවීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාවක් නිර්මාණය වී ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ මහජනතාවට වැඩි අයිතියක් හිමි වන්නේ රටේ පොදු ජීවිතයට සහභාගී විය හැකි සහ සක්‍රීයව සහභාගී විය හැකි සමාජයක් ප්‍රවර්ධනය කිරීමටයි. ඒ අනුව, අයිතියේ පරමාර්ථය වන්නේ විනිවිදභාවය සහ වගවීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම, එමගින් ශ්‍රී ලංකාවේ ජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගී විය හැකි සහ රටේ පොදු ජීවිතයට සක්‍රීයව සහභාගී විය හැකි සමාජයක් ප්‍රවර්ධනය කිරීමටයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදය යටතේ මූලික අයිතිවාසිකම්වල ද අනිවාර්ය අංගයක් බවට තොරතුරු අයිතිය පත් වේ. මෙමගින් පුරවැසියන්ට මූලික අයිතිවාසිකමක් ලෙස තොරතුරු සෙවීමටත්, රාජ්‍ය බලධාරීන් පනතේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන විට නීතිමය පිළියම් සෙවීමටත් හැකියාව ලැබී ඇත.

තොරතුරු දැනගැනීමේ පනතින් තොරතුරු ලබාගැනීමේ දී ලිඛිත අයදුම්පත්‍රයක් හෝ වාචික ඉල්ලීමක් තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු අතර ඔබේ ඉල්ලීමට අදාළ තොරතුරු සැපයිය හැකිද යන්න පිළිබඳව දින 14ක් තුළ දැන්විය යුතු ය. දින 14ක් තුළ තොරතුරු ලබාදීම අපහසු වේ නම් තොරතුරු නිලධාරියා විසින් එකී කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය හේතු සඳහන් කරමින් දින 21 කට නොවැඩි අතිරේක කාලයක් තුළ ලබා දිය යුතු ය.

තත්ත්වය මෙසේ වුව ද, මෙම තොරතුරු දැන ගැනීමේ අයිතිය ක්‍රියාත්මක වීමේ දී බොහෝ ගැටලුකාරී අවස්ථාවන්ට පුරවැසියන් නිරන්තරයෙන් මුහුණ දෙනු ලබයි. එනම්, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 24(3) සහ 25(1) වගන්තිවල විධිවිධාන තිබියදීත්, බොහෝ රාජ්‍ය බලධාරීන් නීතිය නිවැරදිව අනුගමනය නොකරයි. සම්මුතියකින් තොරව තොරතුරු සැපයීම තොරතුරු වෙත ප්‍රවේශ වීමේ මූලික අයිතිවාසිකමේ හරය යටපත් කරන අතර රාජ්‍ය බලධාරීන් මේ ආකාරයෙන් ක්‍රියා කරන්නේ නම්, එවැනි ක්‍රියා අනිවාර්යයෙන්ම පනතේ 39 වැනි වගන්තිය යටතේ වරදක් වේ.

නිදසුන් ලෙස, යමෙකුට, යම් කිසි සිදුවීමක් පිළිබඳව ගවේෂණය කර යමක් ලියන්නට හෝ ප්‍රකාශ කරන්නට අවශ්‍ය වන්නේ නම්, ඔහු හෝ ඇය ඒ පිළිබඳව තොරතුරු දැන සිටිය යුතු ය. පසුගිය (2011) ජුනි මාසයේ දී ලංකා ඛනිජ තෙල් සංස්ථාව කර තිබූ බාල පෙට්‍රල් ගනුදෙනුව පිළිබඳව පුවත්පතකට ලිපියක් ලිවීමට තොරතුරු ලබා ගැනීමට සිදු වේ නම්, මෙම ගනුදෙනුව නිසා සිදු වූ අලාභය කොපමණ ද? එයට ඍජුවම වගකිවයුතු

පුද්ගලයින් කවුද? වැනි කරුණු පිළිබඳව සත්‍ය තොරතුරු සහිත නිල පරීක්ෂණ වාර්තාවක් ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ලබාගත යුතුම ය.

නමුත්, මෙවැනි තොරතුරු ලබා ගැනීමක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව මඟින් කළ හැකි ද? එය නිවැරදි ව ලබා ගත හැකි ද? එයම ගැටලුවකි. එවැනි නිල තොරතුරු පිටපතක් පුරවැසියෙකු වෙත ලබා දීමට ඛනිජ තෙල් සංස්ථාව මෙන්ම, අනෙකුත් රාජ්‍ය ආයතන ද නෛතිකව බැඳී නැත. එම නිසා මෙම දූෂිත ගනුදෙනුව පිළිබඳව නිල තොරතුරක් ලබා ගැනීමට ද ස්වාධීන පුරවැසියෙකුට හැකියාවක් ලැබෙන්නේ නැත. හෙජින් ගිවිසුම, බාල සිමෙන්ති ගනුදෙනුව, බාල ඖෂධ ගනුදෙනුව ආදී කිසිවක් පිළිබඳ නිවැරදි තොරතුරු නිල වශයෙන් ලබා ගැනීමට කිසිම සිවිල් පුරවැසියෙකුට හිමිකමක් නැති ද? තොරතුරු දැන ගැනීමේ පනත ව්‍යවස්ථාමය ලියවිල්ලක් පමණක් ද? ඒ නිසාම දැන හැඳුනුම්කම් මත නිල නොවන මාර්ග ඇසුරින් තොරතුරු ලබා ගැනීමට පුරවැසියන් පෙළඹීම අසාධාරණ නැත.

මේ කරුණු නිසා ම තොරතුරු ලබා ගැනීමේදී ඒ සඳහා නෛතිකභාවයක් නොමැතිකමින් එම අයිතීන් උල්ලංඝනය වන බව ද එය පනත භාවිතයේ පවතින ඉතා අර්බුදකාරී අවස්ථාවක් බවද කිව යුතුම ය. ශ්‍රී ලංකාව නිවැරදි මාවතක ගමන් කරවීමට පනත් නිවැරදිව නෛතිකභාවයකින් හා තොරතුරු විනිවිදභාවයකින් පැවතිය යුතු බව ඉහත ඓතිහාසික තොරතුරු සාක්ෂි දරනු ඇත.

පුරවැසියාගේ භාෂා අයිතිය සහතික කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සිදු කෙරේ. තොරතුරු ඉල්ලා සිටීමේදී පුරවැසියන්ට තමන් කැමති භාෂාවක් සඳහන් කළ හැකි වුවද, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ නීතිමය රාමුවේ නිශ්චිත විධිවිධාන නොමැත. අයිතිය සමාන ලෙස භාවිත කිරීමේදී ඉල්ලුම්කරුගේ අභිමතය පරිදි තොරතුරු සැපයීමට රාජ්‍ය බලධාරීන් බැඳී සිටී. එහෙත් සුළුතර ප්‍රජාවන් නියෝජනය කරන පුරවැසියන් කැමති භාෂාවෙන් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හිඩැස් පවතින බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිදුකළ අධ්‍යයනයක් අනාවරණය කරයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිදුකළ ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ගැටලුව සහ අභියෝග යන වාර්තාවට අනුව පනතේ ගැටලුකාරී තත්ත්වයන් විවිධ ක්ෂේත්‍රවල පවතී. එනම්,

**අසාධාරණ හේතු මත තොරතුරු වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීමට අදාළ විධි විධාන අනිසි ලෙස භාවිත කිරීම.**

**පොදු අධිකාරීන්හි තොරතුරු නිලධාරීන් සහ නම් කරන ලද නිලධාරීන් පත්කිරීමේ ප්‍රමාදය**

**පුරවැසියන්ගෙන් තොරතුරු ඉල්ලීම් ලැබීමේ ලිඛිත පිළිගැනීමේ වගකීමට අනුකූලව කටයුතු සිදු නොවීම**

**පුරවැසියන් විසින් කරන ලද තොරතුරු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී පොදු අධිකාරීන්හි අනවශ්‍ය ප්‍රමාදයන්**

**ප්‍රගාමී හෙළිදරව් කිරීමේ මුලධර්මයට අනුකූල වීමට සාධනීය උත්සාහයන් ගැනීමේ ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළක් නොමැතිකම.**

**තොරතුරු දැනගැනීමේ පනත යටතේ පනවා ඇති රාජකාරී ඉටුකිරීමේ කාර්යය සඳහා වෙනත් නිලධාරීන්ගෙන් සහය ලබා ගැනීමේදී තොරතුරු නිලධාරීන් සහ නම් කරන ලද නිලධාරීන් අභියෝගවලට මුහුණ දීම**

**තොරතුරු දැනගැනීමට පනතේ විෂය පථය තුළ අදාළ සෑම අවස්ථාවකදීම විද්‍යුත් ලේඛනාකෘතීන් මගින් මාර්ගගතව තොරතුරු වෙත ප්‍රවේශ වීමට පහසුකම් සැලසීමට කැප නොවීම**

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිසමට අභියාචනා කිරීමේ පුරවැසියන්ට ඇති අයිතිය යටපත් නොකර තොරතුරු නිලධාරීන්ට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසමේ උපදෙස් ලබා ගැනීමට හැකි වන විධිවිධාන නොසලකා පනතේ 5 වන වගන්තිය භාවිතයෙන් මුල් අවස්ථාවේ දී ම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධි විධානවලට පටහැනිව ක්‍රියා කරන පොදු අධිකාරීන්හි නිලධාරීන්ට එරෙහිව නඩු පැවරීමේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු ක්‍රියාමාර්ග නොගැනීම.

මෙම ගැටලුකාරී අවස්ථා සමස්තයක් ලෙස ගත් කළ, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ නීතිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියාට පොදු ජන ජීවිතයට වඩාත් පූර්ණ ලෙස සහභාගී විය හැකි සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා එක්ව කටයුතු කිරීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ, රාජ්‍ය බලධාරීන්ගේ සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ ආකල්පමය වෙනසක් අවිවාදිතවම අත්‍යවශ්‍ය බව පැහැදිලි ය.

**සටහන සඳුනි දිසානායක**

UniK RADIO

වෙබ් අවකාශයේ සරසවි හඬ

ජනසන්නිවේදන අධ්‍යයන අංශය - කැලණිය විශ්වවිද්‍යාලය

SDJF සහ The Commonwealth Foundation ප්‍රදානයකින් මුද්‍රණය කරන ලදී

SDJF Commonwealth Foundation